කාර්යසාධන වාර්තාව - 2023

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව



පටුන

			පිටුව
01	අන්තර්ගතය		3-3
02	පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	5-9
03	පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	10 - 60
04	පරිච්ඡේදය 03 -	වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	61 – 83
05	පරිච්ඡේදය 04 -	කාර්යසාධන දර්ශක	84 – 85
06	පරිච්ඡේදය 05 -	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	86 – 88
07	පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	89 - 96
08	පරිච්ඡේදය 07 -	අනුකූලතා වාර්තාව	97-105
09	සංවර්ධන වැඩසටහන්වලට අදාල ඡායාරූප		I - I

පරිච්ඡේදය - 01- ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

2017 අංක 2 දරණ දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනත මඟින් ස්ථාපිත මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධානම කාර්යය වන්නේ සමෘද්ධිලාභී දිළිඳු පවුල් ලක්ෂ 17 ට සමෘද්ධි සුබසාධනය සලසමින් ඔවුන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීමය. සමාජ ආරක්ෂණ අරමුදල මඟින් එම පවුල්වල දෛනික වැදගත් අවස්ථාවල දී ආරක්ෂණය සැලසීමට අදාලව දීමනා ලබා දේ. ශ්‍රී ලංකාවේ දිළිඳුකම මුලින් උපුටා දැමීම සඳහා එම පවුල් සවිබලගැන්වීමට ඔවුන්ගේ ජීවනෝපාය ප්‍රවර්ධනයට අදාළ වැඩසටහන් සහ ප්‍රජාමූල බැංකු 1093 ක් මඟින් දිවයින පුරා විසිරී සිටින එම දිළිඳු පවුල්වල සහ අඩු ආදායම්ලාභී පවුල්වලට අවශ්‍ය කරන විවිධ ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්පාදනය කිරීම සිදු කෙරේ. මීට අමතරව, දිළිඳු පවුල් සහ අඩු ආදායම්ලාභී ජනතාව, ඒකරාශී කරමින් ප්‍රජාමූල සංවිධාන ජාලයක් ස්ථාපිත කොට පවත්වාගෙන යාමත්, ඔවුන්ගේ සමාජ හා ආර්ථික සංවර්ධනය උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් අරමුණු කෙරේ.

1.2. දැක්ම හා මෙහෙවර

දැක්ම

"වසර 2030 වන විට දුගී බවෙන් තොර, සවිබලගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම"

මෙහෙවර

අවාසි සහගත තත්ත්වයට පත් ජනතාව ආර්ථික, සමාජීය, භෞතික, මානසික, නෛතික, හා පාරිසරික වශයෙන් බලගැන්වීම සඳහා කාර්යක්ෂම හා සඵලදායී වැඩසටහන් ප්‍රජා සහභාගීත්වය ලබා ගනිමින් තිරසාර ක්‍රමවේද ඔස්සේ ක්‍රියාවට නැංවීම.

පරමාර්ථ

2017 අංක 2 දරණ දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 4 වන වගන්තිය අනුව දෙපාර්තමේන්තුවේ පරමාර්ථ පහත දක්වා ඇත.

(අ) දිළිඳුබව තුරන් කිරීම සහ සමාජ සාධාරණත්වය සහතික කරනු ලබන සමාජයක් බිහි කිරීම සඳහා අවශ්‍ය විය හැකි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම.

(ආ) පුද්ගල, පවුල, කණ්ඩායම් සහ ප්‍රජාව කෙන්ද්‍ර කරගත් ජීවනෝපාය ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම.

(ඇ) එක් එක් පුද්ගලයා සහ පවුල වෙනුවෙන් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම.

(ඈ) ජාතික සංවර්ධනය වේගවත් කිරීම සඳහා ජනතාව ඒකරාශී කිරීම සහ සවිබලගැන්වීම.

(ඉ) ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය ඉහළ නැංවීමේ කාර්ය සඳහා ක්ෂද්‍ර මුල්‍ය පහසුකම් සැපයීම.

(ඊ) ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා අවශ්‍ය විය හැකි භෞතික සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

(උ) ජනතාවගේ ආර්ථික සහ සමාජ සංවර්ධනයට අවශ්‍ය විය හැකි අධ්‍යන සහ පර්යේෂණ කටයුතු සිදු කිරීම.

(ඌ) ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීම සඳහා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සහ සමාජ ආරක්ෂණයක් අවශ්‍ය පුද්ගලයන් සඳහා සමාජ ආරක්ෂණ ජාලයක් නිර්මාණය කිරීම.

1.3. **ක්‍රියාත්මක ප්‍රධාන ධාරාවන්**

2017 අංක 2 දරණ දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ විධි විධාන අනුව, දෙපාර්තමේන්තුව පහත පරිදි ප්‍රධාන ධාරා තුනක් යටතේ ක්‍රියාත්මක වේ.

1. නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව
2. ප්‍රජාමූල බැංකු පද්ධති ධාරාව
3. ප්‍රජාමූල සංවිධාන ධාරාව

1.3.1 **නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව**

සමෘද්ධි පනතේ 7 (1), (2), (3) වගන්ති අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස්වලට අනුව ජාතික සභාවක් පත් කර ඇත. එහි සාමාජිකයින් 11 දෙනෙකු සිටී. දෙපාර්තමේන්තුවේ සංයුතිය පහත පරිදි වන නිල තන්ත්‍රයකින් සමන්විත වේ. අධ්‍යක්ෂ ජනරාල්ගේ නිල නායකත්වය යටතේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් තිදෙනෙකු සහ ප්‍රධාන අංශ 17 ක ප්‍රධානීන් මඟින් ක්‍රියාත්මක වේ. එනම්, පාලන, ආයතන, විමර්ශන, නීති, තොරතුරු තාක්ෂණ, විශ්‍රාම වැටුප්, මානව සම්පත් සංවර්ධන, සමාජ ආරක්ෂණ හා සුබසාධන, ජීවනෝපාය සංවර්ධන, සමාජ සංවර්ධන හා පරිසර, ප්‍රජාමූල සංවිධාන, ව්‍යවසාය සංවර්ධන, සැලසුම් හා මෙහෙයුම්, ක්ෂුද්‍රමූල්‍ය (බැංකු / මහා සංගම්), මාධ්‍ය, මුදල් හා විගණන, යන අංශ භාර ප්‍රධානීන් ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් 25 ආවරණය වන ලෙසින් තම අංශවල රාජකාරී කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි. දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මෙහෙයවීම යටතේ ඇති දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් සහ එම කාර්ය මණ්ඩලය මඟින් දිස්ත්‍රික්, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ, කලාප හා ග්‍රාමනිලධාරී වසම් මට්ටමින් සමෘද්ධි පනතේ අරමුණු ලඟාකර ගැනීමට අදාල රාජකාරී ක්‍රියාත්මක කරනු ලබයි. ප්‍රජාමූල බැංකු කටයුතු, ප්‍රජාමූල සංවිධාන ගොඩනැඟීම සහ සංවර්ධන ව්‍යාපෘති ගම් මට්ටමින් ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මූලිකත්වයෙන් ප්‍රාදේශීය නිලධාරීන් වන සමෘද්ධි කලමණාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුළු අනෙකුත් සියලු කාර්යාල හා ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඉටු කරනු ලබයි. සමස්ත සේවක සංඛ්‍යාව 23,964 වේ.

1.3.2. ප්‍රජාමූල බැංකු පද්ධති ධාරාව

සමෘද්ධි පනතේ 25(1),(2),(3),(4) ,29 (1),(2),(3),(4) හා 34 වගන්ති අනුව ප්‍රජාමූල බැංකු, බැංකු සමිති හා මහා සංගමයේ කටයුතු අධීක්ෂණය හා නියාමනය සඳහා සාමාජිකයින් 8 දෙනෙකුගෙන් යුත් කළමනාකරණ මණ්ඩලයක් පත් කර ඇත. මෙම අංශයේ කාර්යභාරය වන්නේ, ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අධ්‍යක්ෂ හා මහා සංගමය යටතේ පාලනය වන කාර්ය මණ්ඩලය මඟින් සහ දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 335 ට අදාල ප්‍රජාමූල බැංකු, ප්‍රජාමූල බැංකු සමිති, කලාප සහ ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ක්‍රියාත්මක වන බැංකු 1,093 කට අදාල සියලු කාර්ය මණ්ඩලය මඟින් මෙම බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීමයි. එම පද්ධතිය මඟින් සමෘද්ධි සහනාධාර බෙදා දීම, ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීමේ තැන්පතු පවත්වාගෙන යාම, ප්‍රතිලාභීන්ගේ තැන්පතු පවත්වාගෙන යාම හා ඉතුරුම් වර්ධනය, ප්‍රතිලාභීන්ට හා අඩු ආදායම්ලාභීන්ට ක්ෂුද්‍රමූල්‍ය ණය නිකුත් කිරීම, ඉතිරි අරමුදල් වැඩි ප්‍රතිලාභ ලැබෙන මූලාශ්‍රවල ආයෝජනය කිරීම සහ වෙනත් සමාජ සුබසාධන කටයුතු ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

2023 වර්ෂය තුල දී ජීවනෝපාය සංවර්ධන කටයුතු නිවාස, පාරිභෝගික, ආපදා සහ වෙනත් ණය පහසුකම් අත්‍යවශ්‍ය ග්‍රාමීය ජනතාවට ණය යෝජනා ක්‍රම 18 ක් යටතේ ලබා දී තිබූ මුළු ණය වටිනාකම රු.මි.37,358.19 කි. ඊට අදාල ව නිකුත් කර ඇති ණය සංඛ්‍යාව 336,781කි. 1999 සිට 2023 වර්ෂය අවසන් වන විට ප්‍රතිලාභීන්ට ලබා දී තිබූ මුළු ණයවල සමුච්චිත වටිනාකම රු.මි. 463,599.06 කි. ඊට අදාල සමුච්චිත ණය සංඛ්‍යාව 12,309,875 කි. සමස්ත බැංකු ගිණුම් සංඛ්‍යාව 14,385,199 කි. මුළු තැන්පතු මුදල රු.බි. 166.21 කි. තව ද මෙම අංශයේ සියළු කටයුතු නව තොරතුරු තාක්ෂණ ක්‍රමවේද ඔස්සේ ක්‍රියාත්මක කර ජනතාවට වඩා කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ඉන් ලබා දීමට පියවර ගෙන ඇත.


1.3.3. ප්‍රජාමූල සංවිධාන ධාරාව

2017 අංක 2 දරණ දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනතට අනුව සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන හා සමෘද්ධි දිස්ත්‍රික් සංවිධාන පිහිටුවීම සඳහා අවශ්‍ය නියෝග හා ව්‍යවස්ථා (සමෘද්ධි පනතේ 42 වන වගන්තිය) ඇතුලත් 2017 මාර්තු 07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2009/08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්විය. ඒ අනුව සමෘද්ධි පනතේ මූලික අරමුණ වන දිළිඳුකම තුරන් කිරීම හා සමාජ සාධාරණත්වය ඉටු කිරීම උදෙසා සෑම ග්‍රාම නිළධාරී වසමක්ම ආවරණය වන පරිදි ස්වේච්ඡාවෙන් සංවිධානය වන සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 09 වන වගන්තිය) ප්‍රාදේශීය සංවිධාන පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 15 වන වගන්තිය) සමෘද්ධි දිස්ත්‍රික් කමිටු පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 19 වන වගන්තිය) සිදුකර ඇත. ප්‍රජා මූල සංවිධානවල කටයුතු පිළිබඳ අධීක්ෂණය, මෙහෙයවීම හා උපදෙස් ලබා දීමට සාමාජිකයින් 18 කින් සැදුම්ලත් සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල නමින් කමිටුවක් ජාතික මට්ටමින් රැස් වේ. ප්‍රජාමූල සංවිධාන පිහිටුවා, ශක්තිමත් කොට, ප්‍රජාව බලගන්වා, ඔවුන් ආර්ථික, සාමාජයීය හා අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය කරමින්, ප්‍රජා මූල බැංකු හා ජීවනෝපාය වැඩසටහන් සඳහා යොමු කිරීමේ අරමුණින්, 2023 වර්ෂය වන විට ප්‍රජා මූල සංවිධාන 29,687 ක් ද ප්‍රාදේශීය සංවිධාන 335ක් සහ දිස්ත්‍රික් කමිටු 25ක් ක්‍රියාත්මකව පවතී.

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා එහි කාර්ය භාරයන්

අ.අ	අංශය	කාර්යභාරය
1	පාලන අංශය	මානව සම්පත් බඳවා ගැනීම මානව සම්පත් හා භෞතික සම්පත් කළමනාකරණය
2	ආයතන අංශය	උසස් කිරීම හා පෞද්ගලික ලිපි ගොණු නඩත්තු කිරීම
3	ගිණුම් අංශය	රාජ්‍ය මුදල් හා ගිණුම් කටයුතු පාලනය කිරීම හා දෙපාර්තමේන්තුව සතු වත්කම් පවරා ගැනීම හා කලමණාකරණය කිරීම
4	ජීවනෝපාය සංවර්ධන අංශය	ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය, ග්‍රාමීය හා ප්‍රජා මට්ටමින් ක්‍රියාත්මක කිරීම.
5	ක්ෂුද්‍ර මූල්‍ය අංශය / මහා සංගම් අංශය	ක්ෂුද්‍ර මූල්‍ය ණය නිකුත් කිරීම, ඉතුරුම් හා ආයෝජන ප්‍රවර්ධනය, බැංකු හා බැංකු සමිති අධීක්ෂණය
6	ව්‍යවසාය සංවර්ධන අංශය	ව්‍යවසායකත්ව සංවර්ධනය හා අලෙවි සංවර්ධනය සඳහා ප්‍රාදේශීය, ග්‍රාමීය හා ප්‍රජා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
7	සමාජ සංවර්ධන හා පරිසර අංශය	පරිසර හා සමාජ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
8	සැලසුම් හා මෙහෙයුම් අංශය	වැඩසටහන් හා ව්‍යාපෘති සැලසුම්කරණය, ප්‍රගති සමාලෝචනය, පසුවිපරම් කිරීම, අධීක්ෂණය, වාර්තා කිරීම හා පර්යේෂණ කටයුතු සඳහා සහාය වීම.
9	ප්‍රජාමූල සංවිධාන අංශය	ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන හා දිස්ත්‍රික් කමිටු පිහිටුවීම හා පවත්වගෙන යාම හා ප්‍රාජා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
10	විගණන අංශය	සමaද්ධි පනත හා පොදු උපදෙස් අනුව විගණන කටයුතු පවත්වාගෙන යාම හා කළමනාකරණය.
11	තොරතුරු තාක්ෂණ අංශය	තොරතුරු තාක්ෂණ කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය.
12	මාධ්‍ය අංශය	මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාතමක කිරීම.
13	මානව සම්පත් සංවර්ධන අංශය	නිලධාරීන්ගේ (මානව සම්පත්) ධාරිතා සංවර්ධනය කිරීම.
14	සමාජ සුබසාධන හා සමාජ ආරක්ෂණ අංශය	රජයේ සහනාධාර හා සමාජ ආරක්ෂණ අරමුදලේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම .
15	නීති අංශය	නීති උපදෙස් ලබාදීම හා නෛතික කටයුතු ක්‍රියාත්මක කිරීම.
16	විමර්ශන අංශය	සේවක විනයානුකූල කටයුතු හා විමර්ෂණ කටයුතු පවතවාගෙන යාම.
17	විශ්‍රාම වැටුප් අංශය	සේවක විශ්‍රාම ගැනීම් සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක කිරීම.

1.5 දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය



පරිච්ඡේදය - 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන්වල ප්‍රගතිය

2.1.1. පාලන අංශය

2.1.1.1. පාලන අංශයේ කාර්ය භාරය

පාලන, ආයතන, විශ්‍රාම වැටුප්, නීති හා විමර්ශන අංශවලට අදාල කටයුතු සිදු කරනු ලබයි. පරිපාලනයේ දී මුහුණ දෙනු ලබන එදිනෙදා කටයුතු සහ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමද මෙම අංශය යටතේ ඉටු කෙරෙන ප්‍රධාන රාජකාරි වේ.

2.1.1.1.1. ප්‍රධාන අරමුණු

- බඳවා ගැනීම් හා උසස්වීම් පටිපාටිය ක්‍රියාත්මක කිරීම.
- කාර්ය මණ්ඩලයේ යහපැවැත්ම, විනය පවත්වාගෙන යාම, දෛනික රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- ආයතනයේ යහපැවැත්ම තහවුරු කිරීම.
- කාර්යාල පිරි සැකැස්ම සකස් කිරීම හා කාර්යාල සංවිධාන ව්‍යුහය සකස් කිරීම.

2.1.1.1.2. දෛනික රාජකාරි

- දෛනික තැපෑල පිළිබඳ කටයුතු කිරීම.
- අංශවල හා අංශ ගත සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.
- මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම.
- සේවක මණ්ඩල ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීම.
- කාර්ය මණ්ඩලයේ සියලු නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව, පවත්වාගෙන යාම, යාවත්කාලීන කිරීම.
- ප්‍රවාහන ඒකකය කළමනාකරණය කිරීම.
- සේවක වැටුප්, දීමනා හා ගමන් වියදම් හා සියලුම ගෙවීම් සම්බන්ධ බිල්පත් ගෙවීම් කිරීමට අදාල කටයුතු.
- කාර්යක්ෂමතා කඩඉම් විභාග, තරඟ විභාග හා උසස්වීමේ විභාග සංවිධානය කිරීම.
- නිලධාරීන් අනුයුක්ත කිරීම සම්බන්ධ සංඛ්‍යා ලේඛන වාර්තා නඩත්තු කිරීම.
- අන්තර් දිස්ත්‍රික් ස්ථාන මාරු කටයුතු.
- නිලධාරින් හා සම්බන්ධ විනය පරිපාලන කටයුතු.

2.1.1.1.3. විශේෂ පැවරුම්

- පාර්ලිමේන්තු ප්‍රශ්නවලට අදාල පිළිතුරු ලබාදීම හා අමාත්‍යාංශය අතර සම්බන්ධීකරණය.
- මහජන පෙත්සම් කාරක සභා රාජකාරි කටයුතු.
- පාලන අංශයට අදාල විගණන විමසුම සඳහා පිළිතුරු සැකසීම හා සම්බන්ධීකරණය.

- පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීම්වලින් පැන නඟින කරුණු පිළිබඳව කටයුතු කිරීම හා ඒ පිළිබඳව අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම.
- කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ අනෙකුත් උසස්වීම් විභාග පැවැත්වීම / සන්නිවේදන කාර්ය සපුරාලීම.
- පවතින පුරප්පාඩු පිළිබඳ සලකා බලා නව නිලධාරීන් බඳවා ගැනීම.

2023 වර්ෂයේ පහත සඳහන් පරිදි දෙපාර්තමේන්තුගත නිලධාරීන් වෙනුවෙන් කාර්යක්ෂමතා කඩයිම් විභාග පවත්වන ලදි.

2023 වර්ෂයේ පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ
සංඛ්‍යා සටහන - (I)

අනු අංකය	විභාගය පැවැත්විය යුතු නිලධාරීන්	සේවා ගණය	පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
01	විධායක නිලධාරී	SL-1	1 වන සහ 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
02	විධායක නිලධාරී (අභ්‍යන්තර විගණක)	SL-1	1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
03	සමෘද්ධි කළමණාකරු	MN-4	1 වන සහ 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
04	කාර්මික නිලධාරී	MT-1	1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
05	අභ්‍යන්තර විගණන නිලධාරී	MT-1	1 වන සහ 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
06	තොරතුරු තාක්ෂණ සහකාර	MT-1	1 වන සහ 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
07	පරිගණක විශ්ලේෂක	MT-1	1 වන සහ 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
08	පොත් තබන්නා	MT-1	1 වන සහ 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
09	ගිණුම් සහකාර	MT-1	1 වන සහ 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
10	මාධ්‍ය සහකාර	MT-1	1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
11	කළමණාකරන සහකාර	MN-2	2 වන සහ 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
12	සමෘද්ධි සංවර්ධන නිලධාරී	MN-1	1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2.1.1.1.4. කාර්ය මණ්ඩලය.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් 2023.11.01 දින අනුමත කර ඇති කාර්ය මණ්ඩලය

අනු අංකය	තනතුරු නාමය	සේවය	රා.ප.ව. අංක **03/2016** අනුව වැටුප් කේතය	ශ්‍රේණිය	අනුමත තනතුරු සංඛ්‍යාව								ඇනට සිටින සේවක සංඛ්‍යාව
					ප්‍රධාන කාර්යාලය	දිස්ත්‍රික් කාර්යාල	ප්‍රා.ලේ.කා.	බැංකු සම්බන්ධීකරණ	ග්‍රාම නිලධාරී වසම්	ප්‍රාදේ මූල බංකු	සහනාධාර මධ්‍යස්ථාන	එකතුව	
1	අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී.ලං.ප.සේ.	SL 3	විශේෂ	1							1	1
2	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී.ලං.ප.සේ.	SL 3	විශේෂ	2							2	2
3	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී.ලං.ක්‍ර.සේ.	SL 3	විශේෂ	1							1	1
4	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	දෙපාර්තමේන්තුගත	SL 3	විශේෂ	1							1	0
5	ප්‍රධාන මූල්‍ය නිලධාරී	ශ්‍රී.ලං.ග.සේ.	SL 3	විශේෂ	1							1	0
6	අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ප.සේ.	SL 1	I	5							5	2
7	අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ක්‍ර.සේ.	SL 1	I	4							4	2
8	අධ්‍යක්ෂ	දෙපාර්තමේන්තුගත	SL 1	I	6							6	0
9	ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ.	SL 1	I	1							1	0
10	ප්‍රධාන අභ්‍යන්තර විගණක	ශ්‍රී.ලං.ග.සේ.	SL 1	I	1							1	1
11	දිස්ත්‍රික් අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ප.සේ.	SL 1	I		18						18	17
12	දිස්ත්‍රික් අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ක්‍ර.සේ.	SL 1	I		5						5	3
13	දිස්ත්‍රික් අධ්‍යක්ෂ	දෙපාර්තමේන්තුගත	SL 1	I		2						2	0
14	අභ්‍යන්තර විගණක	දෙපාර්තමේන්තුගත	SL 1	I	2							2	2
15	ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ.	SL 1	I	1	25						26	11
16	නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ප.සේ.	SL 1	III/II	5							5	0
17	නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ක්‍ර.සේ.	SL 1	III/II	4							4	0
18	නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ	දෙපාර්තමේන්තුගත	SL 1	III/II	11	28						39	23
19	නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ	දෙපාර්තමේන්තුගත	MM 1	III/II	1	1						2	1

අනු අංකය	තනතුරු නාමය	සේවය	රා.ප.ව. අංක **03/2016** අනුව වැටුප් කේතය	ශ්‍රේණිය	අනුමත තනතුරු සංඛ්‍යාව								දැනට සිටින සේවක සංඛ්‍යාව
					ප්‍රධාන කාර්යාලය	දිස්ත්‍රික් කාර්යාල	හා.ලේ.සභ.	බැංකු සමිති	ග්‍රාම නිලධාරී වසම්	ප්‍රාථමික මූල බැංකු	පුනුණු මධ්‍යස්ථාන	එකතුව	
20	නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.තො.හා ස.තා.සේ.	SL 1	III/II	2							2	0
21	නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ඉ.සේ.	SL 1	III/II	1							1	0
22	නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.කෘ.සේ.	SL 1	III/II	1							1	0
23	නීති නිලධාරී	දෙපාර්තමේන්තුගත	SL 1	III/II	1							1	0
24	පරිපාලන නිලධාරී	දෙපාර්තමේන්තුගත	MN 7	විශේෂ	1							1	1
25	පරිපාලන නිලධාරී	ක.සේ.නි.සේ. (අධි)	MN 7	විශේෂ	2							2	0
26	පද්ධති විශ්ලේෂක	දෙපාර්තමේන්තුගත	MN 7	විශේෂ	1							1	1
27	ප්‍රවෘත්ති නිලධාරී	දෙපාර්තමේන්තුගත	MN 7	විශේෂ	1							1	1
28	මුදල් සහකාර	දෙපාර්තමේන්තුගත	MN 7	විශේෂ	1							1	1
29	සමෘද්ධි කළමණාකරු(විශේෂ)	දෙපාර්තමේන්තුගත	MN 7	විශේෂ	40	187	684	340		1089	4	2344	1414
30	සමෘද්ධි කළමණාකරු	දෙපාර්තමේන්තුගත	MN 4	III/II/I								0	683
31	සමෘද්ධි කළමණාකරු	දෙපාර්තමේන්තුගත	MA 3	III/II/I								0	15
32	සමෘද්ධි කළමණාකරු	දෙපාර්තමේන්තුගත	JM 1-2	II/I								0	63
33	සමෘද්ධි කළමණාකරු(විශේෂ)	දෙපාර්තමේන්තුගත	MN 6	I විශේෂ								0	49
	සමෘද්ධි කළමණාකරු	දෙපාර්තමේන්තුගත	MA5-2										0
34	අභ්‍යන්තර විගණන නිලධාරී (විශේෂ)	දෙපාර්තමේන්තුගත	MN 7	විශේෂ	7							7	8
35	අභ්‍යන්තර විගණන නිලධාරී	දෙපාර්තමේන්තුගත	JM 1-2	II/I		3						3	1
36	භාෂා පරිවර්තක	භා.ප.සේ.	MN 6	I විශේෂ	1							1	0
37	තොරතුරු තාක්ෂණ නිලධාරී	ශ්‍රී.ලං.තො.හා ස.තා.සේ.	MN 6	2පන්තිය II/I	4	4						8	1
38	සංවර්ධන නිලධාරී	ස.නි.සේ.	MN 4	III/II/I	13	124						137	2361
39	අභ්‍යන්තර විගණන නිලධාරී	දෙපාර්තමේන්තුගත	MT 1	III/II/I	8	64						72	70
40	අභ්‍යන්තර විගණන නිලධාරී	දෙපාර්තමේන්තුගත	MA 2-1	III/II/I		9						9	1

අනු අංකය	තනතුරු නාමය	සේවය	රා.ප.ව. අංක **03/2016** අනුව වැටුප් කේතය	ශ්‍රේණිය	අනුමත තනතුරු සංඛ්‍යාව								දැනට සිටින සේවක සංඛ්‍යාව
					ප්‍රධාන කාර්යාලය	දිස්ත්‍රික් කාර්යාල	ප්‍රා.ලේ.කා.	බැංකු සමිති	ග්‍රාම නිලධාරී වසම්	ප්‍රාථමික මූල බංකු	පුනුණු මධ්‍යස්ථාන	එකතුව	
41	කාර්මික නිලධාරී	දෙපාර්තමේන්තුගත	MT 1	III/II/I	3	6						9	6
42	කාර්මික නිලධාරී	දෙපාර්තමේන්තුගත	MA 2-1	III/II/I		1						1	1
43	භාෂා පරිවර්තක	දෙපාර්තමේන්තුගත	MT 1	III/II/I	1							1	1
44	ප්‍රධාන ලිපිකරු	දෙපාර්තමේන්තුගත	MN 2	III/II/I	7							7	5
45	කළමණාකරන සේවා නිලධාරී	ක.සේ.නි.සේ.	MN 2	III/II/I	20	32	101					153	148
46	කළමණාකරන සහකාර	දෙපාර්තමේන්තුගත	MN 2	III/II/I	34	30	57			9	4	134	121
	කළමණාකරන සහකාර	දෙපාර්තමේන්තුගත	MN 2	III/II/I			1020			1089			0
47	කළමණාකරන සහකාර	දෙපාර්තමේන්තුගත	MA 1-2	III/II/I	2	18	2					22	2
48	තොරතුරු තාක්ෂණ සහකාර	ශ්‍රී.ලං.තො.හා ස.තා.සේ.	MT 1	III/II/I	6							6	1
49	තොරතුරු තාක්ෂණ සහකාර	දෙපාර්තමේන්තුගත	MT 1	III/II/I	1							1	1
50	ගිණුම් සහකාර	දෙපාර්තමේන්තුගත	MT 1	III/II/I	1							1	4
51	පරිගණක විශ්ලේෂක	දෙපාර්තමේන්තුගත	MT 1	III/II/I	1							1	0
52	සමෘද්ධි සංවර්ධන නිලධාරී	දෙපාර්තමේන්තුගත	MN 1	III/II/I	51	164	1191	320	13837	4245	4	19812	18248
53	සමෘද්ධි සංවර්ධන නිලධාරී	දෙපාර්තමේන්තුගත	MA 1-1	III/II/I	3	6	29		185	102		325	248
54	රියදුරු	ඒ.රි.සේ.	PL 3	III/II/I විශේෂ	4	21					4	29	18
55	රියදුරු	දෙපාර්තමේන්තුගත	PL 3	III/II/I විශේෂ	19	42						61	71
56	රියදුරු (EPF)	දෙපාර්තමේන්තුගත	PL 3	III/II/I විශේෂ	2							2	0
57	සංචාරක බංගලා භාරකරු	දෙපාර්තමේන්තුගත	PL 2	III/II/I විශේෂ	1							1	1
58	අරක්කැමි	දෙපාර්තමේන්තුගත	PL 3	III/II/I විශේෂ							1	1	1

අනු අංකය	තනතුරු නාමය	සේවය	රා.ප.ව. අංක **03/2016** අනුව වැටුප් කේතය	ශ්‍රේණිය	අනුමත තනතුරු සංඛ්‍යාව								දැනට සිටින සේවක සංඛ්‍යාව
					ප්‍රධාන කාර්යාල	දිස්ත්‍රික් කාර්යාල	ප්‍රා.ලේ.කා.	බැංකු සමිති	ග්‍රාම නිලධාරී වසම්	ප්‍රාථ මූල බංකු	ප්‍රාදේශීය මධ්‍යස්ථාන	එකතුව	
59	කාර්යාල කාර්ය සහායක	කා.සේ.සේ	PL 1	III/II/I විශේෂ	26	35	214				4	279	297
60	කාර්යාල කාර්ය සහායක	දෙපාර්තමේන්තුගත	PL 1	III/II/I විශේෂ	10	10	18			1		39	32
61	රියදුරු සහායක	දෙපාර්තමේන්තුගත	PL 1	III/II/I විශේෂ	1	2						3	4
62	කම්කරු	දෙපාර්තමේන්තුගත	PL 1	III/II/I විශේෂ		3					5	8	8
63	මුරකරු	දෙපාර්තමේන්තුගත	PL 2	III/II/I විශේෂ			2				6	8	8
64	පොත් තබන්නා	දෙපාර්තමේන්තුගත		MT 1									1
65	මාධ්‍ය සහකාර	දෙපාර්තමේන්තුගත		MT 1									1
							3318	660	14022				23964
	එකතුව				**324**	**840**	**18000**			**6535**	**32**	**25731**	

2.1.1.2. ආයතන අංශය

දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන සියළුම සමෘද්ධි කළමණාකරුවන්ගේ හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොණුවල රාජකාරී කටයුතු මෙම අංශය මඟින් ඉටු කරනු ලබයි. ඒ අනුව

- එක් එක් නිලධාරීන්ගේ ශ්‍රේණි උසස් වීම් ලබා දීම.
- සේවය ස්ථිර කිරීම.
- පනතේ විධිවිධාන අනුව නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම.
- එක් එක් නිලධාරීන්ගේ අවශ්‍යතා අනුව දේශීය, විදේශීය නිවාඩු ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.

2.1.1.3. විමර්ශන අංශය

2.1.1.3.1. අරමුණු

1. නිලධාරීන් විසින් සිදු කරන විෂමාචාරයන් විමර්ශනය කර, විනය දඬුවම් පැමිණවීම මඟින් ඔවුන් නිසි මගට ගැනීමට කටයුතු කිරීම.
2. දෙපාර්තමේන්තුවේ සහ රාජ්‍ය සේවයේ කීර්ති නාමය ආරක්ෂා කිරීම.
3. දෙපාර්තමේන්තු සේවකයින් තුළ විනය පවත්වාගෙන යාම සහ මූල්‍ය විනය පවත්වාගෙන යාම සහතික කිරීම.
4. වංචා වළක්වා අක්‍රමිකතා වැලැක්වීම සඳහා අවශ්‍ය යෝජනා / නිර්දේශ ඉදිරිපත් කිරීම.

2.1.1.3.2. අංශයේ කාර්යභාරය

- ලැබෙන පැමිණිලි අනුව මූලික විමර්ශන පැවැත්වීම.
- අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන විශේෂ විගණන පරීක්ෂණ සම්බන්ධ ඉදිරි විනය ක්‍රියාමාර්ග සිදු කිරීම.
- නිදහසට කරුණු විමසීම හා චෝදනා පත්‍ර නිකුත් කිරීම.
- විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම.
- විනය නියෝග නිකුත් කිරීම.
- මාණ්ඩලික නිලධාරීන්ට අදාළ චෝදනා පත්‍ර කෙටුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.
- විනය නියෝගවලට එරෙහි අභියාචනා සඳහා රාජ්‍යසේවා කොමිෂන් සභාව වෙත වාර්තා ඉදිරිපත් කිරීම.
- ජනාධිපති විමර්ශන අංශය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව හා පාර්ලිමේන්තු පෙත්සම්කාරක සභාව වැනි ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු.

2.1.1.3.3. 2023 වර්ෂයේදී සිදු කළ කාර්යයන්හි සංක්ෂිප්ත වාර්තාව

2023 වර්ෂයේ මූලික විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා සමෘද්ධි කළමණාකරුවන් හා සංවර්ධන නිලධාරීන් 186 ක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ඉන් සමෘද්ධි කළමණාකරුවන් 17 කු හා සංවර්ධන නිලධාරීන් 31 ක් වශයෙන් නිලධාරීන් 48 ක් බඳවා ගන්නා ලද අතර, එම නිලධාරීන් සඳහා බලංගොඩ සමනලවැව පුහුණු මධ්‍යස්ථානයේදී පුහුණු වැඩමුළුවක් පවත්වන ලදි.

- වර්ෂය තුළ ලැබී ඇති මූලික විමර්ශන වාර්තා - 75
- මූලික විමර්ශන පැවැත්වීම සඳහා පත් කරන ලද සංඛ්‍යාව - 62
- ලැබුණු විශේෂ විගණන පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව - 54
- අළුතින් ආරම්භ කරන ලද විෂය ගොනු සංඛ්‍යාව - 205
- අනිවාර්ය නිවාඩු /ස්ථාන මාරුවීම් / වැඩ තහනම් කරන ලද සංඛ්‍යාව - 67
- නිදහසට කරුණු විමසීම් සංඛ්‍යාව - 151
- නිදහසට කරුණු විමසීමට අදාළව තීරණ දැනුම් දීම - 94
- නිකුත් කරන ලද චෝදනා පත්‍ර සංඛ්‍යාව - 171
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවන ලද චෝදනා පත්‍ර කෙටුම්පත් සංඛ්‍යාව - 14
- පත් කරන ලද විනිශ්චය සභා සංඛ්‍යාව - 56
- ලබා දී ඇති විනය නියෝග/අවවාද සංඛ්‍යාව - 280
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා ඇති විනය නියෝග කෙටුම්පත් සංඛ්‍යාව - 10
- පත්වීම් අවසන් කළ /සේවයෙන් පහ කරන ලද සංඛ්‍යාව - 08
- අභියාචනා සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා ඇති 3 වන පරිශිෂ්ට සංඛ්‍යාව - 21
- අභියාචනා තීරණ දැනුම් දීම - 11
- අවසන් කර ඇති ලිපිගොනු සංඛ්‍යාව - 372

2.1.1.4. විශ්‍රාම වැටුප් අංශය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ගෙන් මුල් සේවා හා නව සේවා මනාපය පල කරමින් අන්තර්ග්‍රහණය වූ නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් හිමිකම් ප්‍රධානය කිරීම විශ්‍රාම වැටුප් ඒකකය මඟින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යය වේ.

මේ අනුව 2019 වර්ෂයේ අගොස්තු මස 01 වන දින සිට දෙපාර්තමේන්තුවේ පාලන අංශය යටතේ මෙම ඒකකය ස්ථාපිත කරන ලදි. එතැන් සිට මේ දක්වා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ හා අමතර වශයෙන් ලබා දී ඇති උපදෙස්වලට අනුගත වෙමින් සමෘද්ධි දෙපාර්තමේන්න්තුවේ නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ පිළිගැන්වීම ක්‍රියාත්මක කරන ලදි.

මෙහිදී අධිකාරියක් තුල කටයුතු කරමින් ඒ අනුව පෞද්ගලික ලිපිගොනු නඩත්තු කරමින් කටයුතු කළ ආයතනික ක්‍රියාවලිය තුල පොදු 53 වර්යා සටහන ආදිය මුල් පත්වීමේ දින සිට නිලධාරියා විශ්‍රාම යන /

මිය යන දිනය දක්වා පත්වීමට අදාල සියළු තොරතුරු ක්‍රමානුකූලව ඇතුලත් කරමින්, සටහන් කිරීම ඇතැම් අවස්ථාවල ගැටළු සහගත තත්ත්වයක පැවති අතර, මෙම කරුණු නිරාකරණය කර ගැනීම සඳහා දැඩි වෙහෙසක් දැරීම සියළු නිලධාරීන් මුහුණ දුන් අභියෝගයක් විය.

මෙම සියළු කාරණා විශ්‍රාම වැටුප් චක්‍රලේඛ, අණ පනත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හා ගලපා ගනිමින් 2019 වර්ෂයේ ආරම්භ කල මෙම ඒකකය මඟින් 2023.12.31 දිනට විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන් 3101 අතරින් නිලධාරීන් 2269 දෙනෙකුට අදාල ලිපිගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර, ඒ අතරින් නිලධාරීන් 2022 ක් මේ වන විට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබමින් සිටියි.

මෙම කාර්යය කාර්යක්ෂමව හා යාවත්කාලීනව පවත්වා ගෙන යාම සඳහා නිරන්තර ප්‍රගති සමාලෝචන හා Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලද වැඩසටහන්ද ඉවහල් විය.

2.1.1.4.1. විශ්‍රාම වැටුප් ගෙවීමේ ප්‍රගතිය 2023.12.31 දිනට

සංඛ්‍යා සටහන - (II)

අනු අංකය	කාරණය	විශ්‍රාම ගිය සංඛ්‍යාව	මිය ගිය සංඛ්‍යාව	එකතුව
1	විශ්‍රාම ගිය සංඛ්‍යාව	2,596	505	3,101
2	නිලධාරීන් විසින් අවශ්‍ය තොරතුරු ලබා නොදීම මත ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි ගොණු සංඛ්‍යාව	17	33	50
3	විශ්‍රාම වැටුප් ගෙවිය යුතු මුළු සංඛ්‍යාව	2,579	472	3,051
***4**	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කළ සංඛ්‍යාව	1,999	270	2,269
5	විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා තවදුරටත් සමෘද්ධි දෙපාර්තමේන්තුවේ ඉතිරි සංඛ්‍යාව	580	202	782
***4**	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කළ සංඛ්‍යාව	1,999	270	2,269
2022.12.31 දිනට සමස්ත ගෙවීම් එකතුව		1,796	226	2,022
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ගෙවීමට ඉතිරි		203	44	247

2.1.1.5. නීති අංශය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියළුම අංශයන්ට අදාල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය වන නෛතික කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම, නෛතික සහාය ලබා දීමත්, දෙපාර්තමේන්තුවේ හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති නිලධාරීන් හා ප්‍රතිලාභීන් නීතිමය වශයෙන් සවිබලගැන්වීම සඳහා මැදිහත් වෙමින් ඵලදායීතාවය ඉහළ නැංවීමත්, දෙපාර්තමේන්තුව විසින් හා දෙපාර්තමේන්තුවට එරෙහි කටයුතුවලදී නීතිපති දෙපාර්තමේන්තුව හා නිසි සම්බන්ධීකරණය සිදු කිරීමත් නීති අංශයේ කාර්යභාරය වේ.

2023 වසරේ නිති අංශය මඟින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමණාකරුවන් සඳහා නීතිමය සවිබලගැන්වීමේ වැඩසටහන් , බැංකු පාලක මණ්ඩලය හා බැංකු සමිතිවල විධායක කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන් මොණරාගල හා බදුල්ල දිස්ත්‍රික්කවල පවත්වන ලද අතර, ඒ සඳහා රු. 159,250.00ක වියදමක් දරන ලදි.

2.1.2.සමාජ ආරක්ෂණ හා සුභ සාධන අංශය

2.1.2.1 හැදින්වීම:-

අංක 8 දරණ භාරකාර ඔප්පුව මඟින් 1997.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල ආරම්භ කර පවත්වාගෙන යනු ලැබේ. සමාජ ආරක්ෂණ අරමුදල ලාභ නොලබන පදනමින් සුභසාධන අරමුණ පෙරදැරිව සංස්ථාපනය කොට ඇත. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ස්වේච්ඡා මාසික දායකත්වය, බැංකු ආයෝජනයන් සහ සමාජ ආරක්ෂණ අරමුදල මඟින් පාලනය වන නිලාවේලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය වැනි ආයතන මඟින් ලැබෙන ආදායම් තුලින් සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල ගොඩනැගී ඇත.

2013 අංක 01 දරණ දිවිනැගුම පනතට අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ දී, සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කටයුතු එලෙසම ක්‍රියාත්මක කිරීම සඳහා මීට සම්බන්ධ කරන ලදී. ඒ අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ දිවිනැගුම සමාජ ආරක්ෂණ අරමුදල ලෙස ක්‍රියාත්මක වූ අතර, 2017 වර්ෂයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් දෙපාර්තමේන්තු නාමය සංශෝධනය වීමත් සමග මෙම අරමුදල සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල නමින් ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සභාපතිත්වයෙන් යුතුව සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලය මඟින් අරමුදලේ කළමනාකරණය,පරිපාලනය හා පාලන කටයුතු සිදු වේ.

2.1.2.2 අරමුණු:-

- සමෘද්ධි සහනාධාරලාභීන් සහ සමාජයේ අවාසි සහගත තත්වයට පත් පුද්ගලයන්, කණ්ඩායම්, අනපේක්ෂිතව හා අපේක්ෂිතව මුහුණ දීමට සිදුවන මූල්‍යමය දුෂ්කරතා අවමකර ඔවුන්ගේ සමාජීය හා ජීවන තත්වය සුරක්ෂිත කිරීම සමාජ ආරක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම

- සහනාධාරලාභී ප්‍රජාවගේ පෝෂණ මට්ටම ඉහල නැංවීම සහ සෞඛ්‍ය සම්පන්න පරිසරයක් නිර්මාණය කිරීම තුලින් ඔවුන්ගේ සමාජීය හා ආර්ථික තත්වය නඟා සිටුවීමට ක්‍රියා කිරීම.

- අතිරික්ත මුදල් ඉහල පොලී අනුපාතයන් යටතේ රාජ්‍ය බැංකුවල ආයෝජනය කිරීම තුලින් සහ නිලාවේලි පුහුණු මධ්‍යස්ථානයේ ආදායම ඉහල නැංවීම තුලින් අරමුදල තර කර ගැනීම.

2.1.2.3 ව්‍යාපෘතිය හෝ ක්‍රියාකාරකම් පිළිබඳව හැඳින්වීම

සමෘද්ධි ප්‍රතිලාභීන් විසින් ස්වකැමැත්තෙන් දෙනු ලබන මාසික දායකත්ව මුදල හා එම දායකත්ව මුදලින් ප්‍රතිලාභී ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව ඉතිරි වන මුදල් රාජ්‍ය බැංකු වල ආයෝජනය සහ එමඟින් උපයා ගන්නා පොලී ආදායම් මඟින් මෙම අරමුදල ගොඩනැගී ඇත.

මෙම අරමුදල තුලින් සමෘද්ධි ප්‍රතිලාභීන්, අඩු ආදායම්ලාභීන් හා අවාසි සහගත තත්ත්වයන්ට පත්වූ පුද්ගලයන්,කණ්ඩායම් සඳහා ප්‍රධාන වශයෙන් උපත් ,නිවුන් දරු උපත්, විවාහ,රෝහල් ගතවීම, මරණ සහ සිප්දොර ශිෂ්‍යත්ව යන අපේක්ෂිත හා අනපේක්ෂිත සිදුවීම් සඳහා රක්ෂණ ක්‍රමවේදයක් වශයෙන් ප්‍රතිලාභ ලබා දෙනු ලැබේ.

2023 ජුනි මස සිට ‘‘අස්වැසුම’’ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමත් සමඟ සමෘද්ධි සහනාධාර වැඩසටහන අහෝසි වී යන අතර සමෘද්ධි සහනාධාරලාභීන් විසින් මාසිකව සමාජ ආරක්ෂණ අරමුදලට ලබාදෙන දායක මුදල ද අහිමි වී ඇත. එමෙන්ම එලෙස දායකත්වය සැපයූ සමෘද්ධි සහනාධාර මඟින්ද විශාල වෙනසකට භාජනය වූ අතර අප දෙපාර්තමේන්තුව සතුව තිබූ ප්‍රතිලාභී සමාජ ආරක්ෂණ දත්ත පද්ධතිය තුල වූ එම ප්‍රතිලාභීනට අදාලවන තොරතුරු සැලැස්ම අක්‍රිය වී ඇත.

මෙවැනි හේතූන් මත ‘‘අස්වැසුම’’සුභ සාධන වැඩසටහනට ඇතුලත් නොවන සමෘද්ධි සහනාධාර පවුල් මෙන්ම එලෙස ඇතුලත් වන පවුල් මඟින් ද සමාජ ආරක්ෂණ අරමුදලට වන දායකත්වය නතර වීමත් සමඟ සමෘද්ධි සහනාධාර සමාජ ආරක්ෂණ වැඩ සටහන සමග සිටි පවුල් 1,640,000ක පමණ ප්‍රමාණයකට මෙතෙක් ලබාදුන් රක්ෂණ පහසුකම් අහෝසි වී ඇත. තවද 2023.08.02 හා අංක 25/1417/601/047 දරණ අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීමට අනුව අස්වැසුම සුභ සාධන ප්‍රතිලාභ සඳහා ඉල්ලුම් කළද දැනට තේරී නොමැති සමෘද්ධි සහනාධාර ලාභී පවුල් සඳහා අස්වැසුම වැඩසටහන යටතේ ඇති අභියාචනා හා විරෝධතා සමාලෝචනය කිරීමේ ක්‍රියාවලිය අවසන් වනතුරු සමෘද්ධි දෙපාර්තමේන්තුවෙන් සමෘද්ධි සහනාධාර වැඩසටහන පෙර පරිදිම සිදුකිරීමට උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව අස්වැසුම ප්‍රතිලාභී ගෙවීම් ක්‍රමවේදය ක්‍රියාත්මක වීමත් සමඟ දැනට ඇති අභියාචනා හා විරෝධතා සමාලෝචනය කිරීමේ කටයුතු අවසන් වනතුරු සමෘද්ධි ප්‍රතිලාභීන් 393,094 කට සමෘද්ධි දෙපාර්තමේන්තුව හරහා පෙර පරිදිම සමෘද්ධි සහනාධාර ලබා දීමට කටයුතු සිදුකරන ලදි. ඒ අනුව එම ප්‍රතිලාභීන්ට අදාලව ජූලි මස සිට සමාජ ආරක්ෂණ ගෙවීම් 2023 නොවැම්බර් 31 දක්වා ගෙවීම් සිදුකොට ඇත.

මීට අමතරව සමෘද්ධි සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත සමාජයේ අවාසි සහගත තත්වයට පත් පුද්ගලයින්, කණ්ඩායම්, ආයතන සඳහා මූල්‍යමය සහ ද්‍රව්‍යමය ආධාර ලබා දෙනු ඇත.
එසේම අරමුදලට අයත් ස්ථාවර වත්කමක් වන නිලාවෙලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය මඟින්, අභ්‍යන්තර සහ වෙනත් බාහිර ආයතන වෙත නේවාසික පහසුකම්, පුහුණුවීම්,දේශණ,වැඩමුළු පවත්වනු ලැබේ.

2.1.2.4 ඉලක්ක කණ්ඩායම :-

I.සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල සමාජිකයන්

II.සමාජයේ අවාසි සහගත තත්ත්වයටපත් පුද්ගලයන්,කණ්ඩායම්,ආයතන

2.1.2.5 ක්‍රියාත්මක ක්‍රමවේදය:-

සමෘද්ධි ප්‍රතිලාභීන් තමන්ට හිමි රු.4500,රු.3200, රු.1900 යන සහනාධාර වටිනාකම් අනුව පිළිවෙලින් ස්වකැමැත්තෙන් දෙනු ලබන රු.200/= රු.150/=, රු130/= යන මාසික දායකත්ව උපයෝගී කරගෙන උපත්, නිවුන් දරු උපත්,මරණ විවාහ,රෝහල් ගතවීම්, සහ සිප්දොර ශිෂ්‍යත්ව සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දේ. එම ප්‍රතිලාභී ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව ඉතිරිවන මුදල් ඉහල පොලී අනුපාතයන් යටතේ රාජ්‍ය බැංකුවල ආයෝජනය කරනු ලැබේ. මෙම සිදුවීම් අතරින් ප්‍රමාණය නිශ්චිතවම දැක්විය හැකි සිදුවීම වන්නේ සිප්දොර ශිෂ්‍යත්ව පමණි. එනම් වසරකට අ.පොස (සා.පෙ.) සමත්ව උසස් පෙළ හදාරණ සියළුම සමෘද්ධිලාභී ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා සිප්දොර ශිෂ්‍යත්ව ලබා දේ. අනිකුත් සියළුම සිදුවීම් සම්බන්ධයෙන් නිශ්චිත ගණනය කිරීමක් දැක්විය නොහැකි නමුත් ඉල්ලුම් කරනු ලබන ප්‍රතිලාභී ඉල්ලීම් සඳහා චක්‍රලේඛ අනුකූලව ගෙවීම් සිදු කරනු ලැබේ. ඉහත සිදුවීම් වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවීම් ක්‍රියාවලිය පහත පරිදි වේ.

2.1.2.6 ගෙවීම් ක්‍රියාවලිය

වසම → කලාප කාර්යාලය (සමෘද්ධි ප්‍රජාමූල බැංකුව) → ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (සමෘද්ධි මූලස්ථානය) → දිස්ත්‍රික් ලේකම් කාර්යාලය → ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල

ඒ අනුව වර්ෂය ආරම්භයේ දී ඊට අදාල මුදල් ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අංශය මඟින් සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අත්තිකාරම් මුදලක් නිදහස් කරනු ලැබේ. එම අත්තිකාරම් මුදල් උපයෝගී කර ගෙන ප්‍රතිලාභ සඳහා ගෙවීම් කල යුතු අතර, ඉන්පසු අදාල වියදම් ප්‍රතිපූර්ණය කර ගත යුතුය.

අදාල සිදුවීම් සඳහා වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරියා විසින් නිසි ලෙස සම්පූර්ණ කරන ලද සමාජ ආරක්ෂණ ප්‍රතිලාභී අයදුම්පත්‍ර සමග අදාල ලිපි ලේඛණ කලාප භාර කළමණාකරු හෙවත් ප්‍රජාමූල බැංකු කලමණාකරු වෙත භාර දිය යුතුය. ඔහුගේ නිර්දේශය සහිත එම අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූලස්ථාන කලමණාකරු වෙත භාර දිය යුතු අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂයභාර නිලධාරි විසින්, සකස් කරන ලද ලේඛනය ප්‍රාදේශීය ලේකම් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. ඉන් අනතුරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී විසින් වියදම් සහතික කිරීමෙන් පසු අදාල ප්‍රතිලාභීන්ට සමෘද්ධි ප්‍රජාමූල බැංකු හරහා ගෙවීම් සිදුකරනු ලැබේ. තව ද 2023 දිස්ත්‍රික් 25 තුලින් තෝරා ගන්නා ලද බැංකු 25 තුල, සමෘද්ධි ප්‍රතිලාභ මාර්ගස්ථ ක්‍රමය හරහා, සමෘද්ධි ප්‍රතිලාභීන්ට මුදල් බැර කිරීමේ නියමු ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සියළු වසම්වලට අදාලව සිදුකළ ප්‍රතිලාභ ගෙවීම් මුදල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කල යුතුය. ඉන්පසුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සියළු ප්‍රතිලාභ ගෙවීම් ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල මඟින් ප්‍රතිපූර්ණය කර ගත යුතුය. මේ ආකාරයකට ලබාදුන් අත්තිකාරම් මුදල් ප්‍රමාණවත් නොවේ නම්, සමාජ ආරක්ෂණ අරමුදල මඟින් අමතර අත්තිකාරම් ඉල්ලුම් කල හැකිය.

මෙම ප්‍රධාන කාර්යයන්ට අමතරව, සමෘද්ධි ප්‍රතිලාභීන්ට,අඩු ආදායම්ලාභීන්ට හා සමාජයේ අවාසිසහගත තත්ත්වයට පත් පුද්ගලයන්, කණ්ඩායම්, ආයතනයන්හි අවස්ථානුකූලව පැන නැඟෙන විවිධ අවශ්‍යතාවයන් සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබා දේ.

එසේම නිලාවේලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය, අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් වෙත නේවාසික පහසුකම්, පුහුණුවීම් දේශන හා වැඩමුළු ආදිය පැවැත්වීමට නියමිත අයකිරීම් මත වෙන්කරවා ගත හැකිය.මෙම පුහුණු මධ්‍යස්ථානය සංචාරක ආකර්ෂනයට ලක්වන ප්‍රධාන ස්ථාන අසන්නයේ පිහිටා තිබීම හේතුවෙන් මෙය නවීකරනය කර දෙස් විදෙස් සංචාරකයින්ට නවාතැන් ලබා දී එමඟින් වැඩි ආදායමක් උපයා ගැනීමට කටයුතු කරමින් පවතී.

2.1.2.6 සමාජ ආරක්ෂණ අරමුදල -වියදම් ඇස්තමේන්තුව 2023

2023 ක්‍රියාකාරී සැලැස්ම අනුව අනුමත ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලි.2,247.94, කි.

සංඛ්‍යා සටහන - (III)

විස්තරය	ප්‍රධාන කාර්යාලය	දිස්ත්‍රික් ලේකම් කාර්යාල	නිලාවේලි පුහුණු මධ්‍යස්ථානය	එකතුව
පුනරාවර්තන වියදම් (රු.මි.)	2,208.47	15.4	2.68	2226.55
ප්‍රාග්ධන වියදම් (රු.මි.)	1.71	10.8	8.88	21.39
එකතුව	**2210.18**	**26.2**	**11.56**	**2247.94**

වියදම් වාර්තාව:- 2023.01.01 දින සිට 2023.11.30 දිනට වියදම් (ප්‍රතිලාභී ගෙවීම්)

සංඛ්‍යා සටහන - (IV)

වියදම් වර්ගය	සංඛ්‍යාව	මුදල (රු)
උපත්	7,336	73.360,000.00
විවාහ	21,523	215,230,000.00
රෝහල් ගතවීම්	94,994	187,146,050.00
මරණ	32,156	643,1250.000.00
ශිෂ්‍යත්ව	645,526	968,289,000.00
නිවුන් දරු උපත්	763	3,815,000.00
එකතුව	802,298	2,090,960,050.00

2.1.2.7 ව්‍යාපෘතියේ නිමැවුම:-

2023.01.01 දින සිට 2023.11.30 දක්වා ඉල්ලුම් කරන ලද ප්‍රතිලාභීන් සඳහා චක්‍රලේඛ අනුකූලව ගෙවීම් සිදුකිරීම සහ සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලයේ අනුමත මාණ්ඩලික පත්‍රිකාවලට අදාල කටයුතු ඉටුකිරීම. වර්ෂය තුල අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් විසින් ඉල්ලුම් කරන ලද නේවාසික පහසුකම්, පුහුණු වැඩමුළු දේශනා ආදීන් සඳහා නිලාවේලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය මඟින් අදාල පහසුකම් සැපයීම. මෙම වර්ෂය තුල උපලබ්ධි වූ ආයෝජන ඉහල පොලී අනුපාතයන් යටතේ රාජ්‍ය බැංකුවල ප්‍රති ආයෝජනය සිදු කරන ලදී.

2.1.2.8 ලබා ගත් සමාජ ආර්ථික ප්‍රතිඵල:-

- ප්‍රතිලාභීන්ගේ ජීවන තත්වය පහත වැටීමට සිදු වන අවස්ථාවල දී මූල්‍යම හා වෙනත් ආධාර සැපයීම තුලින් ඔවුන්ගේ පවුල් ආරක්ෂා කිරීම.
- අ.පො.ස(සා.පෙ) සමත් අ.පො.ස (උ.පෙ) හැදෑරීමට වරම් ලද සමෘද්ධි ප්‍රතිලාභී දරුවන්ගේ ද්විතීක අධ්‍යාපනය බිඳවැටීමට ඉඩ නොදී සාර්ථක උසස් අධ්‍යාපනයක් සඳහා දිරිගැන්වීම.
- උපත් සහ නිවුන් දරු උපත් හා රෝග සඳහා මූල්‍යමය ප්‍රතිලාභ ලබා දීම තුලින් පෝෂණ මට්ටම ඉහල නංවා සෞඛ්‍ය සම්පන්න සමාජ ආරක්ෂණ පරිසරයක් සඳහා දායකත්වය සැපයීම.
- සමෘද්ධි සහනාධාරලාභීන් සඳහා වූ ප්‍රධානතම සමාජ ආරක්ෂණ ජාලය උදෙසා දායකවීම තුලින් ජනගහන දරිද්‍රතා දර්ශකය පහත හෙළීමට හේතු වී ඇත.
- ඉහල පොලී අනුපාතයන් යටතේ ආයෝජනය කිරීම තුලින් අරමුදලේ මූල්‍ය තත්වය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීම.

2.1.2.9 අරමුදල මඟින් දැනට ඉටු කරනු ලබන කාර්යයන් :-

සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ගෙවීම

- උපත් සඳහා ගෙවීම - සමෘද්ධිලාභී පවුල්වල පළමු, දෙවන හා තෙවන දරු උපත් සඳහා රු. 10,000/=ගෙවීම් කිරීම
  ඉහත රු. 10,000/= ට අමතරව නිවුන් දරු උපත් සඳහා පහත පරිදි ගෙවීම් කිරීම
  දරුවන් දෙදෙනෙකුට මාසික රු. 5,000/= බැගින් වර්ෂයක්
  දරුවන් තිදෙනෙකුට වැඩි අවස්ථාවක මාසිකව රු. 10,000/= බැඟින් වර්ෂයක්
- විවාහක දීමනා -
  සමෘද්ධිලාභී පවුල්වල ප්‍රතිලාභියාගේ හා දරුවන්ගේ විවාහ 02 ක් සඳහා රු. **10**,0**0**0/= ගෙවීම් කිරීම.

- රෝහල් ගත වීමක දී ගෙවීම-
  සමෘද්ධිලාභී පවුල්වල ප්‍රතිලාභියා හෝ කලත්‍රයා සහ පවුලේ අවිවාහක දරුවන් රෝහල් ගත වීමක දී දිනකට රු.**3**5**0**/= බැගින් වර්ෂයේ දින 30 ක් සඳහා රු. **10**,5**0**0/= ලෙස ප්‍රතිලාභ ගෙවීම් කිරීම.

- මරණයක් සඳහා ගෙවීම-
  සමෘද්ධිලාභී පවුල් වල මරණයක් සඳහා රු. **20**,000/=ගෙවීම් කිරීම.
- සිප්දොර ශිෂ්‍යත්ව- සමෘද්ධිලාභී පවුල්වල අ.පො.ස. (උ. පෙළ) හදාරන දරුවන්ට සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
  දිවයින පුරා විසිරී සිටින සහනාධාරලාභී පවුල්වල අ.පො.ස උසස් පෙළ හදාරන සියළුම සිසු දරු දැරියන්ට මසකට රු. 1,5**0**0/= බැඟින් වසර දෙකක අධ්‍යන කාලයක් සඳහා ශිෂ්‍යත්ව ලබා දේ.

- සමෘද්ධි සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලය මඟින් අනුමත කරනු ලබන වෙනත් අඩු ආදායම්ලාභීන් ඉලක්ක කරගත් සනීපාරක්ෂක වැසිකිලි ඉදිකිරීම් වැනි සමාජ සංවර්ධන ව්‍යාපෘතිද අවස්ථානුකූලව ක්‍රියාත්මක කරනු ලබයි.

සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල

ප්‍රතිලාභී ගෙවීම්

2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා

නු අං ක	දිස් ත්‍රික්කය	උපත්		විවාහ		රෝ ග		මරණ		ශිෂ්‍යත්ව		නිවුන් දරු උපත්		සමුච්චිතය	
		සං ඛ්‍යාව	මුදල	සං ඛ්‍යාව	මුදල	සං ඛ්‍යාව	මුදල	සං ඛ්‍යාව	මුදල	සං ඛ්‍යාව	මුදල	සං ඛ්‍යාව (වා රික)	මුදල	මුදල	සං ඛ්‍යාව
1	කොළඹ	59	590,000	528	5,280,000	1,346	5,149,550	1,235	24,700,000	12,860	19,290,000	9	45,000	16,037	55,054,550
2	ගම්පහ	300	3,000,000	1,671	16,710,000	4,340	15,925,700	2,950	59,000,000	47,762	71,643,000	6	30,000	57,029	166,308,700
3	කළුතර	90	900,000	654	6,540,000	1,757	6,135,500	1,603	32,060,000	19,376	29,064,000	0	-	23,480	74,699,500
4	මහනුවර	183	1,830,000	1,089	10,890,000	3,244	12,572,000	2,335	46,700,000	34,203	51,304,500	35	175,000	41,089	123,471,500
5	මාතලේ	192	1,920,000	547	5,470,000	1,437	5,277,300	1,058	21,160,000	17,929	26,893,500	16	80,000	21,179	60,800,800
6	නුවරඑළිය	149	1,490,000	373	3,730,000	1,183	4,652,550	918	18,360,000	19,707	29,560,500	40	200,000	22,370	57,993,050
7	ගාල්ල	157	1,570,000	898	8,980,000	1,996	7,276,150	1,663	33,260,000	26,891	40,336,500	14	70,000	31,619	91,492,650
8	මාතර	233	2,330,000	881	8,810,000	2,069	7,721,000	1,475	29,500,000	27,307	40,960,500	19	95,000	31,984	89,416,500
9	හම්බන්තොට	394	3,940,000	899	8,990,000	2,309	8,379,350	1,037	20,740,000	31,898	47,847,000	40	200,000	36,577	90,096,350
10	යාපනය	505	5,050,000	1,049	10,490,000	2,366	8,088,850	970	19,400,000	30,547	45,820,500	63	315,000	35,500	89,164,350
11	මන්නාරම	304	3,040,000	468	4,680,000	802	2,928,500	315	6,300,000	17,601	26,401,500	18	90,000	19,508	43,440,000
12	වවුනියාව	282	2,820,000	415	4,150,000	4,025	2,245,950	313	6,260,000	10,622	15,933,000	27	135,000	15,684	31,543,950
13	මුලතිව්	203	2,030,000	347	3,470,000	6,530	2,427,600	275	5,500,000	23,250	34,875,000	8	40,000	30,613	48,342,600
14	කිලිනොච්චි	151	1,510,000	306	3,060,000	5,748	2,134,650	272	5,440,000	12,363	18,544,500	6	30,000	18,846	30,719,150
15	මඩකළපුව	861	8,610,000	1,846	18,460,000	3,346	11,272,800	1,313	26,260,000	43,792	65,688,000	108	540,000	51,266	130,830,800
16	අම්පාර	638	6,380,000	1,372	13,720,000	3,702	11,925,550	1,167	23,340,000	34,823	52,234,500	33	165,000	41,735	107,765,050
17	ත්‍රිකුණාමලය	581	5,810,000	866	8,660,000	1,149	4,379,550	770	15,400,000	21,481	32,221,500	42	210,000	24,889	66,681,050
18	කුරුණෑගල	485	4,850,000	2,041	20,410,000	5,629	19,088,650	3,918	78,360,000	65,683	98,524,500	35	175,000	77,791	221,408,150
19	පුත්තලම	283	2,830,000	748	7,480,000	1,537	5,584,250	1,177	23,540,000	15,796	23,694,000	57	285,000	19,598	63,413,250
20	අනුරාධපුරය	241	2,410,000	687	6,870,000	1,495	6,111,300	1,131	22,620,000	17,872	26,808,000	46	230,000	21,472	65,049,300
21	පොලොන්නරුව	221	2,210,000	395	3,950,000	893	3,605,000	420	8,400,000	13,246	19,869,000	25	125,000	15,200	38,159,000
22	බදුල්ල	262	2,620,000	764	7,640,000	2,207	8,120,700	1,362	27,240,000	18,717	28,075,500	36	180,000	23,348	73,876,200
23	මොනරාගල	245	2,450,000	748	7,480,000	1,985	7,757,750	875	17,500,000	24,039	36,058,500	55	275,000	27,947	71,521,250
24	රත්නපුර	231	2,310,000	1,324	13,240,000	32,078	11,439,400	2,119	42,380,000	39,156	58,734,000	20	100,000	74,928	128,203,400
25	කෑගල්ල	86	860,000	607	6,070,000	1,821	6,946,450	1,485	29,700,000	18,605	27,907,500	5	25,000	22,609	71,508,950
		7,336	**73,360,000**	**21,523**	**215,230,000**	**94,994**	**187,146,050**	**32,156**	**643,120,000**	**645,526**	**968,289,000**	**763**	**3,815,000**	**802,298**	**2,090,960,050**

2.1.2.10 සමෘද්ධි සහනාධාර වැඩසටහන

සමෘද්ධි සහනාධාර වැඩසටහන යටතේ 2023 ජනවාරි මස සිට 2023 ජුනි දක්වා (2023.6.30) දක්වා සහනාධාර නිකුත් කරන ලද සහනාධාර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,637,672 වේ. ඒ සඳහා මුලු සහනාධාර වියදම රු.31,291,519,000.00 වේ. 2023 ජුලි මස සිට 2023 දෙසම්බර් දක්වා සහනාධාර නිකුත් කර ඇති සමෘද්ධි ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව 363,214 කි. ඒ සඳහා මුළු සහනාධාර වියදම රු.7,673,663,900.00 වේ.

ඒ අනුව සමෘද්ධි සහනාධාර වැඩසටහන යටතේ 2023 ජුලි මස සිට 2023 දෙසම්බර් දක්වා සහනාධාර නිකුත් කර ඇති සමෘද්ධි සහනාධාර පිළිබඳ විස්තර පහත පරිදි වේ

අස්වැසුම වැඩසටහන යටතේ ගෙවීම් කළ සමෘද්ධි ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව
(2023 ජූලි - දෙසැම්බර්)
සංඛ්‍යා සටහන - (VI)

අනු අංකය	මාසය	ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව	මුදල (රු)
1	2023 - ජූලි	368,310	1,289,588,600
2	2023 - අගෝ	365,303	1,280,679,900
3	2023 - සැප්	364,498	1,278,350,900
4	2023 - ඔක්	364,389	1,277,506,800
5	2023 - නොවැ	363,385	1,274,424,000
6	2023 - දෙසැ	363,214	1,273,113,700
එකතුව			**7,673,663,900**

2.1.3. සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය හා මහා සංගම් අංශය

2.1.3.1 හැදින්වීම

1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ පනත අනුව සමෘද්ධි ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 1996 දී සමෘද්ධි බැංකු සංගම් ආරම්භ කළ අතර, අඩු ආදායම්ලාභීන්ගේ ඉතිරි කිරීම් වර්ධනය කර, ඒ තුලින් ආයෝජන ශක්තිය වැඩි කිරීමටත් නිෂ්පාදන සහ සේවා වර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය (ණය පහසුකම්) සැපයීමටත්, අවිධිමත් ණය ගනුදෙනු අඩු කිරීමටත්, එමඟින් ඔවුන් ණය බරින් මුදවාලමින් ලාභදායී ආයතනික රටාවක් ඇතිකිරීමේ අරමුණින්, ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය / මහා සංගමය, ප්‍රාදේශිය මට්ටමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 335 ක් හා කලාප මට්ටමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,093 ක් ක්‍රියාත්මක වේ.

2013 අංක 1 දරණ දිවිනැගුම පනතේ 33 (1) ,33 (2), 33 (9) වගන්ති අනුව බැංකු හා බැංකු සමිති අධික්ෂණය හා නියාමනය සඳහා සමාජිකයින් 8 දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් පිහිටුවා ඇත. එම කළමනාකරණ මණ්ඩලය විසින් බැංකු හා බැංකු සමිති වෙත කලින් කල විධාන නිකුත් කරනු ලබයි.

2.1.3.2 **අරමුණු**

1. බැංකු පද්ධතිය සඳහා නව ණය ක්‍රම හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය චක්‍රලේඛ හා මෙහෙයුම් නියෝග නිකුත් කිරීම.
2. අනෙකුත් මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය වන්නා වූ මඟ පෙන්වීම්, උපදෙස් නිකුත් කිරීම.
3. තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන් හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් හා උපදෙස් නිකුත් කිරීම.
4. බැංකු අරමුදල් ආයෝජනය කිරීම හා ප්‍රාදේශීය මට්ටමින් උපදෙස් නිකුත් කිරීම.
5. ක්ෂුද්‍ර මූල්‍ය රක්ෂණ කටයුතු සිදු කිරීම.
6. සියළු බැංකුවල ජාතික මට්ටමින් විමර්ශණ කටයුතු සිදු කිරීම හා ඒ පිළිබඳ උපදෙස් නිකුත් කිරීම.
7. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල අවසාන ගිණුම් සඳහා ලබාදෙන විගණන වාර්තා අනුව අවසන් ගිණුම් සහතික කිරීම හා ලාභ විසර්ජනය සඳහා නියෝග ලබාදීම.
8. බැංකු සඳහා ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සැපයීම හා ණය විශ්ලේෂණ කටයුතු සිදු කිරීම.
9. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සඳහා ඉඩම් පවරා ගැනීම/ මිලට ගැනීම් කටයුතු සහ බැංකු ගොඩනැගිලි ඉදි කිරීම සඳහා අරමුදල් සැපයීම හා වත්කම් කළමනාකරණය.
10. සමෘද්ධි ප්‍රජාමූල කළමනාකරණ මණ්ඩලය රැස් කිරීමට සහාය වීම, කළමනාකරණ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම හා එම නියෝග ක්‍රියාත්මක කිරීම.
11. සියළුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල අධීක්ෂණ, ප්‍රගති පාලනය, පසු විපරම් කිරීම.
12. සමෘද්ධි ප්‍රතිලාභීන්, ප්‍රජාමූල බැංකු සමිති හරහා පිළිගත් ආයතන හා සංවිධාන මඟින් දියත් කරන ව්‍යාපෘති සමඟ සම්බන්ධීකරණය කිරීම.
13. ජීවනෝපාය හා අලෙවි අංශ ක්‍රියාත්මක කරන වැඩසටහන් සඳහා ප්‍රජාමූල බැංකු සමිතිවල නිර්මාණශීලී දායකත්වය ලබාදීමට කටයුතු කිරීම.
14. සමෘද්ධි පනත අනුව (34 වගන්තිය) ස්ථාපිත බැංකු මහා සංගමයේ කටයුතු සඳහා සහාය වීම.
15. සමෘද්ධි බැංකු, සමෘද්ධි බැංකු සමිති, මහා සංගමය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය පරිගණක ජාලගත කිරීමට සහාය වීම.
16. සමෘද්ධි බැංකුවල , සමෘද්ධි බැංකු සමිතිවල නිලධාරීන් හා ප්‍රජා නායකයින් පුහුණු කිරීමට පියවර ගැනීම.

2.1.3.3 බැංකු සාමාජිකත්වය හා කොටස් ප්‍රාග්ධන ප්‍රගතිය

සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් රු.500/- ක කොටසක් මිලදී ගැනීමෙන්, ඔවුනට සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ සාමාජිකත්වය හිමිවේ. ඒ තුළින් ඔවුන් බැංකුවේ කොටස්කරුවන් බවට පත්වේ.


සමෘද්ධි ප්‍රජාමූල බැංකු සාමාජිකත්ව ප්‍රගතිය - (2019-2023)
සංඛ්‍යා සටහන - (VII)

වර්ෂය	ගැහැණු	පිරිමි	එකතුව	පසුගිය වසරට සාපේක්ෂ වර්ධනය	වර්ධනය අනුපාතය %
2019	2,913,912	1,399,106	4,313,018	356,124	9
2020	2,751,341	1,341,176	4,092,517	-220,501	-5.1
2021	2,791,244	1,300,942	4,092,186	-331	-0.008
2022	2,811,900	1,303,200	4,115,100	22,914	0.56
2023	2,854,351	1,312,790	4,167,141	52,041	1.25

2.1.3.4 බැංකු තැන්පතු වැඩසටහන

තැන්පතු (සාමාජික, සමාජික නොවන, සමූහ, ළමා සහ දිරිය මාතා) (2019 – 2023)
සංඛ්‍යා සටහන - (VIII)

වර්ෂය	ගිණුම් සංඛ්‍යාව	ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය	මුදල (රු.මි)	මුදලේ වර්ධනය (රු.මි)
2019	8,892,916	715700	65,498.00	9871.00
2020	8,715,703	(177,213)	70,338.00	4,840.00
2021	8,538,191	(177,512)	72,835.00	2,497.00
2022	9,463,470	925,279	93,765.53	20,930.55
2023	7,531,371	1.932,099	95,508.55	-18,256.98



2.1.3.5 ප්‍රජාමූල බැංකු ණය වැඩසටහන

- සමෘද්ධි සහනාධාරලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් හඳුනාගෙන, ස්වශක්තිය මඟින් දුගී බවින් මිදීමට අවශ්‍ය පරිසරය ගොඩනැංවීමට අවශ්‍ය සුළු මූල්‍යකරණ පහසුකම් සපයාදීම ප්‍රජාමූල බැංකු ණය ක්‍රමය යටතේ සිදුවේ.

- සාමාජිකයින්ගේ ප්‍රාග්ධන අරමුදල් හා ක්ෂණික මුල්‍ය අවශ්‍යතා පිරිමැසීම සඳහා වූ විශේෂ ණය වැඩසටහන් කිහිපයක් හඳුන්වා දී දියත් කර ඇත.

- ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා රු.25,000 සිට රු.1,000,000 දක්වා විවිධ ණය යෝජනා ක්‍රම යටතේ සමෘද්ධි බැංකු මඟින් ණය නිකුත් කෙරේ. ඒ අනුව ජීවනෝපාය සංවර්ධන, වගා, ව්‍යාපාරික පුහුණු වැනි ක්ෂේත්‍රයන් සඳහා මෙන්ම ක්ෂණික ණය අවශ්‍යතා වෙනුවෙන් ද ණය නිකුත් කෙරේ.

- නිවාස, පාරිභෝගික, ආපදා වැනි අවශ්‍යතා වෙනුවෙන් බැංකු ණය පහසුකම් ක්‍රියාත්මක වේ. මේ සඳහා රු.25,000 සිට රු. 500,000 දක්වා උපරිම ණය නිකුත් කෙරේ.

- සමෘද්ධි බැංකු ණය වැඩසටහන මඟින් සාර්ථක වූ ව්‍යවසායකයින්ගේ ප්‍රාග්ධන මූල්‍ය අවශ්‍යතා සපුරාලීමට රු. 500,000 සිට රු.2,000,000 දක්වා ණය සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති මඟින් "ඉසුර" සහ නව සමෘද්ධි ව්‍යවසායකත්ව ණය යෝජනා ක්‍රමය යටතේ ණය නිකුත් කෙරේ.


- ක්ෂණික මුල්‍ය අවශ්‍යතාවලදී ගිනි පොලීකරුවන්ගේ ග්‍රහනයෙන් මිදී ඉතා පහසුවෙන් මුදල් අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට පාරිභෝගික, ආපදා, ස්වශක්ති, සමෘද්ධි අරුණළු, සමෘද්ධි මිතුර ණය යෝජනා ක්‍රම තුලින් සමාජිකයින් සඳහා සහනයක් දී ඇත.

- 2023 වසර අවසන් වන විටදී සාමාජිකයින් 12,309,875 ක් සඳහා රු.මි. 463,599.06 ක මුදලක් සමෘද්ධි බැංකු ණය ලෙස ලබා දී ඇත.

ණය නිකුත් කිරීම (2019 - 2023)

සංඛ්‍යා සටහන - (IX)

වර්ෂය	සංඛ්‍යාව (සමුච්චිත)	සමුච්චිත මුදාහල ණය මුදල (රු.මි.)	වසර තුල ණය නිකුත් කිරීම (රු.මි)
2019	9,562,062	317,915.26	53,396.13
2020	11,790,396	357,496.70	39,581.44
2021	11,669,343	394,546.41	37,049.71
2022	11,959,271	424,906.65	30,360.24
2023	12,309,875	463,599.06	38,692.41




ණය වර්ගීකරණය 2023.12.31 දිනට සමුච්චිත මුදාහල

සංඛ්‍යා සටහන - (X)

	ණය වර්ගය	මුදල (රු.මි)
1	වගා	20,426.73
2	පාරිභෝගික	19,589.56
3	ස්වශක්ති	11,766.82
4	ආපදා	2,148.54
5	ජීවනෝපාය චක්‍රිය	12,480.87
6	ජීවනෝපාය සංවර්ධන	164,681.42
7	සමෘද්ධි සම්පත	68,731.58
8	හදිසි ව්‍යාපාරික ණය	1,899.19
9	දිවිනැගුම අරුණළු	4,467.37
10	රන් ප්‍රදීප	17.37
11	සේවක පාරිභෝගික ණය	1,917.84

	ණය වර්ගය	මුදල (රු.මි)
12	සහන පියවර	5,471.55
13	සමෘද්ධි අභිමාන	716.36
14	උත්සව අත්තිකාරම් ණය	665.59
15	නව සමෘද්ධි ව්‍යවසායකත්ව ණය	2,410.24
16	සමෘද්ධි මිතුරු ණය	183.36
17	සමෘද්ධි සියපත ණය	22349
18	තරුණ ව්‍යවසාය ණය	25.15
19	සමෘද්ධි ලක්ජය ණය	140.76
20	සමෘද්ධි ලක් වාසනා ණය	35.34
	එකතුව	340,124.64

ප්‍රස්ථාර සටහන III - ණය වර්ගීකරණය




2.1.3.6 **ප්‍රජාමූල බැංකු අතිරික්ත අරමුදල් ආයෝජනය (ස්ථිර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්)**

බැංකුවල වත්කම්වලින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමේ අරමුණින් ණය ඉල්ලුම්කරුවන්ට ණය මුදා හැරීමෙන් අනතුරුව අතිරික්ත අරමුදල් ප්‍රජාමූල බැංකු සමිති හරහා භාණ්ඩාගාර චක්‍රලේඛන ප්‍රකාරව රාජ්‍ය බැංකුවල පමණක් ආයෝජනය කිරීමට අවසර ලබාදී ඇත. මේ මඟින් ප්‍රජාමූල බැංකු සමිති මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමද අරමුණ වේ.

සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල අතිරික්ත මුදල් ආයෝජනය කිරීම. (2019 – 2023)

සංඛ්‍යා සටහන - (XI)

වර්ෂය	මුදල(රු.මි)	වර්ධනය(රු.මි)	වර්ධන ප්‍රතිශතය (%)
2019	95173	9231	10%
2020	89,314	(5859)	6.2%
2021	108,233	18,919	21.18%
2022	149,882	41,649	27.79%
2023	168,260	18,378	10.92%



2.1.3.7 **ක්ෂුද්‍ර මූල්‍ය අංශය තුළින් ක්‍රියාත්මක ප්‍රවර්ධන වැඩසටහන්**

2000 වසරේ සිට ස්වයං මූල්‍ය ඒකකයක් ලෙස අංශයේ උපයාගත් පොලී ආදායම් තුලින් විවිධ සංවර්ධන වැඩසටහන් සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය ඔස්සේ අඩු ආදායම්ලාභී ප්‍රජාව ඉලක්ක කර ගනිමින් සිදු කිරීම ක්ෂුද්‍රමූල්‍ය අංශයේ ප්‍රධාන අරමුණ වේ. මේ සඳහා අංශය තුළ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන් පහත පරිදි වේ.

- **අලුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන.**

බැංකුවලට ගොනු වී ඇති ගිණුම් හිමියන් සහ අනෙකුත් ජනතාව සඳහා සෑම වසරකම සිංහල/ හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව සමෘද්ධි බැංකු මඟින් ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් හා අලුත් අවුරුදු උත්සවයක් ජන ක්‍රීඩාවලට මුල් තැන දෙමින් සමෘද්ධි බැංකු 1,093ක් පුරා එකම දිනයක් තුල සාර්ථකව ක්‍රියාත්මක කර, සමෘද්ධි බැංකු නාමය හා සේවාවන් පිළිබඳ ජනතාව වෙත පණිවුඩයක් ගෙනයාමට කටයුතු කරන ලදී. එම කාලය තුල තැන්පත් කරන මුදල් සඳහා ගනුදෙනුකරුවන්ට ප්‍රයෝජනවත් හා වටිනාකමකින් ඉහල තිලිණ ලබාදීම සිදු කරන ලදී. මේ තුලින් අදාල කලාප තුල ජනතාව ඒකරාශී වීමත් ප්‍රජාවගේ සංස්කෘතික හැඟිම් ඔප්නැංවීමටත් මෙය අවස්ථාවක් කර ගැනීමට හැකි විය. තවද, සමෘද්ධි බැංකු කටයුතු හා විශ්වාසය තහවුරු කර, අඩු ආදායම්ලාභීන් ඇතුළු ප්‍රජාව තුල සමෘද්ධි බැංකුවෙහි නාමය ප්‍රචලිත කර, ඔවුන් ආර්ථික/ සමාජීය සවිබලගැන්වීමක් අපේක්ෂා කෙරේ.

- **''රන් ප්‍රදීප'' රන් උකස් ණය සේවාව**

සමෘද්ධි බැංකු සාමාජිකයින් විසින් හදිසි මුදල් අවශ්‍යතාවය වෙනුවෙන් තමා සන්තයේ පවතින රන් භාණ්ඩ උකස් කර මුදල් ලබාගැනීමේදී ඇති වන දුෂ්කරතා මඟ හරවා සහන පොලී මත කඩිනමින් මුදල් අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට පහසුකම් සැලසීම සිදු වේ.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු ආශ්‍රිතව "අරුණළු ක්ෂණික ණය" වැඩසටහන

සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන මඟින් අරුණළු ක්ෂණික ණය වැඩ සටහන හඳුන්වා දීම. දිවයිනපුරා සියළුම ප්‍රජාමුල සංවිධාන හරහා සාමාජිකයින් වෙනුවෙන් ක්‍රියාත්මක වේ. ප්‍රජා මූල සංවිධාන සාමාජිකයන් විසින් ඔවුන්ගේ හදිසි මුදල් අවශ්‍යතා වෙනුවෙන් අවිධිමත් ක්ෂුද්‍රමූල්‍ය ආයතන/ පුද්ගලයින් මඟින් ඉහල පොලි අනුපාතයක් හා විවිධ බැඳීම් මත ලබාගන්නා ණය සඳහා විකල්පයක් ලෙස, සහනදායී හා කෙටිකාලීන ණය මුදල් ලබා ගැනීමට පහසුකම් සැලසීම මෙමඟින් සිදුවේ.

- **පුහුණු කටයුතු**

ප්‍රජාමුල බැංකු ජාලයේ 1,093 ක හා ප්‍රජාමුල බැංකු සමිති 335 හි සමිතිවල සේවය කරන කාර්ය මණ්ඩල සඳහා බැංකු කටයුතු හා අනෙකුත් විෂයන්ට අදාලව පුහුණු කිරීම් ප්‍රජාමුල බැංකු අරමුදල් මඟින් දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය සම්බන්ධීකරණය සිදුකරයි.

ගනුදෙනුකාර ප්‍රජාව වෙත වඩාත් කාර්යක්ෂම ඵලදායී සේවාවක් සැපයීම උදෙසා බැංකු කාර්ය මණ්ඩලය සඳහා දැනුම කුසලතාවය හා යහපත් ආකල්පයන් ප්‍රගුණ කිරීම මෙම ඒකකයේ කාර්ය භාරයයි.

ඒ අනුව බැංකුවේ කටයුතු පිළිබඳ අවබෝධය ලබාදෙන බැංකු කටයුතු හා ගිණුම් ක්‍රියාවලිය පිළිබඳ මූලික පුහුණු පාඨමාලාව සෑම බැංකු නිලධාරියකුටම ලබා දීමට කටයුතු කරයි. මෙයට අමතරව ප්‍රජාමුල බැංකු කටයුතු හා ප්‍රජාමුල බැංකු සමිතියේ ගිණුම් කටයුතු පිළිබඳ නුපුහුණු ප්‍රජාමුල බැංකු/ බැංකු සමිතියේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට කටයුතු කර ඇත.

- **කළමනාකරණ තොරතුරු ඒකකය**

1,093 ක් වූ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල තොරතුරු කළමනාකරණය සිදු කෙරෙන්නේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ කළමනාකරණ තොරුතුරු ඒකකය මඟිනි. ඒ අනුව සෑම සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියක්ම මාසිකව තම බැංකු ප්‍රගතිය, ලබා දී ඇති ආකෘති මඟින් තොරතුරු කළමනාකරණ ඒකකය වෙත වාර්තා කළ යුතු අතර, එම දත්ත සකස් කර සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල පවතින තත්ත්වය විශ්ලේෂණය කර තොරතුරු ඉදිරිපත් කිරීමත්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු ප්‍රගතිය ඇගයීම සඳහා අවශ්‍ය අනුපාත විශ්ලේෂණයන් ගොඩ නැගීම හා ඒ අනුව සමෘද්ධි ප්‍රජාමූල බැංකු ඇගයීම් සිදු කිරීමට සැලසුම් කර ඇත. තවද පරිගණක තාක්ෂණය උපයෝගි කරගෙන සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතියෙහි තොරතුරු ක්ෂුද්‍රමූල්‍ය අංශය වෙත සම්ප්‍රේෂණය කිරීමට කටයුතු කර ඇත.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු පරිගණකගත කිරීමේ කටයුතු සාර්ථක වීමත් සමග මෙම ඒකකය මඟින් තවත් ඵලදායීව හා කාර්යක්ෂම අන්දමින් ප්‍රජාමූල බැංකු පවත්නා තත්ත්වය විශ්ලේෂණය කිරීම හා ඇගයීම් කාර්ය සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. සමස්ත බැංකු පද්ධතිය තිරසාර මූල්‍ය ඒකක බවට පත්කිරීමේ අරමුණ ඇතිව මෙන්ම සේවක අභිප්‍රේරණය අපේක්ෂාවෙන් බැංකු ශ්‍රේණිගත කිරීම හා ඇගයීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. එම වැඩසටහන සෑම වර්ෂයක් පාසාම වැඩිදියුණු කරමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

2.1.3.8 2023 වර්ෂයේ ලභා කරගත් ප්‍රධාන ප්‍රතිඵලයන්

1. කොටස් මුදල් ප්‍රමාණය රු.ද.ල.1,617,593.52 කින් වර්ධනය කර ගැනීම.
2. සමෘද්ධි බැංකුවල සාමාජික සංඛ්‍යාව 52,041 කින් වර්ධනය කර ගැනීම.
3. 2023 වර්ෂය තුල පමණක් රු.ද.ල.38,692.41 ක ණය මුදල් ලබාදීමට හැකියාව ලැබීම.
4. සමෘද්ධි බැංකුවල ලාභදායි බැංකු ප්‍රමාණය පෙර වසරට සාපේක්ෂව බැංකු 969 සිට 1,073 දක්වා වැඩිකර ගත හැකි වීම.
5. සමෘද්ධි බැංකුවල ලාභදායිත්වය රු.බිලියන 22.5 ක් දක්වා වර්ධනය කර ගත හැකි වීම. (විගණනයට යටත්ව)
6. ප්‍රජාමූල සංවිධාන හරහා ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින්ට **"අරුණළු"** ක්ෂණික ණය ක්‍රමයක් හඳුන්වා දෙන ලදි.
7. අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා 6% ක් පොලි ප්‍රතිශතයක් ලබාදිය හැකිවීම.
8. ප්‍රතිමූල්‍ය ණය වැඩසටහන නැවත හඳුන්වාදිය හැකිවීම
9. බැංකු අධික්ෂණ ඒකකය නැවත ස්ථාපිත කල හැකිවීම.
10. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ලියාපදිංචිය අවසන් කිරීම.
11. සියළුම බැංකු සමිති පරිගණක ජාලගත කිරීම සිදු කිරීමට කටයුතු කිරීම.
12. බැංකු ඇගයීමේ ක්‍රමවේදයන් සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම.
13. සමෘද්ධි පනත අනුව ඉලක්ක ලබා දී ඒ අනුව නිලධාරීන් හා ප්‍රතිලාභීන් ඇගයීමට ලක් කිරීම.
14. ලක් ජය, ලක් වාසනා නමින් ණය වර්ග දෙකක් හඳුන්වා දීම.
15. ධනශක්ති, ධනයෝජන ගිණුම් හඳුන්වා දීම තුලින් ඉතුරුම් ප්‍රවර්ධනය කිරීම.

2.1.4 ජීවනෝපාය සංවර්ධන අංශය

2.1.4.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටුදැකීමේ ජාතික මෙහෙවර සිය ප්‍රමුඛතම කාර්යය කරගත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රජාව පුර්ණ සවිබලකරණයකට ලක් කිරීම සඳහා ආර්ථික, සමාජීය, මානසික, දේශපාලනික, සංස්කෘතික, නෛතික හා පාරිසරික යන පුළුල් පරාසය තුළ සිය ක්‍රියාකාරකම් පෙළගස්වා ඇත. ඒ සඳහා දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය තුළ ආර්ථික සවිබලකරණය සඳහා ස්ථාපිත ප්‍රධානතම අංශය වන්නේ ජීවනෝපාය සංවර්ධන අංශයයි.

මෙම අංශයේ මුලික වගකීම වන්නේ සමෘද්ධි වැඩසටහන වටා ගොනු වී ඇති සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල් වල ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා දැනට ඔවුන් නියැලි සිටින ජීවනෝපාය ව්‍යාපෘති හෝ නව ව්‍යාපෘති හඳුනාගෙන එවා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා මුල්‍ය පහසුකම් සැපයීමයි. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා 2023 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන රුපියල් මිලියන 54 ක් වැයකර දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල් වල ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට සැලසුම් සකස් කර තිබුණි. නමුත් රට මුහුණ දී ඇති හා මුල්‍ය හා ආර්ථික අර්බුදයන් හමුවේ අපේක්ෂික ප්‍රතිපාදන නොලැබුන අතර ලැබුණ සීමිත ප්‍රතිපාදන මත වැඩසටහන් සුළු ප්‍රමාණයක් ක්‍රියාත්මක කර ඇත.

එමෙන්ම ආසියානු සංවර්ධන බැංකුවේ මුල්‍යාධාර මත අස්වැසුම ප්‍රතිලාභී පවුල්වල ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත ‘‘ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය’’ මඟින් මුලික කටයුතු කිහිපයක් ක්‍රියාත්මක කර ඇත.

තව ද 2022 වර්ෂයේ ආහාර අර්බුදයට මුහුණපා සිටින සමෘද්ධිලාභී පවුල් වෙනුවෙන් දෙපාර්තමේන්තුව සතු සමාජ ආරක්ෂණ අරමුදල් හරහා ද රු. මි. 19.7 ක මුදල් ප්‍රමාණයක් වැය කර ක්‍රියාත්මක කළ වැඩසටහන අඛණ්ඩව 2023 වර්ෂයේ ද පවත්වා ගෙන යෑමට කටයුතු කරන ලදී. එමෙන් ම වනාතවිල්ලුව කඡු ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම සඳහා කෘෂි නවෝත්පාදක ව්‍යාපෘතියේ රුපියල් මිලියන 9.7 මුල්‍යාධාර පහසුකම් සැපයීමට කටයුතු කර ඇත.

2.1.4.2 භාණ්ඩාගාර ප්‍රතිපාදන හරහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

2023 භාණ්ඩාගාර ප්‍රතිපාදන රුපියල් මිලියන 54 ක් වැය කර ප්‍රතිලාභීන් 1080 ක් සම්බන්ධ කරගෙන ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළත්, රට මුහුණ දුන් ආර්ථික හා මුල්‍ය අර්බුදය නිසා අපේක්ෂිත ප්‍රතිපාදන නොලබුණ අතර, ඒ නිසා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. නමුත් මෙතෙක් සමෘද්ධි හා අඩු අදායම්ලාභී පවුල් ඉලක්ක කර ක්‍රියාත්මක කළ ආර්ථික සවිබල ගැන්වීමේ වැඩසටහන වෙනුවට සමාජ සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් අස්වැසුම ප්‍රතිලාභීන් ලෙස හඳුනාගත් පවුල් ලක්ෂ 12 ක් සවිබල ගැන්වීමේ වගකීම ඍජුවම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා ඇති නිසා ඊට අදාල මුලික කටයුතු කිහිපයක් ලද සීමිත ප්‍රතිපාදන සීමාව තුළ ක්‍රියාත්මක කරන ලදි. ඒ යටතේ කළුතර, පොලොන්නරුව, ගම්පහ, යාපනය, කිලිනොච්චි හා මුලතිව් යන දිස්ත්‍රික්ක වල රාජ්‍ය නිළධාරීන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් වූ අතර ඒ සඳහා වැය කළ මුදල රුපියල් 308,224/- කි.

2.1.4.3 ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය දායකත්වය ඇතිව ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන

"ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය" නමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව යටතේ රුපියල් මිලියන 1000 ක් වැය කිරීමට යෝජිත අතර ඒ යටතේ පවුල් 10000 ක් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමට අපේක්ෂිතය.

මෙම වැඩසටහනේ ද ඉලක්ක කාණ්ඩයම අස්වැසුම ප්‍රතිලාභීන් වන අතර ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු 2023 වර්ෂයේ අවසාන කාර්තුවේ දී සුදානම් කරන ලදි. ඒ යටතේ කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම, අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යාවස්ථාපිත සභාය ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම හා ජාතික තලයේ ක්‍රියාත්මක දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන දැනුවත් කිරීම ඉලක්ක කර වැඩසටහන් 3 ක් පවත්වා ඇත. ඒ සඳහා වැය කර ඇති මුදල රු.130,150/- කි.

2.1.4.4 සමාජ ආරක්ෂණ අරමුදල් හරහා ක්‍රියාත්මක කරන ලද ආහාර සුරක්ෂිතතාව, පෝෂණය හා ආදායම් ප්‍රවර්ධනයට ධාන්‍ය හා අතිරේක භෝග වගාව

2022 වර්ෂයේ රට තුළ මතු වූ ආර්ථික අර්බුදය නිසා ප්‍රජාවගේ ආහාර සුරක්ෂිතතාව බිඳ වැටුණි. එයට පිළියමක් ලෙස ප්‍රජාවගේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරමින් ආදායම් උත්පාදන ඉලක්ක කර තෝරාගත් දිස්ත්‍රික්ක 05 ක පවුල් 1488 ඉලක්ක කර රුපියල් මිලියන 19.7 වැයකර ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි. මෙම ව්‍යාපෘති 2022 වර්ෂයේ අවසාන කාර්තුවේ ආරම්භ කළ අතර එහි ප්‍රතිලාභ ප්‍රජාව විසින් භුක්ති විඳීම සිදුවුයේ 2023 වර්ෂයේ මුල් කාර්තුවේය. මෙම ව්‍යාපෘතියේ සමස්ථ අස්වනු වටිනාකම රුපියල් මිලියන 100 පමණ වේ.

ධාන්‍ය හා අතිරේක භෝග වගාව වෙනුවෙන් පහත සඳහන් දිස්ත්‍රික්ක 05 සඳහා මුදල් වැය කරන ලද අතර, ආහාර සුරක්ෂිතතාවය හා මාසික ආදායම වැඩිදියුණු කිරීමට අදාලව වැඩසටහන අඛණ්ඩව ඉදිරියට ගමන් කරනු ඇත.

සංඛ්‍යා සටහන - (XII)

වැඩසටහන	ව්‍යාපෘතිය	වෙන් කළ මුදල (රු.මි.)		වැය කළ මුදල (රු.මි)	වගා කල අයිතමයන්	ප්‍රමාණය අක්කර	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
ආහාර සුරක්ෂිතතාවය පෝෂණය හා ආදායම් ප්‍රවර්ධනය	ධාන්‍ය හා අතිරේක භෝග වගාව	පොළොන්නරුව	2.86	2.85	මුංඇට, බඩඉරිඟු, උඳු හා රටකජු	100	237
		යාපනය	1.25	1.17	උඳු, කව්පි, කුරක්කන්	42	114
		අම්පාර	9.19	9.19	මිරිස්, බඩ ඉරිඟු, කුරක්කන්	381	441
		මාතලේ	2.27	0.84	කුරක්කන්, කෙසෙල්	19	50
		මොණරාගල	6.93	6.81	බඩඉරිඟු, වන්නි මිරිස්	184	184
		එකතුව	**22.49**	**20.86**		**726**	**1026**

2.1.4.5 සහාය ආයතන සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන්

2018 වර්ෂයේ පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කජු නිෂ්පාදන ගම්මානයක් ආරම්භ කර ඇත. වර්තමානය වන විට එම ව්‍යාපෘතිය ඉතා සාර්ථක මට්ටමින් ක්‍රියාත්මක වන අතර කජු නිෂ්පාදනයේ ගුණාත්මක තත්ත්වය අපනයන වෙළඳපල ඉලක්ක කර පිරි සැකසීම සඳහා සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව මඟින් ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කෘෂි නවීකරණ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 9.7 ක මූල්‍යාධාර සපයා ඇත. එමඟින් පුද්ගලයන් 54 ක් සඳහා රුපියල් මිලියන 8.91 වැය කර ලෙලි කජු එකතු කිරීමේ මධ්‍යස්ථාන 54 ක් ඉදිකර ඇත. කජු සැකසුම් යන්ත්‍ර අලුත් වැඩියා කිරීම සඳහා රුපියල් ලක්ෂ 8 ක් වැය කර ඇත. වර්තමානයේ මෙම ව්‍යාපෘතිය Organic Cashew Limited නමින් සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇති අතර සාර්ථක ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වේ.

2.1.5 ව්‍යවසාය සංවර්ධන අංශය

අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් මට්ටමින් පවත්වා ගනිමින් ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් දිස්ත්‍රික්ක 25 තුළ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

2.1.5.1 අරමුණ

සමෘද්ධිලාභී ව්‍යවසායකයින්ගේ දැනුම, කුසලතා වර්ධනය කිරීම, ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන උසස් ප්‍රමිතියෙන් හා නිමාවකින් යුක්තව සිදු කිරීම, ස්ථාවර වෙළඳපොළක් ඇති කර ගැනීම, දීප ව්‍යාප්තව භාණ්ඩ විකිණීම හා ප්‍රචාරණ, තෘප්තිමත් පාරිභෝගික ප්‍රජාවක් ගොඩනැන්වීම, නිෂ්පාදනයට සාධාරණ මිලක් ලබා ගැනීම හා පරිසර හිතකාමී හරිත රැකියා අවස්ථා සුලභ කිරීම මඟින් ව්‍යවසායකයා ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබල ගැන්වීම තුලින් ජාතික ආර්ථික වර්ධනයට සෘජුව දායකවීම.

2.1.5.2 2023 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

1. සමෘද්ධි **Mini Food City** ජාලය ඇති කිරීම.
2. සමෘද්ධි සුව බොජුන් හල් හා අලෙවි මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
3. සමෘද්ධි සුව බොජුන් හල් හා අලෙවි මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම.
4. සෞභාග්‍යා අලෙවි ප්‍රදර්ශණය පැවැත්වීම.
5. විශේෂ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන.
6. සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන හා සේවා අන්තර්ජාල වෙළඳපොලට ප්‍රවේශ කරවීම (**Online Marketing)**.
7. සමෘද්ධි ව්‍යාපාරික සංගම් පිහිටුවීම.
8. වස විස රහිත ආහාර නිෂ්පාදන සැකසීම පිළිබඳ කාන්තාවන් පුහුණු කිරීම.
9. භාෂා කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන.
10. සමෘද්ධි නිෂ්පාදන හා සේවා සඳහා ප්‍රමිති හා තත්ත්ව සහතික ලබාගැනීම.
11. වෘත්තීය මාර්ගෝපදේශණ හා වෘත්තීය පොල වැඩසටහන.
12. වෙළඳපොල විශ්ලේෂණ වැඩසටහන.

2.1.5.3 සමස්ථ ප්‍රගතිය පිළිබඳ සාරාංශය.

සමෘද්ධි අලෙවි සංවර්ධන වැඩසටහන සඳහා 2023 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 30 ක් වුවත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාරය මඟින් එම ප්‍රතිපාදන ප්‍රමාණය ලබා නොදීම නිසා අපේක්ෂා කරන ලද සියළු වැඩසටහන් ප්‍රමාණය ක්‍රියාත්මක කිරීම අපහසු විය.

අලෙවි සංවර්ධන වැඩසටහනේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය

සංඛ්‍යා සටහන - (XIII)

	වැඩසටහන	වෙන් කළ මුදල (රු:මි)	වියදම (රු:මි)	අරමුදල් මූලාශ්‍රය	ව්‍යාපෘති/ වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
01	සමෘද්ධි Mini Food City ජාලය ඇති කිරීම	5.00	9.7	World Food Program	01	2294 (වෙළඳසැල් හිමියන් 25 සහ අඩු ආදායම්ලාභීන් 2269)
02	සමෘද්ධි සුව බොජුන් හල් හා අලෙවි මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම	5.00	-	-	-	-
03	සමෘද්ධි සුව බොජුන් හල් හා අලෙවි මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම	9.00	0.5	භාණ්ඩාගාර ප්‍රතිපාදන	01	150
04	සෞභාග්‍යා අලෙවි ප්‍රදර්ශණය පැවැත්වීම	1.00	1.0	ප්‍රාදේශීය සංවිධාන අරමුදල්	606	22,850
05	විශේෂ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන	5.00	18.97	YouLead Project	278	11,155
06	සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන හා සේවා අන්තර්ජාල වෙළඳපොලට ප්‍රවේශ කරවීම	1.00	1.8	World Food Program	01	-
07	සමෘද්ධි ව්‍යාපාරික සංගම් පිහිටුවීම	1.00	-	-	25	5,000
08	වස විස රහිත ආහාර නිෂ්පාදන සැකසීම පිළිබඳ කාන්තාවන් පුහුණු කිරීම	1.00	0.98	UNDP Fund/ සමෘද්ධි සුව බොජුන් අරමුදල	01	20
09	භාෂා කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන	1.50	4.73	ප්‍රාදේශීය සංවිධාන ඇමුදල හා ප්‍රතිලාභීන්ගේ දායකත්වය	19	835
10	සමෘද්ධි නිෂ්පාදන හා සේවා සඳහා ප්‍රමිති හා තත්ත්ව සහතික ලබාගැනීම	0.50	-	-	03	415
11	වෘත්තීය මාර්ගෝපදේශණ හා වෘත්තීය පොල වැඩසටහන	-	7.00	YouLead Project	25	8,000
12	වෙළඳපොල විශ්ලේෂණ වැඩසටහන	-	9.5	Asian Development Bank	25	341,700
එකතුව		**30.00**	**54.18**		**985**	**392,419**

2.1.6 **සමාජ සංවර්ධන හා පරිසර අංශය**

2.1.6.1 සමාජ සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලාංකික සමස්ථ ප්‍රජාව අතරින් විශේෂයෙන් තෝරාගත් සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභී පවුල්වල කායික,මානසික,සංස්කෘතික අධ්‍යාත්මික හා ආර්ථික වශයෙන් සවිබලගැන්වීමත් ඔවුන් හා අනෙකුත් සමස්ථ ප්‍රජාව තුල ඇති ධනාත්මක සිතිවිලි හා දැනුම, කුසලතා, ආකල්ප තවදුරටත් සංවර්ධනය කර එම මුළු මහත් ශ්‍රී ලාංකික ප්‍රජාව ලෝකයේ දියුණු රටවල් අතරට ගෙන ඒමට මනා අවබෝධයෙන් කටයුතු කිරීමට දිරිගැන්වීම හා ළමා, තරුණ, වැඩිහිටි මෙන්ම වැන්දඹු, ආබාධිත හා විසිරි පවුල්වල සාමාජිකයන් හට සතුටින් ජීවත්වීමට හැකි පරිසරයක් ඇති කිරීමට කටයුතු කිරීම සමාජ සංවර්ධන අංශයේ කාර්යභාරය වේ.

අරමුණු-

- ප්‍රධාන වශයෙන් නිවාස නොමැති සමෘද්ධි හා අඩු ආදායම්ලාභී ප්‍රජාවගෙන් තෝරාගත් නිවාස නොමැති පවුල් වෙත නිවාස තනා දීම.
- මත් හා දුම්වැටිවලට ඇබ්බැහිවී ඇති සාමාජිකයන් සිටින පවුල් සවිබලගැන්වීමට වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ඔවුන් මතින් නිදහස් කිරීමට කටයුතු කිරීම හා සුභසාධනය ඇති කිරීම
- දිවයින පුරා විසිරි සිටින වයස අවුරුදු 7. -18 සීමාවට අයත් දරුවන් හඳුනාගෙන ඔවුන් ළමා සමාජවලට ගොනු කර කාණ්ඩායම් ගතකර ඔවුන්ගේ සංස්කෘතික හා සාහිත්‍ය හැකියාවන් ඉස්මතු කිරීම, නායකත්ව හැකියාවන් වර්ධනය කිරීම, ජය පරාජය විඳගැනීම හා සුරක්ෂිතභාවය තහවුරු කිරීම
- අධ්‍යාපන තරඟකාරිත්වය හා නූතන තාක්ෂණ දියුණුවේ ඇති වී ඇති විවිධ මෙවලම්වලට (පරිගණක, දුරකථන) පෙළඹවීම නිසා පොත්පත් පරිශීලනයෙන් ඈත්ව ඇති ළමා පරපුර පොතපත කියවීමට පෙළඹවීම හා ඔවුන්ගේ පරිකල්පනය අවධි කිරීම සඳහා පුස්තකාල ආරම්භ කිරීම හා ඒ සඳහා සංස්කෘතික වැඩසටහන් ,තරඟ,නාට්‍ය වැනි නිර්මාන එළි දැක්වීමට අවස්ථාව සපයාදීම
- ප්‍රජාවගේ මනෝ සමාජීය ගැටළු හඳුනාගෙන එවා අවම කිරීම සඳහා සුදුසු වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කිරීම හා ඔවුන්ගේ සමාජීය ජීවිතයේ ඵලදායිතාවය සහතික කිරීම.
- සමාජයෙන් තුරන්වෙමින් පවතින අනෙකාට ගරු කිරීමේ හැදියාව හා ආකල්ප සංවර්ධනය සඳහා ප්‍රජාව පුහුණු කිරීම. වැඩිහිටියන්ට ගරු කිරීම, මව පියා සහෝදර සහෝදරියන් පිළිබඳව හා ඔවුනගේ ආරක්ෂාව පිළිබඳව තම පවුල තුලම වගකීම දැරීමට සියළු සාමාජිකයන්ගේ සහභාගිත්වය ඇති කිරීමට දැනුවත් කිරීම
- සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය භාවිතා කිරීමට ජනතාව පෙළඹවීම.
- ඉහත වැඩසටහන නිසි වේලාවට ඉලක්කගතව ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිඵල ඇගයීම
- අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ සනීපාරක්ෂක පහසුකම් සලසාදීම.
- අඩු ආදායම්ලාභීන්ගේ 5 වසර ශිෂ්‍යත්ව දරුවන් සඳහා ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහන් හා දරුවන්ලේ මානසික සංවර්ධනය උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දරුවන්ගේ සාක්ෂර හැකියාව ප්‍රවර්ධනය කිරීම.

2.1.6.1.1 ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

- **සමෘද්ධි ප්‍රතිලාභී හා අඩු ආදායම්ලාභී පවුල් නගා සිටුවීම සඳහා කායික මානසික සෞඛ්‍ය හා ආර්ථික වශයෙන් බලාත්මක කිරීමේ වැඩසටහන**

ලෝකය පුරා පැතිරී පැවතුනු කොවිඩ් 19 වසංගතය මෙන්ම ස්වභාවික ආපදා මුළු ලොව තුළම දේශපාලනික ගැටුම් මතවාද මෙන්ම යුධ වාතාවරණයන් හමුවේ ශ්‍රී ලංකාව තුළ සමෘද්ධි හා අඩු ආදායම්ලාභී ප්‍රජාව කායික, මානසික, සෞඛ්‍ය, ආර්ථික වශයෙන්ද පරිහානියට පත්ව ඇත. සතුටු පවුල් ඇතිකර නිසි වයස් වලට අනුව නිසි අධ්‍යාපන අවශ්‍යතාවයෙන් ලබා දී සෞඛ්‍ය සම්පන්න ලෙස ජීවිත සකසා ගැනීම හා කාලය කළමනාකරණය කර ආර්ථික වර්ධනය ඇති කර ගෘහ කලමනාකරණය පිළිබඳව දැනුවත් හා සමාජයේ සවිබලගැන්වූ පවුල් බවට හා සහනාධාර මානසිකත්වයෙන් ඇත් කර තම හැකියාවන් දිරිමත් කළ ජනතාවක් ගොඩනැඟීමට දැනුම කුසලතා ආකල්ප දියුණු සමාජයක් වශයෙන් මුළු මහත් ප්‍රජාව දිරිගැන්වීම මෙම වැඩසටහනෙහි අරමුණ වේ.

- **ජාත්‍යන්තර දින වැඩසටහන් - මාර්තු 08 ජාත්‍යන්තර කාන්තා දින**

ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කාන්තාවන් සවිබලගැන්වීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ගර්භනී කාන්තාවන් සඳහා සෞඛ්‍ය සායන පැවැත්වීම. සිගරට් වලින් තම ස්වාමිපුරුෂයා මුදා ගැනීම සඳහා කාන්තාව දැනුවත්ව සිටිය යුතු අයුරු පිළිබඳ ආකල්ප සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. කාන්තාවන්ගේ ව්‍යවසාය හැකියාවන් දියුණු කිරීම සඳහා පුහුණු, දැනුවත්කිරීම්, ක්ෂේත්‍ර චාරිකා හා දැනුම ,ආකල්ප, කුසලතා සංවර්ධන වැඩමුළු පැවැත්වීම හා පවුල තුල ගෘහ කලමණාකරණය, මුළුතැන්ගෙය කලමනාකරණය, දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳව දැනුවත්භාවය ඇතිකිරීම, සතුටු පවුල තුල බිරිඳගේ භූමිකාව වැනි විවිධ දැනුවත් කිරීම් මඟින් කාන්තාවන්ගේ පෞරුෂ වර්ධනය ඇතිකිරීමේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

- **මැයි 31 ජත්‍යන්තර දුම්වැටි හා මත්ද්‍රව්‍ය විරෝධී දිනය**

2023 වර්ෂයේ මැයි 31 ජත්‍යන්තර දුම්වැටි හා මත්ද්‍රව්‍ය විරෝධී දිනය නිමිති කරගෙන සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි කොඩි,ස්ටිකර්, පෝස්ටර් ,කැට ලේබල් මුද්‍රණය කර බෙදාහැර ඇත. දුම්වැටි හා මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව හා ඉන් ප්‍රජාව මුදා ගැනීම සඳහා වූ සුවිශේෂී වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම මෙහි මූලික අරමුණ වේ. මීට සමගාමීව පැවැත්වූ කොඩි පැළඳවීමේ වැඩසටහන යටතේ 2023 වර්ෂයේ ලබාගත් සමස්ථ මුදල රු.මි.230.5 ක් වන අතර කොඩි,ස්ටිකර්, පෝස්ටර් ,කැට ලේබල් මුද්‍රණය හා බෙදා හැරීම් කටයුතු සඳහා රු.මි.6.912 ක් වියදම් විය. මෙම කොඩි වැඩසටහන තුලින් ඒකරාශී කර ගන්නා ලද මුදල් වලින් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් වශයෙන් ප්‍රජාව මතින් හා දුම්වැටියෙන් මුදා ගැනීම සඳහා වූ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- **සැප්තැම්බර් 08 ජාත්‍යන්තර සාක්ෂරතා දිනය**

වර්තමාන සමාජයේ වෙසෙන ප්‍රජාවගේ මානසික මට්ටම උසස් කිරීම හා සාමාජීය වශයෙන් සදාචාර සම්පන්න බව ඇති කිරීමටත් කායිකව දුර්වලව ඇති අඩු ආදායම්ලාභී සමාජීය ජන සමූහය සෞඛ්‍ය සම්පන්නව නඟා සිටුවීමටත් ඉහත ජාත්‍යන්තර දින මූලික කරගනිමින් විවිධ වූ වැඩසටහන් සමස්ථ

දිවයිනම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සමෘද්ධි සමාජ සංවර්ධන අංශය මඟින් සිදු කරනු ලබයි.
මෙහිදී අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ ලිවීමේ කියවීමේ හැකියාව වර්ධනය කිරීම උදෙසා ජාත්‍යන්තර සාක්ෂරතා දිනය යටතේ පාසල් යන වයසේ පාසල් නොයන දරුවන් පාසල් ගත කිරීම, පෙර පාසල් දරුවන් සඳහා කොළ කැඳ ලබා දීම, පාසල් දරුවන් සඳහා අභ්‍යාස පොත් ලබාදීම, 5 වසර ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහන් වැනි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- **ඔක්තෝම්බර් 01 ලෝක ළමා හා වැඩිහිටි දිනය**

මෙහිදී සංස්කෘතික වැඩසටහන්, සෞඛ්‍ය සම්පන්න ආහාර වේල් පරිත්‍යාග කිරීම්, ඇඳුම් පැළඳුම් ලබාදීම, වැඩිහිටි වන්දනා, විවිධ ආගමික වැඩසටහන්, වෛද්‍ය සායන සඳහා යොමු කිරීම් වැනි කටයුතු තුලින් වැඩිහිටි ප්‍රජාව සතුටු සිතින් තැබීම මඟින් ඔවුනගේ සෞඛ්‍ය මට්ටම ද යහපත් කිරීම, වැඩිහිටි සුභසාධන වැඩසටහන් පැවැත්වීම හා ළමුන් සඳහා පාසල් උපකරණ ලබා දීම, විවිධ රසවින්දනාත්මක වැඩසටහන් පැවැත්වීම, අධ්‍යාපනික වැඩසටහන් මෙන්ම විවිධ ස්ථාන නැරඹීමට අවස්ථාව සලසා දීම, අත්දැකීම් හුවමාරු වැනි විවිධ වූ වැඩසටහන් මෙම දිනයට අදාලව සිදුකරන ලදී. ප්‍රධාන වශයෙන් සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය තරඟාවලිය කලාප, ප්‍රාදේශීය,දිස්ත්‍රික්,වශයෙන් පැවැත්වීම. ප්‍රාදේශීය, දිස්ත්‍රික් තරඟ වලින් ජයග්‍රහනය කළ දරුවන් සඳහා ත්‍යාග හා සහතික පත් ලබා දීම, දරුවන්ගේ කායික මෙන්ම මානසික සුවය ලබාදීම සඳහා මෙම වැඩසටහන් විශාල පිටුවහලක් වූ අතර සැඟවී ඇති දක්ෂතාවයන් එළිදක්වා ඒ තුලින් ඔවුන් අගය කිරීමක් ද මේ තුලින් සිදුකරනු ඇත.

- **5 වසර ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහන**

වර්තමානයේ දරුවන් මානසිකව ඉතා දුර්වලතාවයෙන් පෙළෙමින් සිටින බැවින් සමෘද්ධි සමාජ සංවර්ධන අංශය මේ සඳහා විශේෂ වැඩසටහනක් ආරම්භ කරන ලදී. 5 වසර ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් පෙරහුරු වැඩසටහනක් මුළු දිවයිනම ආවරණය වන පරිදි සමාජ සංවර්ධන පවුලේ සියළු සාමාජිකයන් එක්ව ප්‍රජාවගේ දායකත්වය ඇතිව සාර්ථකව පවත්වන ලදී.

- **OUR FATHERS, OUR HEROSE EMPOWERING OUR MEN PROGRAM**

අප සමාජයේ පියවරුන්ගේ භූමිකාව තම පවුලෙන් ගිලිහී යමින් පවතින මෙවන් වකවානුවක ඔවුන් පවුල තුල විශ්වාසවන්තම ආරක්ෂකයා මෙන්ම ආදරණීයයා ලෙස නැවතත් පවුල වෙත සම්බන්ධීකරණය කිරීම සඳහා වගකීම් දැරීම, පවුල තුල ඒ සඳහා විශ්වාසය රැකගැනීමේ ප්‍රධාන අවශ්‍යතාවය, පවුලේ ආරක්ෂාව සඳහා අවබෝධය ඇතිකිරීම, පවුලේ සාමාජිකයන් අතර ආදරය බෙදා ගැනීමේ දී පවුල තුල ඇතිවන සහයෝගය, එම කරුණු හේතුවෙන් පියා පවුලේ ප්‍රධානියා මෙන් ම වීරයා, එනම් සැමගේ ආරක්ෂකයා ලෙස සමාජ ගත කිරීම මෙම වැඩසටහනෙහි අරමුණ වේ.

- **පිවිතුරු සයුරක් වැඩසටහන**

ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මූලිකව දියත් කළ මෙම වැඩසටහන පරිසර හානිය වලක්වා ගැනීමට මහත් රුකුලක් විය. MV PERL X-PRES නෞකාව නිසා ඇතිවූ පාරිසරික හානිය පාලනය කිරීම සඳහා පිවිතුරු සයුරක් වැඩසටහන ආරම්භ කරන ලදී. කොළඹ, ගම්පහ, ගාල්ල, කළුතර, යාපනය දිස්ත්‍රික්ක සඳහා සමෘද්ධි ප්‍රතිලාභීන් 18 දෙනෙකු පමණ සහභාගි වී ඇති අතර සමුද්‍රීය ආරක්ෂණ අධිකාරියේ අනුග්‍රහයෙන් සොයාගත් පෞද්ගලික ආයතන මූල්‍ය දායකත්වය මත සමෘද්ධි බැංකු හරහා සහභාගිවන්නන් සඳහා දීමනා ලබාදීම ද සිදුකෙරිණි.

- **ලෝක ආහාර වැඩසටහන**

සමෘද්ධිලාභී පවුල්වල සාමාජිකයන් 4 ක් හෝ ඊට වැඩි ඉහල බලපෑමට ලක් වූ පවුල් වෙනුවෙන් හා ගර්භනී මව්වරුන්, කිරිදෙන මව්වරුන්, ආබාධිත පවුල්වලට මුල් තැන දෙමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

තෝරාගනු ලබන දිස්ත්‍රික්ක : ගාල්ල, මොණරාගල, මුලතිව්, නුවරඑළිය, අම්පාර, යාපනය, මන්නාරම, බදුල්ල

2023 වර්ෂයේ පවුල් 4,715කට රු.22,500/= බැගින් රු.106,087,500/= ක් ලබා දෙන ලදී.

- **දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම්**

සමෘද්ධි සමාජ සංවර්ධන වැඩසටහන මුළු දිවයිනම ආවරණය වන පරිදි පවත්වන වැඩසටහනක් බැවින් මූලිකවම අඩු ආදායම්ලාභීන්ගේ ආර්ථික හා සුභසාධන අවශ්‍යතා ඉටුකරමින් පවතින අතර ඔවුන් සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ආකාරය සමස්ථ නිලධාරීන්ට අවබෝධ කරවීම මෙම ප්‍රගති සමාලෝචන වැඩසටහන් මඟින් සිදු කරනු ලබයි.

❖ සමස්ථ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වසරේ භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලැබුණු අතර නොයෙකුත් රාජ්‍ය නොවන ආයතන, පරිත්‍යාගශීලීන්ගෙන් හා ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන,අරමුදල් යොදාගෙන සමස්ථ වැඩසටහන ක්‍රියාත්මක කර ඇත . එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඇමුණුම 01 හි දක්වා ඇත.

භාණ්ඩාගාර නොවන ප්‍රතිපාදන හා වෙනත් අරමුදල් සමාජ සංවර්ධන වැඩසටහනේ
2023.01.01 සිට 2023.12.31 දිනට සමස්ථ ප්‍රගතිය- සංඛ්‍යා සටහන - (XIV)

අනු අංකය	දිස්ත්‍රික්කය	1			2			3			4			5			6			7			8			9			මුළු		
		වැඩසටහන් සංඛ්‍යාව	පුද්ගල සංඛ්‍යාව	වැය ඇස්තමේන්තු රු...	වැඩසටහන් සංඛ්‍යාව	පුද්ගල සංඛ්‍යාව	වැය ඇස්තමේන්තු රු.	වැඩසටහන් සංඛ්‍යාව	පුද්ගල සංඛ්‍යාව	වැය ඇස්තමේන්තු රු.	වැඩසටහන් සංඛ්‍යාව	පුද්ගල සංඛ්‍යාව	වැය ඇස්තමේන්තු රු.	වැඩසටහන් සංඛ්‍යාව	පුද්ගල සංඛ්‍යාව	වැය ඇස්තමේන්තු රු...	වැඩසටහන් සංඛ්‍යාව	පුද්ගල සංඛ්‍යාව	වැය ඇස්තමේන්තු රු...	වැඩසටහන් සංඛ්‍යාව	පුද්ගල සංඛ්‍යාව	වැය ඇස්තමේන්තු රු	වැඩසටහන් සංඛ්‍යාව	පුද්ගල සංඛ්‍යාව	වැය ඇස්තමේන්තු රු.	වැඩසටහන් සංඛ්‍යාව	පුද්ගල සංඛ්‍යාව	වැය ඇස්තමේන්තු රු...	වැඩසටහන් සංඛ්‍යාව	පුද්ගල සංඛ්‍යාව	වැය ඇස්තමේන්තු රු...
1	කොළඹ	31	979	0	31	1266	0.36	19	605	0.32	12	430	0.94	27	1400		3	220	0.005	3	220	0.005	13	650	0.32				114	4590	0.69
2	ගම්පහ	137	12970	1.21	258	133760	2	279	43727	1	1	5	0.007	63	3211	0.25	2	160	0	103	4096	5	13	524	0	811	193,100	11	42	1511	21.22
3	කළුතර	985	42675	4.2601	410	15160	2.02	92	5375	0.4065	57	1871	0.275	49	1221	0.014	3	120	0	33	494	0.1	2	132	0				1631	67048	7.07
4	මහනුවර	391	16618	0.30	255	9965	0.58	333	11034	0.41	23	1054	0.04	52	3909	0.21	24	2195	0.01	26	661	0.6	3	160	0.21				1107	0.04	2.36
5	මාතලේ	101	6473	0.06	91	3398	0.27	191	10247	0.15	32	1934	0.002	50	1130	0.04	16	6240	0.012	21	1005	0.34	5	166	0	507	30601	0.46	64	3068	1.33
6	නුවරඑළිය	35	1697	0.3835	22	4226	0.51	218	17370	0.8479				3	23	0.004	1	80	0.005	11	581	0.78	3	25	0				295	12277	2.53
7	ගාල්ල	866	50947	1.68	465	25367	2.93	258	22897	6.73	0	0	0	51	1614	0.11	28	2462	0.18	39	2346	3.22	4	156	0.007	483	42063	4.2	2194	147852	19.06
8	මාතර	123	6800	0.5114	129	5343	0.76	152	5929	0.4057	2	9	0.018	23	1259	0.097	3	110	0.0095	84	956	0.957	4	156	0.081				540	20963	2.84
9	හම්බන්තොට	484	19827	0.20	189	9057	1.78	271	17835	0.66	150	8996	0.1	19	549	0.01	6	1012	0.06	8	298	0.009	71	8790	0.07				1198	66364	2.89
10	යාපනය	2	140		20	1291	0.01	1	81	0.005	32	824								4	126	0.24							--	--	0.26
11	මන්නාරම	26	1544	0.018	38	1493	0.06	85	4912	0.15	25	1657	0	26	611	0.018	14	6010	0.01	7	335	0.052	0	0	0				219	331712	0.31
12	වව්නියාව																														0.00
13	මුලතිව්																												8	397	0
14	කිලිනොච්චිය				4	202	0.05																						4	202	0.05
15	මඩකලපුව	24	1017		4	133					246	8103		1	75					1	120	0.01							276	9448	0.01
16	අම්පාර	1160	65721	0.83	2141	46956	2.32	1112	22056	5.02	458	44677	0.26	288	5346	0.25	68	1530	1.14	162	8154	4.47	167	3573	0.09				5556	198013	14.38
17	ත්‍රිකුණාමලය	647	34.685		420	14.324		218	9414		38	3158		13	326					2249	2249		16	229					3601	64385	0.00
18	කුරුණෑගල	56	1582	0.001	32	974	0	38	70	0.0001	0	0	0	4	434	0	0	0	0	2	24	0	52	0	1.52				70	1856	1.52
19	පුත්තලම	434	23658	1.14	292	18119	4.02	725	29898	2.56	12	634	0.001	112	3414	0.25	0	0	0	71	7681	5.82	29	1278	0.23				1673	81082	14.02
20	අනුරාධපුරය	213	12139	0.20	115	10315	0.4	92	12130	5.93	6	454	0.495	17	541	0.06	101	569	0.06	50	624	1.09	17	442	0.06				497	19288	8.29
21	පොළොන්නරුව	98	16225	0	106	14821	0	359	19032	0	4	4	0	70	4912	0	17	135	0	22	1987	0	7	265	0				683	57674	0
22	බදුල්ල	40	2003	0.01	55020	787	0.12	71	5015	0.058	2	160	0	13	598	0.04	6	503	0.03	14	382	0.18	18	1621	0				99	4740	0.434
23	මොණරාගල	177	5151	0.083	119	3885	0.92	29	2009	0.174	4	284	0	15	470	0.02	1	50	0	11	1980	3	11	75	0.065				367	13904	4.27
24	රත්නපුරය	236	12047	2.8	292	20774	3.49	281	23820	1.77	25	961	0.02	16	551	0.01	1	107	0	27	198	0.4	2	10	0.01				187	13193	8.50
25	කෑගල්ල	223	6718	0.00	144	10971	0.43	44	1186											39	2778	5.2	0	0	0				450	21653	5.63
	එකතුව	6489	306966	13.69	60566	337011	23	4570	220310	27	1129	75215	2.158	822	26983	1.38	289	21123	1.5245	2987	37295	31.75	411	17078	2.80	1,801	265,764	15.34	20875	1141220	117.66

1 මත්ද්‍රව්‍ය හා දුම්කොළ නිවාරණය, ගෘහ කළමනාකරණ හ සතුටු පවුල් වැඩසටහන.

2 සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය වැඩසටහන

3 ජාත්‍යන්තර දිනයන්ට සමගාමීව සමෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

4 සනීපාරක්ෂක පහසුකම් සැපයීම් වැඩසටහන

5 නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන

6 ආදර්ශ ගම්මාන 25 නිර්මාණය කිරීම

7 පළමු වසරේ සිට 05 වසර දක්වා පාසැල් දරුවන් සඳහා අභ්‍යාස පොත් ලබාදීමේ වැඩසටහන

8 ප්‍රගති සමාලෝචන වැඩමුළුව පැවැත්වීම

9 වෙනත්

2.1.6.2 නිවාස ලොතරැයි වැඩසටහන

2.1.6.2.1 හැඳින්වීම

ව්‍යවසාය සංවර්ධන අංශය හා සමාජ සංවර්ධන අංශය මඟින් 2023 වසරේ දී ප්‍රධාන වැඩසටහන් 02 ක් ලෙස ක්‍රියාත්මක කරන ලදී.

1. සමෘද්ධි නිවාස ලොතරැයි වැඩසටහන
2. සමෘද්ධි විශේෂ නිවාස වැඩසටහන

1. **සමෘද්ධි නිවාස ලොතරැයි වැඩසටහන**

2013 අංක 01 දරණ දිවිනැගුම පනතේ 45 වන වගන්තිය මඟින් සලසා ඇති ප්‍රතිපාදන මඟින් 95 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරී පනත යටතේ ක්‍රියාත්මක කරන ලද නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල පහත සඳහන් රෙගුලාසි අනුව ක්‍රියාත්මක කොට නිවාස සංවර්ධන ලොතරැයි දිණුම් ඇදීම පවත්වාගෙන යනු ඇත.

සෑම සමෘද්ධි ප්‍රතිලාභී පවුලක් සඳහාම ස්ථීර නිවසක හිමිකම ලබාදීමේ අරමුනින් සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි භාරකාර අරමුදල පවත්වාගෙන යනු ලැබේ.

මෙම අරමුදල ගොඩනංවා ඇත්තේ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වලට ලබාදෙනු ලබන සහනාධාර මුදලින් මාසිකව රු. 100/-ක මුදලක් අරමුදලට බැර කිරීමෙනි. සමෘද්ධි නිවාස ලොතරැයි භාරකාර අරමුදල රෙගුලාසි මාලාවකට අනුකූලව 2002.03.07 දිනැතිව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් අනුමත කරන ලද භාරකාර මණ්ඩලයක් මඟින් පාලනය වේ.

එම නිලධාරී මණ්ඩලය පහත පරිදි වේ.

- විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්
- විෂයභාර අමාත්‍යාංශයේ තවත් එක් නියෝජිතයෙක්
- විෂයභාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
- මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක්
- දෙපාර්තමේන්තුවේ සහනාධාර විෂයයභාර අධ්‍යක්ෂවරයා
- සමෘද්ධි කළමනාකරුවන්ගේ සංගමයේ නියෝජිතයෙක්
- සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සංගමයේ නියෝජිතයෙක්

සමෘද්ධි නිවාස ලොතරැයි දිණුම් ඇදීම

ඉලක්ක

01. සෑම සමෘද්ධි ප්‍රතිලාභී පවුලක්ම සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි දිණුම් ඇදීමේ වැඩසටහනට දායක කර ගැනීම.

02. සෑම මසකම සමෘද්ධි ලොතරැයි දිණුම් ඇදීමක් සිදුකොට ප්‍රතිලාභී පවුල් 335ක් සඳහා රු. ලක්ෂ 2 බැගින් නිවාස ත්‍යාග 335ක් ලබා දෙමින් වාර්ෂිකව පවුල් 4,020කගේ නිවාස ප්‍රශ්ණය විසඳීම තුළින් ප්‍රතිලාභී පවුල්වල ස්ථීර නිවාස ප්‍රශ්ණයට තිරසාර විසඳුමක් ලබාදීම.

03. මාසිකව පිරිනමන නිවාස දිණුම් 335 ලබා දීමෙන් පසු ඉතිරි වන යම් ශේෂයක් වේ නම් ඒවා මෙම අරමුදලේ පරමාර්ථ ඉටුවන ආකාරයට යොදා ගැනීම, විශේෂ නිවාස ලබාදීම හා දේශීය මුදල් වෙළඳපලේ වඩාත් ඵලදායී ලෙස ආයෝජනය තුලින් ලැබෙන ආදායම යලිත් මෙම අරමුදලේ පරමාර්ථ ඉටුවන ආකාරයට යොදා ගැනීම

පරමාර්ථ

01. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල සුභසාධනය වැඩි කිරීම සඳහා ඔවුන්ගේ තාවකාලික නිවාස ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබාදීම.

02. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල තොරතුරු ඇතුලත් දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාම.

03. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ස්ථිර නිවාස ප්‍රශ්ණය විසඳීම තුළින් ඔවුන් ආර්ථික සමාජීය අධ්‍යාපනික හා සංස්කෘතිකමය වශයෙන් ශක්තිමත් කිරීම සහ ඔවුන්ගේ අධ්‍යාත්මික ගුණ වගාවන් දියුණු කිරීම.

04. ජයග්‍රාහී ප්‍රතිලාභියා ස්ථිර නිවසකට හිමිකම් කියන අවස්ථාවලදී ප්‍රතිලාභියාගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීම සඳහා සුදුසු ව්‍යාපෘතිවලට යොමු කිරීම.

05. අසරණභාවයට පත් නිවසක් අහිමි ප්‍රතිලාභීන් සඳහා විශේෂ නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

2023 වසරේ දිස්ත්‍රික් මට්ටමින් නිවාස ඉදිකිරීම සඳහා සෑම මාසයකම ප්‍රතිලාභීන් 335ක් මාසිකව දිණුම්වාර ක්‍රියාත්මක කිරීමෙන් තෝරාගන්නා ලදී. ඒ අනුව අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මකවීම හේතුවෙන් 2023 ජනවාරි සිට ජුනි දක්වා ප්‍රතිලාභීන් 2010ක් නිවාස ඉදිකිරීම සඳහා තෝරාගන්නා ලද අතර එක් නිවසක් සඳහා රු. 200,000/- ක මුදලක් ලබාදෙන ලදී. (පහත වගුව අනුව එක් එක් දිස්ත්‍රික්ක සඳහා නිවාස ඉදිකිරීම සඳහා මුදල් නිදහස් කර ඇත.)

2023 ජනවාරි සිට ජුනි දක්වා ජයග්‍රාහී තොරතුරු

සංඛ්‍යා සටහන - (XV)

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොට්ඨාස ගණන	ජයග්‍රාහී ලොතරැයි ගණන	මුදල රු.
1	අම්පාර	20	120	24,000,000.00
2	අනුරාධපුර	22	132	26,400,000.00
3	බදුල්ල	15	90	18,000,000.00
4	මඩකලපුව	14	84	16,800,000.00
5	කොළඹ	13	78	15,600,000.00
6	ගාල්ල	22	132	26,400,000.00
7	ගම්පහ	13	78	15,600,000.00
8	හම්බන්තොට	12	72	14,400,000.00
9	කළුතර	14	84	16,800,000.00
10	මහනුවර	20	120	24,000,000.00
11	කෑගල්ල	11	66	13,200,000.00
12	කුරුණෑගල	30	180	36,000,000.00
13	මාතලේ	11	66	13,200,000.00
14	මාතර	16	96	19,200,000.00
15	මොනරාගල	11	66	13,200,000.00

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොං. ගණන	ජනග්‍රාහී ලොතරැයි ගණන	මුදල රු.
16	නුවර එළිය	5	30	6,000,000.00
17	පොලොන්නරුව	7	42	8,400,000.00
18	පුත්තලම	16	96	19,200,000.00
19	රත්නපුර	18	108	21,600,000.00
20	ත්‍රිකුණාමලය	11	66	13,200,000.00
21	වවුනියාව	4	24	4,800,000.00
22	යාපනය	15	90	18,000,000.00
23	කිලිනොච්චිය	4	24	4,800,000.00
24	මුලතිවු	6	36	7,200,000.00
25	මන්නාරම	5	30	6,000,000.00
එකතුව		335	2010	402,000,000.00

02. සමෘද්ධි විශේෂ නිවාස වැඩසටහන

නිවාස ත්‍යාග ලබාදීමෙන් පසු අරමුදලේ ඉතිරිවන යම් ශේෂයක් වේ නම් ඒවා මෙම අරමුදලේ පරමාර්ථ ඉටුවන ආකාරයට වැඩි දුරටත් යොදා ගැනීමට සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි භාරකාර අරමුදල් මණ්ඩලයට බලය ඇත්තේය.

ඒ අනුව පහත වැඩසටහන් 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කර ඇත.

1. රු. 250,000/- බැගින් නිවාස ලබාදෙන වැඩසටහන
2. රු. 750,000/- බැගින් නිවාස ලබාදෙන වැඩසටහන
3. ශ්‍රව්‍යදෘෂ්‍ය මාධ්‍ය මඟින් ඉදිරිපත් වන හා අභියාචනා සඳහා නිවාස ලබාදෙන වැඩසටහන

1. රු. 250,000/- බැඟින් නිවාස ලබාදෙන වැඩසටහන

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට නිවාස 03 බැඟින් ලබාදෙන අතර මෙම ප්‍රතිලාභීන්ගේ පවුල් සඳහා සවිස්තරාත්මක තොරතුරු ගොනුවක් පවත්වාගත යුතුය. මෙම නිවාස ඉදිකිරීමේදී ලබාදෙන රු. 250,000/- අමතරව ප්‍රභූ හා ප්‍රජා දායකත්වය එක් කර ගනිමින් සම්පූර්ණ නිවසක් හෝ භාගයක් ඉදිකර ඇති නිවසක ඉතිරි කටයුතු සංවර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය.

2. ලක්ෂ 750,000/- බැඟින් නිවාස ලබාදෙන වැඩසටහන

නිවාස සෑදීම සඳහා ස්ථීරවම තමන් සතු ඉඩමක් තිබිය යුතුය. අවම වශයෙන් පවුලේ සාමාජිකයින් 03 දෙනෙක්වත් සිටීම අනිවාර්ය වන අතර වැන්දඹු පවුලක්වීම හෝ ආබාධිත අයෙකු පවුලේ සිටීම සුදුසුකමක් සේ සැලකේ. මෙම පවුල් තෝරා ගැනීමේදී දරිද්‍රතාවයෙන් යුත් පහල ආර්ථික මට්ටමක් සහිත පවුල් තෝරාගැනීම සිදු කරයි.

මේ සඳහා මුදල් ලබාදීමේදී අදියර 03ක් යටතේ 250,000/- බැඟින් ප්‍රතිලාභීන්ට ලබාදීමට කටයුතු කරනු ඇත. වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී මෙහි වගකීම ගෙන කටයුතු කරනු ඇත.

3. **ශ්‍රව්‍යදෘෂ්‍ය මාධ්‍ය මඟින් ඉදිරිපත් වන හා අභියාචනා සඳහා නිවාස ලබාදෙන වැඩසටහන**
සමෘද්ධිලාභීන් හා අඩු ආදායම්ලාභීන්ගේ නිවාස පිළිබඳව පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය මඟින් ප්‍රචාරය වන නිවාස අවශ්‍යතා හා ජනාධිපති, අගමැති, අමාත්‍යාංශ ලේකම් හා මැති ඇමතිවරුන්, අධ්‍යක්ෂ ජනරාල් හා වෙනත් නිලධාරීන් මඟින් ඉදිරිපත් වන ප්‍රජාවගේ අභියාචනා වෙනුවෙන් රු. 250,000/- හා රු. 750,000/- නිවාස යෝජනා පරීක්ෂා කර බලා නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසුව මෙම නිවාස යෝජනා සඳහා සුදුසුකම් ලබාදීම සිදුවේ.

ඒ අනුව 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද නිවාස සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය පහත දක්වා ඇත.

	වැඩසටහන	**ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව**	**නිවාස ආධාර වටිනාකම (රු.මි.)**
1	රු. 200,000 /= නිවාස ආධාර වැඩසටහන (නිවාස ලොතරැයි දිණුම් ඇදීම යටතේ)	3,810	402.00
2	රු. 125,000 /= නිවාස ආධාර වැඩසටහන	-	-
3	රු. 225,000 /= නිවාස ආධාර වැඩසටහන	-	-
4	රු. 250,000 /= නිවාස ආධාර වැඩසටහන	1,005	270.50
5	රු. 650,000 /= නිවාස ආධාර වැඩසටහන	-	-
6	රු. 750,000 /= නිවාස ආධාර වැඩසටහන	1,005	745.85
	එකතුව	**5,820**	**1767.00**

2.1.7 ප්‍රජාමූල සංවිධාන අංශය

2.1.7.1 හැඳින්වීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ සංවර්ධන කාර්ය භාරයන් දියත් කිරීම සඳහා ප්‍රජාව සම්බන්ධ මූලිකම පදනම ප්‍රජාමූල සංවිධානයයි. සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයක් යනු සමෘද්ධි පනතින් යෝජිත මෙහෙයුම් ක්‍රියාවලියේ දී ප්‍රජාව සම්බන්ධ වන ග්‍රාමීය මට්ටමේ සංවිධානයකි. මෙම ඒකකය පදනම් කරගෙන සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන, සමෘද්ධි දිස්ත්‍රික් කමිටු සහ සමෘද්ධි ජාතික සම්මේලනය යනාදී වශයෙන් සමස්ත සංවිධාන ව්‍යූහය ගොඩනැඟී ඇත.

සමෘද්ධි පනතට අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ඉටුකළ යුතු සියලු සංවර්ධන කාර්යයන් හා ප්‍රජාව සම්බන්ධ වන පහළම සංවිධානාත්මක ඒකකය වන ප්‍රජාමූල සංවිධානය මූලික කොට ගෙන ප්‍රජාවගේ පූර්ණ සහභාගිත්වයෙන් ඉටු කරනු ඇත. ප්‍රජාමූල සංවිධාන පිහිටුවීමත් එයට සමගාමීව ප්‍රාදේශීය සංවිධාන හා දිස්ත්‍රික් කමිටුද පිහිටුවා පවත්වා ගෙන යාම සිදු කෙරේ. මේ වන විට ප්‍රජාමූල සංවිධාන 29,687 ක් පිහිටුවා ඇත.

සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල කර්තව්‍ය ප්‍රාදේශීය මට්ටමින් අධීක්ෂණය කිරීම,පරීක්ෂා කිරීම සහ ඇගයීමේ කාර්යය සඳහා ප්‍රජාමූල සංවිධාන වල සභාපතිවරුන්ගේ සහභාගීත්වයෙන් සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන 335 ක් පිහිටුවා ඇත.

දිස්ත්‍රික්කයක් ඇතුළත ක්‍රියාත්මක වන සියලු සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන සභාපති හා ලේකම් නියෝජනය කරමින් සමෘද්ධි දිස්ත්‍රික් කමිටු පිහිටුවනු ලැබේ. මෙම දිස්ත්‍රික් කමිටු සෑම තුන් මසකට වරක් රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම සිදුකළ යුතුය.

සියලු සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල අනුයෝජිතයන්ගෙන් සමන්විත වන පරිදි සමෘද්ධි ජාතික සම්මේලනය පිහිටුවනු ලැබේ. අමාත්‍යවරයා සමෘද්ධි ජාතික සම්මේලනයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතුය.

ජාතික මට්ටමින් සමෘද්ධි සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීමේ ජාතික ප්‍රතිපත්තියක් සැලසුම් කිරීම සඳහා අවශ්‍ය වන යෝජනා සහ මත සමාලෝචනය කිරීම සහ සමෘද්ධි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය සැපයීම සමෘද්ධි ජාතික සම්මේලනයේ පරමාර්ථ වේ.

මෙම සියලු සංවිධාන පිහිටුවා යාවත්කාලීන කිරීම, පවත්වාගෙන යාම හා කළමනාකරණය කිරීම මෙන් ම එම සංවිධානවල සියලු කටයුතු අධීක්ෂණය කිරීම ප්‍රජාමූල සංවිධාන අංශය මඟින් සිදු කරනු ඇත.

2.1.7.2 ප්‍රජාමූල සංවිධාන අංශය මඟින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්

- ❖ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන පිහිටුවීම.
- ❖ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන ලියාපදිංචි කිරීම.
- ❖ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන ලියාපදිංචිය අලුත් කිරීම.
- ❖ සමෘද්ධි ජාතික සම්මේලනය වාර්ෂිකව පැවැත්වීම.
- ❖ ප්‍රජා නායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ❖ ‘‘සමෘද්ධි උත්තම පූජා’’ ප්‍රජා නායකයින් ඇගයීම.
- ❖ ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධානවල ගිණුම් කටයුතු ක්‍රමාණුකූල කිරීම.
- ❖ ආර්ථික සංවිධාන පිහිටුවීම.
- ❖ සංවිධාන අරමුදල් වර්ධනය කිරීමට අවශ්‍ය විවිධ වූ ක්‍රියාමාර්ග හඳුන්වා දීම.
- ❖ කාලීන ආර්ථික අර්බුදයට විසඳුමක් ලෙස මැදිහත්විය හැකි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ❖ ආදායම් උත්පාදනය සඳහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ❖ ‘‘සමෘද්ධි පූර්ව ළමා සවිබලකරන ‘‘ පෙර පාසැල් දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා හඳුනාගැනීම.
- ❖ ‘‘සමෘද්ධි සිසුබල සමාජ සත්කාරය’’ පාසල් ළමුන් සඳහා අභ්‍යාස පොත් ලබාදීම
- ❖ ‘‘සමෘද්ධි ජනාභිමාණී’’ ව්‍යවසායකයින් ඇගයීම.
- ❖ **‘‘**සමෘද්ධි හරිත වර්ණ අස්වැද්දුම මාතෘභූමි’’ ජාතික රුක්රෝපණ දින පරිසර වැඩසටහන
- ❖ ක්ෂුද්‍රමූල්‍ය ගැටළුවට විසඳුමක් ලෙස සමෘද්ධි අරුණළු සහන ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ❖ ‘‘තාරුණ්‍යයට සොඳුරු ඇමතුමක්’’ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ජාතික හා අන්තර් ජාතික මට්ටමින් ක්‍රීඩා දක්ෂතාවයන් දක්වන දරුවන්ට ක්‍රීඩා සංවර්ධන ආධාර ලබාදීම.

➢ පිහිටුවා ඇති සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව	29687
➢ පිහිටුවා ඇති සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන සංඛ්‍යාව	335
➢ ත්‍රෛයි මාසිකව රැස්වන දිස්ත්‍රික් කමිටු සංඛ්‍යාව	25
➢ ප්‍රජාමූල සංවිධාන වල මුළු සාමාජික සංඛ්‍යාව	මිලි. 3.7

2.1.7.3 ප්‍රජා නායකයින් හා නිලධාරින් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.

2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 04 වන වගන්තියේ (උ) හා (ඌ) හි සඳහන් පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා 05 වන වගන්තියේ (ඕ) හි සඳහන් බලතල ප්‍රකාරව 06 වන වගන්තියේ (ඇ) හා (ඒ) හි සඳහන්

කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට අනුකූලව කටයුතු කිරීම සඳහා ප්‍රජා නායකයින් දැනුවත් කිරීම මඟින් සමස්ථ ප්‍රජාව දැනුවත් කිරීම.

2023 වර්ෂයේ ප්‍රජාමූල සංවිධාන අංශය මඟින් ක්‍රියාත්මක වැඩසටහන් පිළිබඳ ප්‍රජාමූල නායකයින් හා සමෘද්ධි නිලධාරින් දැනුවත් කිරීම මඟින් අපේක්ෂිත ඉලක්ක සාධනීය ලෙස ලඟා කර ගැනීම අරමුණු කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩමුළු 07ක් සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන හරහා 2023 වර්ෂයේ ජූලි මස සිට සැප්තැම්බර් මස දක්වා දිවයිනම ආවරණය වන පරිදි පවත්වන ලදී.

එහි දී පහත සඳහන් මාතෘකා සම්බන්ධව දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

- සමෘද්ධි පනත, රෙගුලාසි හා ප්‍රාදේශීය සංවිධාන සතු බලතල පිළිබඳ දැනුවත් කිරීම.,
- නායකත්වය, ප්‍රජා නායකයෙකු සතු වගකීම් හා තීරණ ගැනීම
- සරල ව්‍යාපෘති වාර්ථාවක් සකස් කිරීම හා ඉදිරිපත් වන වාර්තාව පදනම් කරගෙන තීරණ ගැනීම.
- ප්‍රජාමූල, ප්‍රාදේශීය සංවිධවල ප්‍රජා නායකයෙකු සතු වගකීම් හා කාර්ය භාරය.
- ජාතික නිෂ්පාදනයට ආර්ථික ප්‍රතිලාභ ලඟා කර දීම උදෙසා ක්‍රියාත්මක විශේෂ ආදායම් උත්පාදන වැඩසටහන
- ජාතික රුක්රෝපණ දිනයට සමගාමී හරිත වර්ණ අස්වැද්දුම මාතෘභූමි පරිසර වැඩසටහන
- ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින්, දරුවන් හා තරුණ ප්‍රජාවගේ ක්‍රීඩා කුසලතාවය වැඩි දියුණු කිරීම ඉලක්ක කර ගත් ජාතික ක්‍රීඩා වැඩසටහන
- සමාජ සංවර්ධන හා පරිසර අංශය හා ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමට යෝජිත ජාත්‍යන්තර දූම්වැටි විරෝධී සමෘද්ධි කොඩි වැඩසටහන ඇතුළු ජාත්‍යන්තර දින සැමරීමේ වැඩසටහන
- **"**සමෘද්ධි ජනාභිමාණී**"** ව්‍යවසායකයින් ඇගයීමේ ජාතික වැඩසටහන
- **"**සමෘද්ධි උත්තම පූජා**"** ප්‍රජානායකයින් ඇගයීමේ ජාතික වැඩසටහන
- ක්ෂුද්‍ර මූල්‍ය ගැටළුවට පිලියම් ලෙස හඳුන්වා දුන් අරුණළු ණය වැඩසටහනේ ප්‍රගතිය සාකච්ජා කර ඉලක්ක සාධනය කර ගැනීමට විසඳුම් සෙවීම
- ප්‍රජා නායකයින් විගණකයන් ලෙස කටයුතු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ දැනුවත් කිරීම
- ප්‍රජාමූල සංවිධාන පිහිටුවීම, ලියාපදිංචිය හා පවරා ඇති ක්‍රියාකාරකම් වල ප්‍රගතිය සාකච්ජා කිරීම

මේ යටතේ දිවයිනම ආවරනය වන පරිදි 522 කගේ සහභාගිත්වයෙන් වැඩමුළු 7ක් පැවැත්වීමට හැකි වූ අතර ඒ සඳහා ජාතික සමාජ සංවර්ධන අරමුදලෙන් රු.මිලි 1.54 වැය දරන ලදී.

2.1.7.4 දිස්ත්‍රික් කමිටු රැස්වීම් පැවැත්වීම.

සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන ,ප්‍රාදේශීය සංවිධානයන්හි වැඩසටහන් අධීක්ෂණය කිරීම , නියාමනය කිරීම, සහ ඇගයීම. දිස්ත්‍රික්කය තුළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාල යෝජනා ඉදිරිපත් කිරීම, වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

ස්ථානය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

සහභාගිත්වය - ප්‍රාදේශීය සංවිධාන වල සභාපතිවරු, ලේකම්වරු, ප්‍රජාමූල බැංකු සමිති ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්, දිස්ත්‍රික්කය භාරව සිටින දෙපාර්තමේන්තු නිලධාරියා, අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරනු ලබන දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතුවල යෙදී සිටින තැනැත්තන් තුන්දෙනෙකු.

සෑම වර්ෂයකම තුන් මසකට වරක් රැස්වීම් පවත්වන අතර වර්ෂයකට රැස්වීම් 04 ක් පැවැත්වේ.

දිස්ත්‍රික්කය තුළ සමෘද්ධි සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනා සහ මත සලකා බැලීම සහ ඒවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා දිස්ත්‍රික් කමිටු මඟින් සිදු කෙරේ.

2.1.7.5 සමෘද්ධි කොඩි වැඩසටහන

2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 10 (ඒ) ඡේදයට අනුව සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ආත්ම විශ්වාසය, සමාජය කෙරෙහි සාමූහික වගකීම, යහපත් ගුණාංග හා ගුණ ධර්ම ප්‍රවර්ධනය කිරීම ප්‍රජාමූල සංවිධානවල එක් පරමාර්ථයක් වන අතර පනතේ 16(ඉ) ඡේදයට අනුව සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ මානව පෞරුෂය, සාමූහික ක්‍රියාකාරකම් දැහැමි හා ආධ්‍යාත්මික ගුණාංග වැඩි දියුණු කිරීම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානවල එක් පරමාර්ථයක් වේ.

මෙම පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනට සමගාමීව සමෘද්ධි කොඩි වැඩසටහන සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන හරහා ක්‍රියාත්මක කරනු ලැබේ. තම වසමට අයත් ප්‍රජාමූල සංවිධානවල සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු විධායක සභාව මෙන්ම සාමාජිකයන් සමඟ එක්ව සමෘද්ධි ප්‍රතිලාභීන් මඟින් කොඩි හා ස්ටිකර් පිළිගැන්වීම දුම් වැටි හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැලකී සිටීමේ පණිවුඩය ජනතාව වෙත ලබා දෙමින් අරමුදල් රැස් කිරීම මින් බලාපොරොත්තු වේ.

සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ හා අඩු අදායම්ලාභීන්ගේ සමාජ සුභසාධන කටයුතු සඳහා මෙම අරමුදල් යොදවනු ලැබේ. මෙම වැඩසටහන සියළුම ප්‍රජාව සඳහා සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල ක්‍රියාත්මක කෙරේ. දුම්වැටි විරෝධී දිනයට සමගාමීව මත් නිවාරණ වැඩසටහන් පැවැත්වීම හා කොඩි වැඩසටහන තුලින් එක්රැස් කරන ලද අරමුදලින් ප්‍රතිලාභීන්ගේ හා ඔවුන්ගේ පවුල්වල දරුවන්ගේ සුබසාධනය සඳහා යෙදවීම. මත් නිවාරණ වැඩසටහන්, නිවාස ඉදිකිරීම්, නිවාස අලුත්වැඩියා කිරීම්, පාසල් දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීම, පාසල් දරුවන් සඳහා පොත් හා උපකරණ ලබාදීම, සනීපාරක්ෂක වැඩසටහන, සෞඛ්‍යය හා පෝෂණ වැඩසටහන්, ආබාධිත සුභසාධනය, කාන්තා හා වැඩිහිටි දින වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

2.1.7.6 "සමෘද්ධි සිසුබල සමාජ සත්කාරය" පාසල් ළමුන් සඳහා අභ්‍යාස පොත් ලබාදීම

යම්කිසි හැකියාවන් ගොන්නක් විධිමත් ලෙස ඉගැන්වීම හා ඉගෙන ගැනීම" අධ්‍යාපනය ලෙස සරලව දැක්විය හැකිය. සියළුම දරුවන්ට නිදහස්ව හා සාධාරණ ලෙස ප්‍රාථමික අධ්‍යාපනය ලබා ගැනීමේ අවස්ථාව සලසා දීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

ප්‍රජාමූල සංවිධානවල සාමාජික සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනයට ශක්තියක් ලබාදීම හා ක්‍රමාණුකූල, විධිමත් අධ්‍යාපනයක් තුළින් පවුල් සවිබල ගැන්වීමේ කාර්යයට සුදානම් කරවීම.

ආර්ථික දුෂ්කරතා නිසා පාසල් නොයන දරුවන්ට අවශ්‍ය මූලික පහසුකම් සපයාදීම තුළින් අධ්‍යාපනයේ ඇති වටිනාකම අවබෝධ කරදී ඔවුන්ට විධිමත් අධ්‍යාපනයක් ලබාදීම.

- ❖ අරමුදල් සපයා ගැනීම
    1. ප්‍රජාමූල සංවිධානවල පරිත්‍යාගශීලීන් හා අනුග්‍රාහක දායකත්වය
    2. සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල
    3. බැංකු හා බැංකු සමිති පොදු සුභසාධන අරමුදල

- ❖ ඉලක්කය - දරුවන් 100000 ක් සඳහා අභ්‍යාස පොත් කට්ටල 100000 ක් ලබා දීම
- ❖ ව්‍යාපෘතිය සඳහා ආයෝජනය කළ මුදල රු.මි. 100
- ❖ පොත් කට්ටලයක වෙළෙඳ පොල වටිනාකම රු.3,600/-
- ❖ පොත් කට්ටලයක වර්තමාන වෙළෙඳ පල වටිනාකම රු. 1,776.33කි.

2.1.7.7 "සමෘද්ධි උත්තම පූජා" ප්‍රජා නායකයින් ඇගයීම

- ප්‍රජා සංවිධායකත්වය යනු ජනතාව සමූහයක් විසින් සංවිධානය කරන අවශ්‍යතා, පොදු අරමුණු, ප්‍රතිපත්ති හා සංස්කෘතියට බලපෑම් කිරීම සඳහා සංවිධානය කරන ක්‍රියාවලියකි.
- ග්‍රාමීය සංවර්ධනයේ නියම පංගු කාරයන් වන ග්‍රාමීය ප්‍රජාව එහි නියම උරුමක්කාරයන් කිරීමට නම් ඔවුන් සතු ආවේණික ආයතන පද්ධතියක් දියුණු කර තිබිය යුතුය

ජාතික සමාජ සංවර්ධන අරමුදලේ ජාතික සභාව මඟින් පෙන්වා දුන් පරිදි මෙම කාර්යය සඳහා ග්‍රාමීය සංවිධාන ජාලය ශක්තිමත් කිරීම වෙනුවෙන් ප්‍රජා නායකයින් අගය කිරීමකට ලක් කළ යුතුය.

- * නිස්සරනධ්‍යාශයෙන් ප්‍රජා නායකයින් කරන සේවය ඇගයීමට ලක් කිරීම.
- කාර්යක්ෂම සේවාවක් ලබාගැනීම.
- මානසික තෘප්තියකින් සේවය කිරීමට හැකි පරිසරයක් ඇති කරදීම.
- අභිප්‍රේරණයක් ඇති කිරීම.
- ප්‍රජාමූල සංවිධාන අතර උද්‍යෝගයක් ඇති කිරීම.
- ප්‍රජාමූල සංවිධාන ජාලයට සම්බන්ධ නොවුන අයට සම්බන්ධ වීමට උත්තේජනයක් ලබාදීම.
- ප්‍රජාමූල සංවිධාන ජාලයට වටිනාකමක් එක් කිරීම යන අරමුණු පෙරදැරි කරගෙන ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන ඇගයීමට ලක් කිරීම.

මේ අනුව මෙම වසරේදී ප්‍රජා නායකයින් ප්‍රජාමූල සංවිධාන 3 x 25, ප්‍රාදේශීය සංවිධාන සභාපතිවරු 3 x 25 වශයෙන් දිස්ත්‍රික්කයකට 6 දෙනා බැගින් සභාපතිවරුන් 150 ඇගයීමට ලක්විය.

2.1.7.8 "සමෘද්ධි ජන අභිමාණී" ව්‍යවසායකයින් ඇගයීම

සමෘද්ධි වැඩසටහන තුළින් සවිබලගැන්වී සමෘද්ධි සහනාධාර මානසිකත්වයෙන් ඉවත්ව, ස්ථීර ආදායමක් ලබන ව්‍යවසායකයින් මට්ටමට ලක්වූවන්.
ප්‍රදේශයේ සම්පත් උපයෝගී කර ගෙන තමා විසින්ම ව්‍යාපාරයක් ආරම්භ කළ අය හා සමෘද්ධි ප්‍රතිලාභීන් කිහිප දෙනෙකුට රැකියාවක් දීමට හැකියාව ඇති පුද්ගලයින් ,හඳුනාගෙන දිස්ත්‍රික් මට්ටමින් ඇගයීමකට ලක් කිරීම.

- දිළිඳු භාවයට පත් පවුල් සංඛ්‍යාව අවම කිරීම.
- ප්‍රතිලාභීන් යැපුම් මානසිකත්වයෙන් මුදවා ගැනීම.
- ස්ථීර ආදායම් මාර්ගයකට යොමු කිරීම,
- ව්‍යවසායකයෙක් බවට පත් කිරීම.
- රැකියා සපයන්නෙකු බවට පත් කිරීම.
- අපනයන වෙළඳාම වෙත යොමු කිරීම.

- ජාතික නිෂ්පාදනයට යම් දායකත්වයක් එකතු කිරීම යන අරමුණු ඇතිව ව්‍යවසායක මට්ටමට පත්වූවන් ඇගයීමට ලක් කිරීම . මේ යටතේ දිස්ත්‍රික්කයකට තිදෙනෙකු වශයෙන් ව්‍යවසායකයින් 150 ඇගයීමට ලක්විය.

2.1.7.9 "තාරුණ්‍යයට සොඳුරු ඇමතුමක්" සමෘද්ධි ජාතික ක්‍රීඩා වැඩසටහන

ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින් හා ඔවුන්ගේ දූ දරුවන් ක්‍රීඩාව තුලින් බලගන්වා එම පවුල් ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබලගැන්වීම සඳහා ග්‍රාමීය, කළාප හා ප්‍රාදේශීය සංවිධාන මට්ටමින් ක්‍රීඩා තරඟ පවත්වා දිස්ත්‍රික් මට්ටමින් කණ්ඩායම් හඳුනාගැනීම හා එම කණ්ඩායම ජාතික වශයෙන් මෙම වසරේදී ඇගයීමට ලක් කිරීම.

එමෙන්ම මෙම තරගාවලිය තුළින් දුම්පානයේ ආදීනව පිළිබඳ ප්‍රජාව දැනුවත් කර ඉන් මුදවා ගැනීම, ඉහල කොඩි ආදායමක් ලබා ගැනීම, මානසික සමබරතාවයකින් යුතු සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීම හා කාලය අර්ථවත් හා ඵලදායි ලෙස භාවිතා කරමින් ප්‍රජාවගේ ක්‍රීඩා කුසලතාවයන් වැඩි දියුණු කිරීමට ද අපේක්ෂිතය.

ඒ අනුව දිස්ත්‍රික්ක 17ක දිස්ත්‍රික් මට්ටමින් තරඟ පවත්වා හඳුනා ගන්නා ලද කණ්ඩායම්වල නායකයින් ජාතික මට්ටමින් ඇගයීම.

2.1.7.10 සමෘද්ධි ජාතික සම්මේලනය

සමෘද්ධි පනතේ V වන කොටසේ 24 වන ඡේදය ප්‍රකාරව ජාතික මට්ටමින් සමෘද්ධි වැඩසටහන සම්බන්ධීකරණය කිරීමේ ජාතික ප්‍රතිපත්තියක් සැලසුම් කිරීම සඳහා අවශ්‍ය වන යෝජනා හා මත සමාලෝචනය කිරීම සහ සමෘද්ධි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නායකත්වය සැපයීම අරමණු කර ගනිමින් ජාතික සම්මේලනය පැවැත්විය යුතුය.

ඒ අනුව මෙම වසරේ ඔක්තෝම්බර් මස 25 වන දින මහරගම ජාතික තරුණ සේවා සභාවේදී ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධානයන්හි ගරු සභාපතිවරුන්ගේ සහභාගිත්වයෙන් සමෘද්ධි ජාතික සම්මේලනය පවත්වන ලදී.

2.1.7.11 ක්ෂුද්‍රමූල්‍ය ගැටළුවට විසඳුමක් ලෙස සමෘද්ධි අරුණලු සහන ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

සමෘද්ධි හා අඩු ආදායම්ලාභීන්ගේ කුඩා පරිමාණ ව්‍යවසායික ප්‍රාග්ධන අවශ්‍යතා මෙන්ම පැන නගින හදිසි මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් අවශ්‍ය වන්නා වූ කෙටි කාලීන මූල්‍ය ඕනෑ එපාකම් තම ගම් ප්‍රදේශයේදීම පිරිමසාලීමටත්, අඩු ආදායම්ලාභීන් ණයගැති භාවයෙන් මුදවා ගැනීමත් මෙම ණය වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ.

ප්‍රතිලාභීන්ට හිමිවන පහසුකම්

- තම ගම් ප්‍රදේශයේදීම ණය ලබා ගැනීමේ හැකියාව.
- ඉතා කෙටි කාලයක් තුල ණය ලබා ගැනීමට හැකිවීම.
- සහනදායි පොලී අනුපාතයක් යටතේ ණය ලබාදීම.
- සරල පහසු ක්‍රමවේදයක් යටතේ ආපසු ගෙවීමේ හැකියාව.

ප්‍රජාමූල බැංකු 872 ක ප්‍රතිලාභීන් 200,253 සඳහා මේ වන විට රු.මිලි 2,541ණය ප්‍රමාණයක් නිතුත් කිරීමට හැකියාව ලැබී ඇත.

2.1.7.12 ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය

සංඛ්‍යා සටහන - (XVI)

අනු අංක	වැඩසටහන	වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මී	වියදම (රු.මී.)	සංඛ්‍යාව
01	සමෘද්ධි සිසුබල සමාජ සත්කාරය" පාසල් ළමුන් සඳහා අභ්‍යාස පොත් ලබාදීම	20	17.59	දරුවන් 9905
02	සමෘද්ධි ප්‍රජා නායකයින් හා නිලධාරීන් පුහුණු කිරිම.	2.50	1.57	ප්‍රජා පුහුණුකරුවන් - 1501
03	දිස්ත්‍රික් කමිටු රැස්වීම් පැවැත්වීම	1.88	1.48	කමිටු රැස්වීම් 51
04	තාරුණ්‍යයට සොදුරු ඇමතුමක් ජාතික ක්‍රීඩා වැඩසටහන	3.00	1.48	ක්‍රීඩා කණ්ඩායම් 17
05	සමෘද්ධි උත්තම පූජා ප්‍රජා නායකයින් ඇගයීම	2.50	7.38	150
06	ජන අභිමාණී ව්‍යවසායකයින් ඇගයීම	2.50		150
07	ජාතික සම්මේලනය පැවැත්වීම	4.00		1320
එකතුව		**36.38**	**29.5**	

* මෙම වසරේ භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලැබුන හෙයින් සියළුම ප්‍රතිපාදන සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල මඟින් දරන ලදී.

2.1.8 තොරතුරු තාක්ෂණ අංශය

2.1.8.1 හැඳින්වීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන කාර්යයන් තොරතුරු තාක්ෂණයත් සමඟ සම්බන්ධ කොට වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදීම මෙම අංශයේ ප්‍රධාන අරමුණයි.

2.1.8.2. ක්‍රියාකාරකම්

- බැංකු ලිපි ද්‍රව්‍ය ගබඩාවේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා නව මෘදුකාංගයක් හඳුන්වා දීම.
- දිවයින පුරා පැතිරී ඇති සමෘද්ධි බැංකු 1,093 හා සමිති 335 පරිගණකගත කිරීම සඳහා මෘදුකාංග සමාගම් දෙකක් දැනට තෝරාගෙන පළාත් 06 ක් සඳහා එක් මෘදුකාංගයකුත් පළාත් 03 ක් සඳහා අනෙක් මෘදුකාංගය වශයෙන් සියලු බැංකු පරිගණක ගත කිරීමට කටයුතු කිරීම.

- දෙපාර්තමේන්තුවේ දුරකථන ඇමතුම් සඳහා වන වියදම් අවම කිරීම සඳහා ඇතිකර ඇති Calling circle දුරකථන ජාලය වඩාත් ශක්තිමත් කිරීම.
- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව නිල වෙබ් අඩවිය, දෙපාර්තමේන්තු මඟින් නිකුත් කරනු ලබන චක්‍ර ලේඛන, උපදෙස් ලිපි හා දැනුම් දීම් සියල්ල යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යාම.www.samurdhi.gov.lk
- දිවයින පුරා විසිරී ඇති සමෘද්ධි මූලස්ථාන කාර්යාල 335 හා දිස්ත්‍රික් කාර්යාල 25 සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම බිල්පත් ගෙවීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- සමෘද්ධි මූලස්ථාන කාර්යාල 335 හා දිස්ත්‍රික් කාර්යාල 25 සඳහා අවශ්‍යතා ඇති වන ආකාරයට පරිගණක හා පරිගණක උපාංග ලබාදීම.
- නිලධාරින්ට අවශ්‍ය තොරතුරු තාක්ෂණ පුහුණුව ලබාදීම.
- අඩු ආදායම්ලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහනට අදාලව ව්‍යාපෘති කලමනාකරණය හා පවුල් සංවර්ධන සැලැස්ම CRM මොඩියුලයේ නිර්මාණය කිරීම.

2.1.8.3. CRM මොඩියුලය ක්‍රියාත්මක කිරීම.

CRM මොඩියුලය මඟින් 2024 වර්ෂයේදී ප්‍රධාන වශයෙන් ඉලක්කගත කරනුයේ පවුල් සවිබල ගැන්වීමට අදාල තොරතුරු කලමනාකරණයයි. සවිබලගැන්වීමේ තොරතුරු පවුල් විස්තර හා ව්‍යාපෘතියන් ආරම්භයේ සිට අවසානය දක්වා තොරතුරු ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසු ඉදිරි වසර 3න් එහි ක්‍රියාකාරිත්වයද පරික්ෂා කරනු ලැබේ.

2.1.8.4. CRM ව්‍යාපෘතිය මඟින් ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵලය

පවුල් සවිබලගැන්වීමට අදාලව ව්‍යාපෘතිය ආරම්භයේ සිට අවසානය දක්වා තොරතුරු කලමනාකරණ හා ව්‍යාපෘතියේ අවසානයෙන් පසු සවිබල ගැන්වීම සිදු වූයේද යන්න අඛණ්ඩ ප්‍රගතිය ලබා ගැනීම. නිසි පරිදි සවිබලගැන්වීම පරීක්ෂා කිරීම.

2.1.8.5. දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම.

මේ මඟින්, වෙබ් අඩවිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම, දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා නිකුත් කරන චක්‍ර ලේඛ, නිවේදන, ලිපි ආදිය නිලධාරීන්ට කඩිනමින් ලබා දීම සිදු කෙරේ.

2.1.8.6. සමෘද්ධි ප්‍රජා මූල බැංකු හා බැංකු සමිති පරිගණකගත කිරීම.

මෙම වැඩසටහන සමෘද්ධි ප්‍රධාන කාර්යාල මඟින් ක්‍රියාත්මක වන අතර .බැංකු සඳහා අඛණ්ඩ මනා සේවාවක් සැපයීම සඳහා පරිගණක මෘදුකාංගය නිෂ්පාදිත ආයතන සමඟ සේවා ගිවිසුමකට එළඹීමත්, මෘදුකාංගයේ දෝෂ සියල්ල හඳුනාගෙන ඒවා නිවැරදි කර සියලු බැංකු වෙත ලබාදීමත් මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. ක්ෂුද්‍ර මූල්‍ය අංශය මඟින් මේ සඳහා වියදම් දරණ අතර, 2023.12.31 වන විට බැංකු හා මූලස්ථාන 1,425 ක් පරිගණකගත කර ඇත. මෙහිදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ.

i. ගනුදෙනුකරුවන් ලියාපදිංචිය
ii. ගිණුම් ඇතුළත් කිරීම
iii. ගනුදෙනු ආරම්භය

iv. ණය වර්ග හා තැන්පත් වර්ග ඇතුලත් කිරීම
v. පාස්පොත් මුද්‍රණය
vi. දෛනික ගිණුම් කටයුතු, පොළී ගණනය කිරීම ශේෂ පිරික්සුම ආදී බැංකුවේ කටයුතු හා බැංකුවට අවශ්‍ය වාර්තා සකස් කිරීම.
vii. ක්ෂේත්‍රයේදී මුදල් තැන්පත් භාර ගැනීම හා සහනාධාරලාභීන්ට නිවසේදීම මුදල් ලබා ගැනීම සඳහා ජංගම දුරකතන යෙදවුම (Mobile App) ක්‍රියාත්මක කිරීම.
viii. ATM Machine භාවිතය සඳහා පරිගණක මෘදුකාංගය තුල පහසුකම් සපයා ඇත.
ix. සමාජ ආරක්ෂණ ගෙවීම් සිදු කිරීමට සහය වීම.

මෙමඟින් ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල

- දැනට ක්‍රියාත්මක නියමු සමෘද්ධි බැංකුවල කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමක පවතී.
- නිළධාරීන්ගේ ශ්‍රමය යොදා කරන ලද ක්‍රියාවලිය පරිගණක මෘදුකාංගය මඟින් කිරීමේ දී නිවැරදිව හා පහසුව කිරීමටත්, කාලය ඉතිරිකර ගැනීමටත් හැකිවීම.
- ප්‍රතිලාභීන්ට ප්‍රමාද දෝෂයකින් තොරව කලට වේලාවට තම ගනුදෙනු කටයුතු කරගැනීමේ පහසුව සැලසීම.
- විශාල පිරිවැයක් ඉතුරු කිරීමට සහය වීම.

2.1.8.7. HRM මොඩියුලය ක්‍රියාත්මක කිරීම.

- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 25,000කට අධික සේවකයන් පෞද්ගලික හා රාජකාරී තොරතුරු ඇතුළත් කිරීම.
- පද්ධතිය තුලින් එම සේවකයන් සඳහා රාජකාරී හැඳුනුම්පතක් නිකුත් කිරීමට අවශ්‍ය තොරතුරු රැස් කිරීම.
- දෙපාර්තමේන්තුගත නිලධාරීන් පෞද්ගලික ලිපිගොනුවේ ලේඛන scan කර පද්ධතියට upload කිරීම.
- එම upload කරන ලේඛන තුලින් දෙපාර්තමේන්තුගත නිලධාරීන් සඳහා විශ්‍රාම ලිපි ගොනුවක් පද්ධතිය තුළින් සකස් කිරීම සහ ඒ ඒ වර්ෂයේ අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම යන නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් වාර්තාවක් Home page එකේ ඇතුළත් කිරීම.
- මෙය ප්‍රධාන කාර්යාලයේ, සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අංශවලින් හා මූලස්ථාන කාර්යාලවලින් ක්‍රියාත්මක කරනු ලැබේ.

වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුලින්,

- ප්‍රමාදයකින් තොරව සේවක ගැටළු විසඳීමට හැකි වීම
- කාර්යාල කටයුතුවල කාර්යක්ෂමතාවය ඉහළ යාම.
- නිලධාරීන් විශ්‍රාම යාමේදී විශ්‍රාම ගොනුවට අවශ්‍ය ලේඛන සහිත නිවැරදි ගොනුවක් සකස් කිරීම.
- නිවැරදි සහ යාවත්කාලීන දත්ත පහසුවෙන් ලබා ගත හැකි වීම බලාපොරොත්තු වේ.

2.1.9. මාධ්‍ය අංශය

2.1.9.1 හැඳින්වීම

2030 වසර වන විට දුගී බවෙන් තොර, සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර, ඊට අදාලව දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් ජනතාව අතරට ගෙනයාම මාධ්‍ය අංශයේ මූලික අරමුණ වේ. මේ සඳහා මුද්‍රිත මාධ්‍ය මෙන්ම විද්‍යුත් මාධ්‍යය ද භාවිතා කරන අතර පහත සඳහන් ප්‍රධාන වැඩසටහන් 2023 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලදි.

1. **"සමෘද්ධි E පුවත්පත " පල කිරීම**.

වෙන් කළ ප්‍රතිපාදන - රු.මි. 3.60
වැය වූ මුදල - රු.මි. 0.84

- 2023 ජනවාරි හා පෙබරවාරි මාසවල සමෘද්ධි **E** පුවත්පත භාෂාත්‍රයෙන් (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සකස් කර අන්තර්ජාලයට මුසු කරන ලදි.
- මෙම **E** පුවත්පත සමෘද්ධි **E paper app** එක මඟින් පරිශීලනය කළ හැකි ය. මෙතෙක් පල කරන ලද සියලු කලාප නැවත නැවත කියවීමට හැකි පරිදි **app** එක හා අන්තර්ජාල පිටුව නිර්මාණය කර ඇත.
- එසේම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද පරිශීලනය කිරීමේ හැකියාව සලසා ඇත.
- මේ සඳහා ලිපි විශේෂාංග ,නිර්මාණ ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියකුට හැකියාව ඇත.

2. **"සමෘද්ධි උදානය" රූපවාහිනී වැඩසටහන.**

- වෙන් කළ ප්‍රතිපාදන - රු.මි. 16.40
- වැය වූ මුදල - රු.මි. 6.092

" සමෘද්ධි උදානය " නමින් දිරිය මිනිසුන්ගේ පුවත් ඇතුලත් රූපමය සඟරාව ජාතික රූපවාහිනිය ඔස්සේ සෑම ඉරු දිනකම ප.ව.5.30 සිට ප.ව.6.00 දක්වා පැය ½ කාලයක් ප්‍රචාරය කිරීම සිදු කෙරේ. මෙහිදී සමෘද්ධි පුවත් විවරණයක් ද මෙම වැඩසටහනට ඇතුලත් කර ඇත.ගෙවීයන සෑම සතියක් තුළ දිවයින පුරා සිදු කරනු ලබන වැදගත් අවස්ථා පටිගත කිරීමෙන් ඡයාරූපගත කිරීමෙන් එලඹෙන ඉරුදින වැඩසහන සම්පාදනය කරනු ලබයි.

- 2023 වර්ෂය තුළ ප්‍රචාරය කරන ලද වැඩසටහන් ගණන 20 යි.

සංඛ්‍යා සටහන XVII

අ.අ	වැඩසටහන	වැඩසටහන් ගණන	වෙන්කල මුදල රු.මි.	වැය වූ මුදල රු.මි.
1	සමෘද්ධි **E** පුවත්පත	සිංහල 04 ඉංග්‍රීසි 04 දෙමළ 04	3.60	0.84
2	රූපවාහිනී වැඩසටහන	20	16.4	6.092
එකතුව			20.0	6.932

- 2023 වර්ෂය සඳහා මාධ්‍ය අංශයේ මාධ්‍ය වැඩසටහන් සඳහා රු.මි. 20 ක මුදලක් වෙන් වී පැවතියත් රටේ ඇතිවූ ආර්ථික තත්වය හේතුවෙන් මාධ්‍ය හා ප්‍රචාරණ වියදම් සීමා කිරීම හේතුවෙන් රු.මි 6.932 ක මුදලක් වැය කරන ලදී.

2.1.10. අභ්‍යන්තර විගණන අංශය.

2.1.10.1 හැඳින්වීම.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මුදල් රෙගුලාසි 133,134 අනුව පිහිටුවා ඇති අතර, කලමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ උපදෙස් හා පූර්ව මඟපෙන්වීම මත ක්‍රියාත්මක වනු ලැබේ.

2.1.10.2 අරමුණ හා කාර්ය භාරය

අභ්‍යන්තර විගණන අංශය ප්‍රධාන වශයෙන් දෙපාර්තමේන්තුවේ විගණන කාර්යයට අමතරව දිවයින පුරා පිහිටි සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1096 ක් හා බැංකු සමිති 335 ක්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 ක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක් හා ප්‍රජාමූල සංවිධානවලින් කොටසක් විගණනයට ලක් කරනු ලැබේ. දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධ ආයතන විසින් ඉටුකරනු ලබන වැඩසටහන්වල කාර්යක්ෂමතාවය ඉහල නැංවීමේ අරමුණෙන්, අදාල පරිදි මූල්‍ය විගණනය, කාර්ය සාධන විගණනය, කලමනාකරණ විගණනය , පාරිසරික විගණනය, පද්ධති පාලන විගණනය හා අවධානම් සහිත ක්ෂේත්‍ර පදනම් කරගත් විගණනය සිදු කරනු ලබයි.

මේ අනුව 2023 වාර්ෂික විගණන සැලැස්ම අනුව වර්ෂය තුල පහත අරමුණු ඉටුකර ගැනිමට සමත්ව ඇත.

i. විගණන සැලැස්මේ 80% ක ප්‍රගතියක් ලගාකර ගැනිමට හැකි වීම
ii. වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීම.
iii. වර්ෂය තුල විශාල මූල්‍ය වංචා කීපයක් අනාවරණය කර ගැනීම, ඒ සඳහා විශේෂ විගණන පරීක්ෂණ පැවැත්වීම හා විනයානුකූලව කටයුතු කිරීම සඳහා යොමු කිරීම.

ඉහත කරුණු වලට අමතරව 2022,2023 වර්ෂවල ගෙවන ලද සමාජ ප්‍රතිලාභ සම්බන්ධයෙන් විශේෂ විගණනයක් සිදු කිරීම හා අදාල වියදම් වාර්තාවල නිරවද්‍යතාවය පිළිබඳව පරීක්ෂා කර කළමනාකරණයට වාර්තා කිරීම සිදු කරන ලදි.

2.1.11 සැලසුම් හා මෙහෙයුම් අංශය

2.1.11.1 හැඳින්වීම

කාන්තා , ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ පවතින ආයතන අතුරින් ජනතාවගේ දිළිඳුබව තුරන් කිරීමේ අරමුණ වෙනුවෙන් කටයුතු කරන ප්‍රධානතම ආයතනය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවයි.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් ක්‍රමෝපාය සැලසුම් සකස් කිරීම, වාර්ෂික සැලසුම් සකස් කිරීම, ඒ සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැන හා එම සැලසුම් අනුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පිළිබඳ පසු විපරම් කිරීම, ආයතනික තීන්දු තීරණ ගැනීම සඳහා ඵලදායී දත්ත ඉදිරිපත් කිරීම හා තොරතුරු

වාර්ෂික වියදම් සීමාව තුළ ඊට සරිලන ප්‍රතිඵල ළඟා කරගෙන ඇත් ද යන වග නිරීක්ෂණය කිරීම, ආයතනික ඉදිරි විභවතා පිළිබඳ පර්යේෂණ සිදු කර දිළිදු බව තුරන් කිරීමේ මෙරට ජාතික මෙහෙවරට උරදෙන ප්‍රමුඛතම ආයතනය බවට පත් කිරීමේ මෙහෙවර අප අංශය මඟින් සිදු කරයි.

2.1.11.2 සැලසුම් හා මෙහෙයුම් අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

(I) ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

ප්‍රධාන කාර්යාලය මඟින් මෙම රැස්වීම් සංවිධානය කරනු ලබන අතර, අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් සෑම මසකට වරක්ම පැවැත්වේ. දෙපාර්තමේන්තුවේ වාර්ෂික සැලැස්ම අනුව ක්‍රියාතමක වන ව්‍යාපෘතිවල ප්‍රගතිය මෙන්ම, අනෙකුත් සියළුම පරිපාලන කරුනු පිළිබඳව සාකච්ඡා කරනු ලබන අතර, මේ සඳහා දිස්ත්‍රික් 25 නියෝජනය කරමින් දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කාර්යාලයේ අංශ ප්‍රධානීන් සහභාගී වේ. මේ යටතේ, 2023 වර්ෂය සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 08 ක් පවත්වා ඇති අතර, වියදම් කළ මුදල රු.මි.0.55 කි.

(II) දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

සෑම මාසයකම දිස්ත්‍රික් කාර්යාලවල දිස්ත්‍රික් අධ්‍යක්ෂකගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම් මූලස්ථාන කළමණාකරුවන්ගේ සහභාගීත්වයෙන් සිදු කෙරේ. දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකම ප්‍රගතිය සාකච්ඡා කිරීම මෙහි දී සිදු වේ. 2023 වර්ෂය සඳහා රැස්වීම් 210 ක් පවත්වා ඇති අතර, වියදම් කල මුදල රු.මි.0.59 කි.

(III) වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරීම.

පෙර වර්ෂයට අදාලව ඒ ඒ අංශ මඟින් ක්‍රියාත්මක කරන ලද දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය සාධනය පදනම් කරගෙන වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කරනු ලැබේ. එය පොතක් වශයෙන් සකස් කර සෑම වසරකම අමාත්‍යාංශය හරහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කෙරේ. ඒ අනුව 2022 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව සකස් කර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

2.1.12 වත්කම් කළමණාකරන අංශය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අන්තර්ග්‍රහණය වූ ආයතන සතු වත්කම් 2013 අංක 01 දරන සමාද්ධි පනත ප්‍රකාරව නිරවුල් කර එම වත්කම් ඵලදායි ආකාරයෙන් යෙදවීමත් දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා අවශ්‍ය මූලික සාධකය වන ඉඩම්, ගොඩනැඟිලි හඳුනා ගැනීම. පැවරීම, මිල දී ගැනීම බදු ගැනීම, ඉඩම් ගැටළු නිරවුල් කිරීම, මෙම විෂයට අදාළ සියළු ආයතන සමඟ සම්බන්ධීකරණය හා දෙපාර්තමේන්තුව නමින් පවරා ගන්නා සියළු වත්කම් ඵලදායි ලෙස භාවිතා කිරීම, වත්කම් තක්සේරු කිරීම මෙම අංශය යටතේ ක්‍රියාත්මක වේ.

ඒ අනුව මෙම දෙපාර්තමේන්තුව භාරයේ පවතින ඉඩම් පහත පරිදි දැක්විය හැකිය.

1. රජය සතු ඉඩම්	-	885	
2. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්	-	80	
3. මහවැලි සංවර්ධන අධිකාරිය සතු ඉඩම්	-	41	
4. පළාත් පාලන ආයතන සතු ඉඩම්	-	58	
5. පුද්ගලික ඉඩම්	-	46	
6. වෙනත් ආයතන/ දෙපාර්තමේන්තු/අධිකාරීන් සතු ඉඩම්	-	99	
7. සමාද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් පවරාගත් ඉඩම්	-	196	(2023 වසර අවසානයට)
		1405	

මෙයට අමතරව අළුතින් බැංකු සමිති 03 ක් බැංකු 17 ක් ස්ථාපිත කර ඇත. එ මෙන්ම සුවබොජුන්හල් 31 ට අදාළ ඉඩම පවරා ගැනීම් ද මෙම අංශය මඟින් ආරම්භ කර ඇත. පවරාගත් සංඛ්‍යාව 03 කි සියළු පවරා ගැනීමේ කටයුතු විවිධ මට්ටම්වල ක්‍රියාත්මක තත්වයේ පවති. 2023 වර්ෂ අවසානයට වත්කම් 55ක ප්‍රමාණයක් තකසේරු කර මුදල් අමාත්‍යාංශයේ කොම්ට්‍රෝල ජනරාල් වෙත වාර්තා කර ඇත. එ මෙන්ම අන්තර්ග්‍රහනය වූ අධිකාරීන් සතු වත්කම් රජයට පවරා දියයුතු ආකාරයත් නැවත දෙපාර්තමේන්තුවට පවරන ආකාරයත් සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ, අදාල ආයතන සම්බන්ධීකරණය කොට ලබාගෙන ඇත.

2024 සමෘද්ධි වැඩසටහනේ ඉලක්ක

1. **"**අස්වැසුම**''** සුභසාධක ප්‍රතිලාභී පවුල් ලක්ෂ 03 ක් සවිබලගැන්වීම.
   "අස්වැසුම**"** සමාජ සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ සුභසාධක ප්‍රතිලාභ ලබන පවුල් ලක්ෂ 12 ක් 2024 සිට 2026 දක්වා කාල පරිච්ඡේදය තුල සවිබලගැන්වීමට සැලසුම් කෙරේ. ඒ අනුව, 2024 වර්ෂයේ පවුල් 300,000 ක් සවිබලගැන්වීමට අපේක්ෂිත අතර**,** එම පවුල් සංක්‍රාන්තික **(**Transitional**) ,** අවධානමට ලක් වූ (Vulnerable) **,** දුප්පත් (Poor) හා අන්ත දුප්පත් (Severely Poor) යන පවුල් කාණ්ඩ 04 ට අයත් පවුල් කාණ්ඩ අතරින් තෝරාගැනීමට කටයුතු කෙරේ.

2. **"**අස්වැසුම**''** සමාජ සුභසාධක ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ සැලස්ම ක්‍රියාත්මක කිරීම සඳහා නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**.**
   මෙම නියමු ව්‍යාපෘති විදේශ මුල්‍යාධාර වැඩසටහන් 03 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව**,** ආසියානු සංවර්ධන බැංකු මූල්‍යාධාර යටතේ පවුල් 10,000 ද , ලෝක බැංකු මූල්‍යාධාර යටතේ පවුල් 6,000 ක් සහ ජපන් සමාජ සංවර්ධන අරමුදල් **(**JSDF**)** යටතේ මූල්‍යාධාර යටතේ පවුල් 42,000 ක් සවිබලගැන්වීමට අපේක්ෂිතය.

3. ක්ෂුද්‍රමූල්‍ය ණය වැඩසටහන් යටතේ, දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල් 450,000 කට සමෘද්ධී ප්‍රජාමූල බැංකු පද්ධතිය හරහා ක්ෂුද්‍රමූල්‍ය ණය පහසුකම් ලබා දීම.

4. "සිප්දොර" ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ උසස් පෙළ හදාරන සමෘද්ධිලාභී පවුල්වල දරුවන් 43,000 ක් සඳහා ශිෂ්‍යත්ව ආධාර ලබා දීම.

5. දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල් සඳහා විශේෂ නිවාස වැඩසටහන යටතේ නිවාස 1,410 ක් හා ලොතරැයි දිණුම් ඇදීම යටතේ නිවාස 4,020 ක් නිවාස ආධාර ලෙස ලබා දීම.

6. දිළිඳු හා අඩු ආදායම්ලාභීන් 100,000 ක් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීමට අපේක්ෂා කෙරේ. (උපත්, අසනීප, විවාහ හා මරණ අවස්ථාවල දී මූල්‍යාධාර ලබා දීම.)

7. සමෘද්ධී බැංකු පරිගණකගත කිරීමේ ක්‍රියාවලිය අවසන් කර, සියළු බැංකු ගණුදෙනු නවීන තාක්ෂණය අනුව පරිගණක පද්ධතිය හරහා සිදු කිරීමට කටයුතු කිරීම.

8. අඩු ආදායම්ලාභී ව්‍යවසායක කාන්තාවන් සඳහා "ලිය සවිය" නමින් නව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.

9. රාජ්‍ය සේවකයන් සඳහා සමෘද්ධි බැංකු හරහා නව ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

10. සවිබලගැන්වෙන පවුල් පිළිබඳ තොරතුරු CRM පද්ධතියට ඇතුලත් කිරීම හා ඒ හරහා පවුල්වල ප්‍රගතිය විමර්ශනය කිරීමට කටයුතු කිරීම.

11. නිෂ්පාදන ගම්මාන 200 ක් ක්‍රියාත්මක කිරීම.

12. "අස්වැසුම" ප්‍රතිලාභ නොලබන සමෘද්ධිලාභී පවුල් 747,000 කගේ ආර්ථික හා සමාජීය සංවර්ධනය ඇති කිරීම සඳහා එම පවුල් ඉලක්ක කරගත් ව්‍යාපෘති / වැඩසටහන් හඳුන්වා දීම.

13. අඩු ආදායම්ලාභී පවුල් 1488 කගේ ජීවනෝපාය සංවර්ධනයට කටයුතු කිරීම.

14. පාසල් හැර ගිය තරුණයින් 6,500 සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

15. තරුණ තරුණියන් 500 ක් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම.

16. විදේශ රැකියාගත කිරීමේ අරමුණින් තරුණ තරුණියන් 500 ක් සඳහා විදේශ භාෂා පුහුණුව ලබා දීම.

17. RPL ක්‍රමවේදය යටතේ තරුණ තරුණියන් 200 ක් සඳහා NVQ සහතික පත්‍ර ලබා දීම.

18. ළමයින් සඳහා සංස්කෘතික හා සාක්ෂරතාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික්ක මට්ටමින් වැඩසටහන් 25 ක් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩසටහන් 335ක් ක්‍රියාත්මක කිරීම.

19. දුම්වැටි හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් දිස්ත්‍රික්ක මට්ටමින් වැඩසටහන් 25 ක් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩසටහන් 335ක් ක්‍රියාත්මක කිරීම.

20. දෙපාර්තමේන්තුවේ සියළුම සේවකයින්ගේ තොරතුරු HRM පරිගණක තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීමට කටයුතු කිරීම හා කළමනාකරණ කටයුතු සඳහා භාවිතා කිරීම.

21. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ නොවිසඳුනු වෘත්තීය ගැටළු විසඳා ගැනීමට වැටුප් කොමිෂම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව ඇතුලු අදාල ආයතන සමඟ සාකච්ඡා කර, එම ගැටළු විසඳීමට පියවර ගැනීම.

22. සමාජ ආරක්ෂණ වැඩසටහන බැංකු සාමාජිකයන්ට හඳුන්වා දීම.

23. සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව සෑම සමෘද්ධි බැංකුවක්ම මූලික කරගෙන අලුත් අවුරුදු උත්සව පැවැත්වීම.

24. අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම් හිමියන්ට තම අනිවාර්ය ඉතුරුම් තැන්පතු මුදල ඇපයට තබා ආදායම් උත්පාදන/ දරුවන්ගේ උසස් අධ්‍යාපන/ පාරිභෝගික අවශ්‍යතා වෙනුවෙන් පැන නඟින මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් ණය වැඩසටහනක් හඳුන්වා දීම.



සී.ඩී.කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.

පරිච්ඡේදය -03 –

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

					එෂ්ජ් -එෆ්
	2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය				
සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු.		සටහන	කතා 2023 රු.	2022 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එෂ්ජ්-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
132,511,453,999	භාණ්ඩාගාර අග්‍රිම		132,511,453,999	59,898,610,040	එෂ්ජ්-3
4,548,345,751	තැන්පතු		4,548,345,751	46,363,226,746	එෂ්ජ්-4
420,704,999	අත්තිකාරම් ගිණුම්		420,704,999	222,888,468.00	එෂ්ජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
137,480,504,749	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**137,480,504,749**	**106,484,725,254**	
137,480,504,749	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**137,480,504,749**	**106,484,725,254**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		1,460,199,454	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**136,020,305,295**	**106,484,725,254**	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්		-	-	
19,857,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	16,944,449,748	16,470,680,394	
498,600,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	448,724,239	370,806,839	එෂ්ජ්-2(ii)
110,708,344,506	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	100,186,608,556	37,080,483,053	
-	පොළී ගෙවීම්	8		-	
100,000	වෙනත් පුනරාවර්තන වියදම්	9		-	
131,064,044,506	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**117,579,782,544**	**53,921,970,286**	
	මූලධන වියදම්				
12,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	3,093,811	2,734,980	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	-	958,103	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12		-	එෂ්ජ්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13		-	
3,500,000	හැකියා වර්ධනය	14	2,750,321	1,236,096	
150,000,000	වෙනත් මූලධන වියදම්	15	16,236,809	94,618,476	
166,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**22,080,940**	**99,547,655**	
4,856,273,808	තැන්පතු ගෙවීම්		4,856,273,808	46,441,966,904	එෂ්ජ්-4
412,602,298	අත්තිකාරම් ගෙවීම්		412,602,298	306,462,087	එෂ්ජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
5,268,876,106	**ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)**		**5,268,876,106**	**46,748,428,991**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**122,870,739,590**	**100,769,946,932**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**13,149,565,705**	**5,714,778,322**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		**13,149,565,705**	**5,714,778,322**	එෂ්ජ්-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		180,076,069		එෂ්ජ්-3
			(2,559,868)		

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	සහස්‍ර 2023 රු.	2022 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	2,013,533,830	1,679,988,852
මූල්‍ය වත්කම්			
අන්තර්ගාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	122,927,138	131,029,838
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**2,136,460,967**	**1,811,018,690**
ඉද්ධ වත්කම් / ඍණාන්ධය		-	-
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		(2,331,523,937)	(2,631,349,292)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,013,533,830	1,679,988,852
තුලි හා වැඩ අන්තර්ගාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**	-	-
ණංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	2,454,451,074	2,762,379,130
අනිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**2,136,460,967**	**1,811,018,690**

පිටු අංක 01 සිට 32 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් නොරතුරු සහ ඇමුණුම් පිටු අංක 33 සිට 48 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් නොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාප්තකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙ ෂ් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : ඩබ්.ඒ.සුනිතා පෙරේරා
තනතුර : ලේකම්
දිනය : 2024.02.26

සුනිතා පෙරේරා
ලේකම්
[illegible]

.....
ගණන්දීමේ නිලධාරි
නම : සී.ඩී.කළුආරච්චි
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
දිනය :2024.02.26

සී.ඩී. කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව,
04 වන මහල, 1 වන අදියර,
"[illegible]"

.....
ප්‍රධාන ගණකාධිකාරී
නම : ඩී.ඩී.එම්. ප්‍රදීපිකා ජයරත්න
දිනය :2024.02.26

ප්‍රධාන ගණකාධිකාරී
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
1 වන අදියර, 4 වන මහල,
[illegible]

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තක්ෂ	
	2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,221,041,490	849,936,347
* අග්‍රිම ලැබීම්	132,694,083,936	78,714,274,286
අත්තිකාරම් අයකර ගැනීම්	428,030,099	216,687,068
තැන්පතු ලැබීම්	4,548,345,751	12,989,691,125
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**138,891,501,276**	**92,770,588,826**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	17,332,127,444	15,841,482,225
සහනාධාර සහ මාරුකිරීම්	100,186,608,556	63,081,203,584
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	14,621,475,946	85,517,520
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	1,460,199,454	316,134,657
අත්තිකාරම් ගෙවීම්	412,847,127	215,931,357
තැන්පතු ගෙවීම්	4,856,273,808	12,714,847,116
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**138,869,532,335**	**92,255,116,459.00**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**21,968,941**	**515,472,367**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	21,968,940	515,472,367
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**21,968,940**	**515,472,367**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(21,968,940)**	**(515,472,367)**
(උ)=(ඇ) + (ඊ)	**0**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

*සිගාස් ගිණුම් සරාංශයේ භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් ශේෂයට අදාල අග්‍රිම ගැලපීම නිවැරදි කිරීම සඳහා මාරු පත්‍රය භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇත

3.5. මූල්‍ය ප්‍රකාශ සටහන

3.6. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

සංඛ්‍යා සටහන - (XVIII)

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
	අදාල නොවේ				

3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

සංඛ්‍යා සටහන - (XIX)

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තක්සේරු කළ වියදම (රු.මි.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.මි.)	අවසාන ප්‍රතිපාදනය (රු.මි.)		
පුනරාවර්තන	106,684,000	131,067,244	117,579,782	89.7
ප්‍රාග්ධන	166,000	166,000	22,080	13.3

3.8.මු.රෙ.208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රධානය කරන ලද ප්‍රතිපාදන

සංඛ්‍යා සටහන - (XX)

අ. අං	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තක්සේරු වියදම (රු.මි.)	උපයෝගී කර ගන්නාලද ප්‍රතිපාදන,ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල% ලෙස
			මුල් ප්‍රතිපාදන (රු.මි.)	අවසාන ප්‍රතිපාදන (රු.මි.)		
01	ලෝක ආහාර වැඩසටහනේ සහයෝගීතාව සඳහා වූ හවුල්කාරීත්ව ලේකම් කාර්යාලය	සුළු ව්‍යාපාරිකයන් සවිබලගැන්වීම මූලතිව් දිස්ත්‍රික්කය	229,011	229,011	229,011	100
02	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	ITMIS පුහුණු වැඩසටහන	.355	.355	.355	100
03	කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම අමාත්‍යාංශය	ස්ථානමාරු ලැබ පැමිණි සංවර්ධන නිළධාරීන්ට වැටුප් ගෙවීම	.083	.083	.083	100


04	ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය	ජනවාරි සිට ජූනි දක්වා වැඩිහිටි දීමනා ගෙවීම.	10,585,708	10,585,708	10,585,708	100
05	ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය	ජනවාරි සිට ජූනි දක්වා ආබාධිත හා වකුගඩු දීමනා ගෙවීම.	3,696,506	3,696,506	3,696,506	100
06	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	ශේෂ නිරවුල් කිරීම	106,474	106,474	106,474	100
07	බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව	මාතර පුහුණු මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් ගෙවීම කාර්යාල කාර්ය සහායක දීමනා ගෙවීම.	5,382	5,382	5,382	100

3.9. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

සංඛ්‍යා සටහන - (XXI)

වත්කම් කේතය	**කේත විස්තරය**	**2022.12.31දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය**	**2022.12.31 දිනට භාණ්ඩ මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය**	**ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත**	**ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම**
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	376,359,900	376,359,900	-	100
9152	යන්ත්‍රෝපකරණ	856,506,879	856,506,879	-	100
9153	ඉඩම්	780,668,050	780,668,050	-	100
9154	අස්පෘශ්‍ය වත්කම්	-			-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව.



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. LSW/A/SDD/2023/FS

ඔබේ අංකය / உமது இல. / Your No

දිනය / திகதி / Date 2024 මැයි 28දින

29 MAY 2024

ගණන්දීමේ නිලධාරී
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

ඔිර්ෂය 331 - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තක්ස්ථාගණනය කළ මිතය

ඔිර්ෂය 331 - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තක්ස්ථය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ඔිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තක්ස්ථය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ඔිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තක්ස්ථයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාරෝපණය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාරෝපණය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එම ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකපිලිසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂාවන් සැලසුම් කිරීම මඟින් අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- නෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල වැදගත්කම සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව සැලැයිම.

- මූල්‍ය ප්‍රකාශනවල වැදගත්කම හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ නෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනොකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ආ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
2.3 (අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික විමි කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුයි.
2.4 අ (i)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි 135 හා 381 (i) ප්‍රකාරව පුහුණු මධ්‍යස්ථානවල සියලම කාර්යයන් මූල්‍ය පාලන බලතල පවරා දීමකින් තොරව අනුයුක්ත කාර්ය මණ්ඩලය විසින් සිදු කර තිබූ අතර පුහුණු මධ්‍යස්ථාන 03 ක භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව බැංකු ජංගම ගිණුම් පවත්වා ගෙනගොස් තිබුණි.	මූදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි.
2.5 අ	2013 අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසයන්හි සහනාධාර	ශේෂ නිරවුල්

	ගෙවීම සඳහා එවකට සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සමෘද්ධි අධිකාරියෙන් ලබාගත් රු.මිලියන 2,374 ක මුදල වසර 8 කටත් අධික කාලයක් ගත වී ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	කිරීමට කටයුතු කළ යුතුයි.
2.6	සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතුරුම් ගිණුම්වල පවතින මුදල් හා විවිධ අරමුණු සඳහා පිහිටුවා ඇති දෙපාර්තමේන්තුවේ පවතින අරමුදල් ගිණුම්වලින් එකී අරමුණු වලින් බැහැරව රු. මිලියන 53,594.67 ක් රජයේ විවිධ අවශ්‍යතා සඳහා ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට මෙම මුදලින් රු. මිලියන 53,294.97 (පොලී සහිතව) පවදුරටත් අයවීමට තිබුණි.	ඉහිරි මුදල අය කර ගැනීමට කටයුතු කළ යුතුයි.
2.7 (අ)	සේවක ණය වළක්වා ගිණුමට අදාල 2022 දෙසැම්බර් බැංකු සැසඳුම් පරීක්ෂාවේදී වර්ෂ 4 සිට වර්ෂ 8 දක්වා කාල පරාසයක් තුළ තැන්පත්කල නමුත් උපලබ්ධි නොවූ රු. 2,668,654 ක් වටිනා චෙක්පත් 84 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි.
3.5	සමෘද්ධි බැංකු හා බැංකු සමිතිවල 2014-2018 කාලය තුල සිදුවූ වටිනාකම් රු. 115,723,619 ක් වූ වංචා 135 ක් පිළිබඳ 2018 සහ 2019 විගණකාධිපති වාර්තාවලින් පෙන්වාදී තිබුණි. 2023 අප්‍රේල් 21 දින විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2014-2018 කාල පරිච්ඡේදය සඳහා වංචා 15ක් වෙතුවෙන් රු. 63,817,207 ක් ද 2019 සිට 2023 පෙබරවාරි දක්වා වංචා 92 ක් වෙතුවෙන් රු. 172,189,227ක් ද හඳුනාගෙන තිබුණි. සියළු සමෘද්ධි බැංකු හා බැංකු සමිති පරිගණක ක්‍රියාවලියට යටත් කිරීම සිදු කරමින් ගනුදෙනු කරුවන්ගේ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කිරීමත් එමෙන්ම අතින් (Mannual) සිදු කිරීමේදී සිතාමතා සිදු කරන වැරදි හා මුල්‍ය වංචා අවම කරගැනීමට අපේක්ෂා කළද වාර්තාවී ඇති මුල්‍ය වංචා හා අක්‍රමිකතා ප්‍රමාණාත්මක අගයක් ගෙන තිබුණි.	මුල්‍ය වංචා අවම කර ගැනීමට කටයුතු කළ යුතුයි.
3.6.1 (ඇ)	සමෘද්ධි ප්‍රජා මූල බැංකු ඉණුදෙණු කාර්යක්ෂමව කිරීම සඳහා Soft Watch හා SLTS වශයෙන් මෘදුකාංග දෙකක් හඳුන්වා දී තිබුණි. සමෘද්ධි බැංකු ශාඛා 1026 ක් මෙම මෘදුකාංගය භාවිතා කරනු ලබන අතර ප්‍රධාන කාර්යාලය සමඟ ඒකාබද්ධ නොවූ ශාඛා 12 ක් විසින් වසර 10 ත් වඩා පැරණි මෘදුකාංගයකින් කටයුතු සිදු කරනු ලබයි. පද්ධතිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ප්‍රජා මූල බැංකු 9 ක සිදුකළ නියැදි පරීක්ෂාවේදී පහත අඩුපාඩු පවතින බව නිරීක්ෂණය විය. දිනකට සීමිත මුදල් ගෙවීම් ප්‍රමාණයක් පමණක් ක්‍රියාත්මක කළ හැකි වීම තුළින් පද්ධතිය මන්දගාමී වීම, ණය අයවීමේදී ක්‍රමවත් බවක් නොවීම ,ගිණුම් ශේෂ නිවැරදි නොවීම, පෙර ගනුදෙනු පරීක්ෂා කළ නොහැකි වීම, පරිගණක පද්ධතිය වේගෙන් වැටීම, බැංකුවේ සජීවී දත්තවලට ඇතුල් වීමේ හැකියාව මෘදුකාංග ආයතනයට තිබීම හේතුවෙන් දත්ත වෙනස්කළ අවස්ථා පැවතීම හා පරිගණක පද්ධතිය මඟින් සහනාධාරලාභීන්ගේ ගිණුම්වලට බැරවන මුදල් වලින් ස්වයංක්‍රීයව ණය අය කර ගැනීමට ඉඩ පහසුකම් සලසා තිබීම හේතුවෙන් ප්‍රජාමූල බැංකු 05 කට අයත් සහනාධාරලාභීන් 173 දෙනෙකුගේ ගිණුම්වලට බැර වූ සහනාධාර	බැංකු පද්ධතිය තුල පවතින අඩුපාඩු අවම කිරීමට කටයුතු කළ යුතුයි.

මුදල් රු.3,857,777 ක් ණය වාරික ලෙස අය වී තිබූ අවස්ථා නියැදි විගණනයේදී නිරීක්ෂණය විය.

3.6.2 (අ)	2013 අංක 1 දරන දිවිනැගුම් පනතේ 36 වගන්තිය යටතේ දිවිනැගුම් සංවර්ධන අරමුදල පිහිටුවනු ලැබිය යුතු වන අතර දෙපාර්තමේන්තුවට ලැබෙන සියළු ප්‍රදාන, තෑගි පනත යටතේ පිහිටුවන ලද බැංකු හා බැංකු සමිති විසින් තෑගි වෙනත් දායක මුදල්, බැංකු වල ලාභයෙන් අමාත්‍යවරයා නිශ්චය කරනු ලබන මුදල් ප්‍රතිශතයක් වශයෙන් සියළු ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වේ. ඉන් පසුව පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව දිවිනැගුම් සංවර්ධන අරමුදලට බැරකල යුතු වූවත් දිවිනැගුම් සංවර්ධන අරමුදල මේ දක්වා පිහිටුවා නොතිබුණි.	දිවිනැගුම් පනත ප්‍රකාරව කටයුතු කල යුතුයි.
3.6.2 (ආ)	උක්ත පනතේ 45 වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් අරමුදල් 6 ක් පවත්වාගෙන යනු ලබන අතර සමෘද්ධි අරමුදල හා සේවක ණය වත්‍රීය අරමුදල මේ වන විට අත්‍රීය තත්ත්වයේ පැවතුණි.	වත්‍ර ලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුයි.
4 (ඇ)	2019 ජූලි 05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය අනුව 2013 අංක 1 දරන දිවිනැගුම් පනතේ 25 (3) වගන්තිය අනුව ප්‍රජාබල බැංකු කාර්යමණ්ඩලය සඳහා විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවකයින් ස්ථිර පදනමින් පත්කිරීම නීතියට පටහැනි බව ගරු නීතිපති තුමා විසින් දැනුම් දී ඇති බවත්, ප්‍රජා මූල බැංකු සමිතිවල දැනටමත් සේවයේ යෙදී සිටින දිවි නැගුම් පනතේ 44 (ඉ) හා ii යටතේ දෙපාර්තමේන්තුවේ සේවයට එක් වූ නිලධාරීන් තාවකාලික පදනමින් එම ආයතනවලට මුදා "හැර ඇති බවට සැලකිය යුතු වන අතර, ඉදිරියේදී බැංකු කාර්ය මණ්ඩලය සඳහා වෙනම තනතුරු අනුමත කරවා ගැනීමටත් ඉන් අනතුරුව පූරප්පාඩු වන තනතුරු සඳහා ඒ අනුව බඳවා ගැනීම් කිරීමට කටයුතු කළ යුතු බව දැක්වුවද, මේ දක්වා ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබූ අතර බැංකු කාර්ය මණ්ඩලය 7605 ක් සඳහා දෙපාර්තමේන්තු වැය විෂයයෙන් වැටුප් ගෙවා තිබුණි. 2022 වර්ෂය සඳහා ගෙවා ඇති මුදල රු මිලියන 4,259.25 ක් විය.	බැංකු පද්ධතිය සඳහා වෙනම කාර්ය මණ්ඩලයක් පත් කල යුතුයි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ප්‍රතිශෝධන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ (ACA-F) සංශෝධිත අයවැය ප්‍රතිපාදන නිරූවට, වාර්ෂික අයවැය ප්‍රතිපාදනවලට මි.රෙ. 66 හා 69 මඟින් මාරුකිරීම් හා පරිපූරක ප්‍රතිපාදන ගැලපීමෙන් පසු අගය යොදාගත යුතු වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ප්‍රතිශෝධන වියදම් සටහන 5 යටතේ වූ මි.රෙ. 66 මාරුකිරීම රු. 1,500,000 ක් ගලපා නොතිබුණි.

(ආ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි සටහන 7 යටතේ සහනාධාර ප්‍රදාන සහ මාරුකිරීම් තත්‍ය වියදම් වශයෙන් වැඩසටහන් 02 හි වැය විෂය 1501, 1502 හා 1506 හි වියදම් එකතුව හා වැඩසටහන් 01 හි 1506 වැය විෂයෙහි වියදම් රු. 100,186,608,556 ක් දක්වා තිබුණද. සටහන 07 හි එම වියදම් වල සංශෝධන

අයවැය නිරූවෙහි රු 110,708,344,506 ක් ලෙස දක්වා තිබුණි ඒ අනුව 1506 වැය විෂය යටතේ වූ ශුද්ධ ප්‍රතිපාදනය රු. 1,800,000 ක් දක්වා නොතිබුණි.

1.6.2 අත්තිකාරම් ගෙවීම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2023 නොවැම්බර් 07 දිනැති රාජ්‍ය මූල්‍ය මාර්ගෝපදේශ අංක 03/2023 හි අංක 5 ඡේදය අනුව මාර්ගෝපදේශ අංක 02 හි සඳහන් උපදෙස්වලට අනුකූලව අත්තිකාරම් මූල්‍ය සම්බන්ධයෙන් වූ පාලන මූල්‍ය භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමඟ නොපමාව සැසඳිය යුතු වුවත් අත්තිකාරම් බී මූල්‍යමේ ශේෂය හා භාණ්ඩාගාර පොත් සමඟ රු. 20,487,625 ක වෙනසක් පැවති අතර එයින් රු. 716,896 ක් හඳුනාගෙන නොතිබුණි.

(ආ) 2023 දෙසැම්බර් 31 දිනට සේවකයින් 67 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව රු. 1,654,710 ක් වසර 01 සිට වසර 05 කට අධික කාලයක් හිඟ හිට පැවතුණි. මෙම ණය ශේෂය තුළ වසර 3 ක් 5 ක් අතර හිඟ හිටි ශේෂය රු. 563,344 ක් ද වසර 1 ක් 3 ක් අතර හිඟ හිටි ශේෂය රු. 85,595 ක් වශයෙන් පැවතුණි. මේ සම්බන්ධයෙන් 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මූදල් චක්‍රලේඛ 01/2020 මාර්ගෝපදේශ අංක 01 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය නත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන ACA -6 යටතේ දේපළ පිරියත උපකරණ මුළු වටිනාකම රු. 2,013,533,830 ක් ලෙස දක්වා තිබුණද වෙනත් යන්ත්‍රෝපකරණ අපහරණ වටිනාකම රු. 110,838 ක් අපහරණය යටතේ ඇතුළත් නොකිරීම හේතුවෙන් එම අවසාන ශේෂය සහ දේපළ පිරියත උපකරණ මුළු වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2023 නොවැම්බර් 01 දිනැති අංක 04/2023දරන රාජ්‍ය මූල්‍ය මාර්ගෝපදේශයේ 3.9 ඡේදය හා 2023 ඔක්තෝබර් 03 දිනැති රාජ්‍ය මූල්‍ය මාර්ගෝපදේශ අංක 2023/02 අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ප්‍රධාන මූල්‍ය නිලධාරීන්, ප්‍රධාන ගණකාධිකාරිවරුන් හා ගණකාධිකාරිවරුන් මූල්‍ය නොවන වත්කම්හි මූල්‍යමය නිවැරදිභාවය පිළිබඳ විශේෂ අවධානය යොමුකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර මූල්‍ය නොවන වත්කම් නිසි පිරිදි මූල්‍යගත නොකිරීමෙන් පෙර වර්ෂයේ අවසාන ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ අතර රු. 964,500 ක වෙනසක් නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වියදම් සඳහා නිසි පරිදි ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 4 ක රු මිලියන 7.1 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) අපේක්ෂිත වැය නොදැරීම, ප්‍රතිපාදන උපයෝජනය කර නොගැනීම හේතුවෙන් වැය විෂයන් තුනක ප්‍රතිපාදන ඉතිරිය සියයට 37 සිට සියයට 75 ක පරාසයක පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල වැය විෂය අංක 331-2-2-3-2509 යටතේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන මුදල රු. 150,000,000 ක් වුවත් වියදම් කර තිබූ මුදල රු. 16,236,809 ක් පමණක් විය. ඒ අනුව ඉතිරිය සියයට 89 ක් ව පැවතුණි. ඉතිරි කිරීම් වලට හේතූන් ලෙස බැරකම් සඳහා පමණක් අක්මුදල් නිදහස් කිරීම දක්වා තිබුණ ද, 2022 දෙසැම්බර් 17 දිනැති 2022/9 දරන අයවැය වක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව වියදම් සම්බන්ධයෙන් බැදීම් ඇතිකර ගැනීමට ප්‍රථම ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන පවතින බවට අක්මුදල් ලබා ගැනීමේ නැකියාව තහවුරු කර ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මේ සුදහන් අපේක්ෂිත වැඩසටහන් 8 ක්ම ඉටුකිරීමට නොහැකි වී තිබුණි.

2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි	
(i) මුදල් රෙගුලාසි 135 හා 381 (i)	සුහුණු මධ්‍යස්ථානවල සියළුම කාර්යයන් මූල්‍ය පාලන බලතල පවරා දීමකින් තොරව අනුයුක්ත කාර්ය මණ්ඩලය විසින් සිදු කර තිබූ අතර සුහුණු මධ්‍යස්ථාන 03 ක භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව බැංකු ජංගම ගිණුම් පවත්වා ගෙනගොස් තිබුණි.
(ii) මුදල් රෙගුලාසි 396	1. දිස්ත්‍රික් කාර්යාලවල බැංකු සැසඳුම් පරීක්ෂාවේදී 2023 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර මාස 6 ඉක්ම වූ එකතුව රු 7,090,372 ක් වූ චෙක්පත් 139 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි. මෙම වටිනාකම් තුල මහනුවර දිස්ත්‍රික් කාර්යාලයට අයත් 2015 පෙබරවාරි -2016 ජූලි දක්වා වටිනාකම් රු3,888,099 ක් වූ චෙක්පත් 26 ක් නිකුත් කර ඇත්තේ කාගටද යන්න තහවුරු කරගෙන නොතිබුණි.

II. සේවක ණය වළිය ගිණුමට අදාල 2023 දෙසැම්බර් බැංකු සැසඳුම් පරීක්ෂාවේදී වර්ෂ 5 සිට වර්ෂ 9 ක් දක්වා කාල පරාසයක් තුළ කැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ එකතුව රු. 1,559,536 ක් වටිනා චෙක්පත් 67 ක් හා වසර 6 ක් ඉක්ම වූ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු. 180,000 ක් වටිනා චෙක්පතක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2020 ඔක්තෝබර් 02 දිනැති චක්කම් කළමනාකරණ චක්‍රලේඛ 05/2020 02 (අ) අපහරණයට සුදුසු තත්ත්වයේ පවතින වටිනාකම රු5,180,000 ක් වූ වාහන 3 ක් හා දීර්ඝ කාලයක් තිස්සේ කාර්මික දෝෂවලට ලක්ව ගරාජවල ගාල් කර ඇති හා ඩෙන්සිල් කොඩිබැකවුව මාවසේ ගබඩා පරිශ්‍රයෙහි ගාල්කර ඇති වටිනාකම රු. 20,992,500 ක් වූ වාහන 7 ක් අළුත්වැඩියා වශයෙන් භදනාගෙන නිබුණි. අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන තත්ත්වයේ පැවතියද 2023 වර්ෂයේ මෙම වාහන සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි.

2.4 අවධිමත් ගණුදෙනු

(අ) දෙපාර්තමේන්තුව සතු අනුමත නොවූ අරමුදල්

I. දෙපාර්තමේන්තුවේ බැංකු ශේෂ අංශය සතුව රක්ෂණ අරමුදල් ද ඇතුළුව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 15 ක් පවතින අතර ඉන් දැනට අරමුදල් 9 ක් ක්‍රියාත්මක නොවන අතර ක්‍රියාත්මකව පවතින්නේ අරමුදල් 6 ක් පමණි. මෙම සියළු අරමුදල් වල පවතින මුදල් බැංකු ශේෂ අංශය විසින් ආයෝජනයන් සිදුකර තිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට පොලී මුදලද ඇතුළුව සමස්ථ ආයෝජන අරමුදල රු බිලියන 49.5 ක් වී තිබුණි.

II. දිවිනැගුම පනතේ 44 (ආ) වගන්තිය ප්‍රකාරව ඉවත් කරන ලද පනත් යටතේ පිහිටුවන ලද සමෘද්ධි සංවර්ධන අධිකාරිය,දක්ෂිණ සංවර්ධන අධිකාරිය උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරි වලට අයත්වන්නාවූ සියළු නිශ්චල හා චංචල දේපල රජයට පවරාදීය යුතු බව සඳහන් කර ඇත. ඉහත ආයතන වල ස්ථාවර වත්කම් සමෘද්ධි දෙපාර්තමේන්තුවට පවරාගෙන නිබූ අතර ඉහත සඳහන් අරමුදල් වල ශේෂයන්ද දෙපාර්තමේන්තුවට පවරාගෙන ස්ථාවර කැන්පත් වශයෙන් මේ දක්වා බැංකු ශේෂ අංශය යටතේ රඳවාගෙන නිබුණි. මෙම අරමුදල් පිළිබඳ දෙපාර්තමේන්තු වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වලද ඇතුලත් කිරීමට නොහැකි අතර මෙම කිසිදු අරමුදලක් සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

III. ක්‍රියාත්මක නොවන අරමුදල් පනතේ උක්ත වගන්තිය ප්‍රකාරව හා 2020 අගෝස්තු 28 දිනැති අංක 2020/1 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 15 (2) (ඇ) ඡේදය ප්‍රකාරව කටයුතු අවසන් කෙරෙන අරමුදල් වලින් ගෙවීමට ඇති මුදල් හා අනෙකුත් වගකීම් නිරවුල් කිරීමෙන් පසුව ඉතිරි වන මුදල් ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට හා භාණ්ඩ ආයතන වල සිදුකරන ලද ආයෝජන කල් පිරුණු වහාම ඒකාබද්ධ අරමුදලට මාරුකිරීමට හෝ ක්‍රියාත්මක වන අරමුදල් ව්‍යවස්ථාපිත කොට විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් කිරීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවා වසර 10 ක් ගතවී තිබුණද නොහැකිවී තිබුණි. ඒ අනුව මෙමඟින් රාජ්‍ය මුදල් අවභාවිතාවී ද යන්න පරීක්ෂා කල නොහැකි අතර මෙම මුදල් රාජ්‍ය මූල්‍ය පාලනයෙන් ද බැහැරවී ඇත.

IV. රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 II කොටස 3.1 ඡේදය පරිදි රාජ්‍ය ආයතනවලට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී සිටින රක්ෂණ සේවා සම්පාදකයින් වෙතින් හෝ ඔවුන්ගේ නියෝජිතයින්/ තැරැව්කරුවන් වෙතින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ කරඅකාරී මිල ගණන් කැඳවීම මඟින් සාමාන්‍ය රක්ෂණාවරණ ලබාගත හැකිය. ආයතන ප්‍රධානීන් විසින් රක්ෂණ සේවා ලබාගැනීමේදී අනෙකුත් කරුණු අතර අදාල පිරිවැය, ආවරණ කරනු ලබන අවදානමේ ස්වභාවය සහ සේවාවේ ගුණාත්මකභාවය මෙන්ම ආයතනයට මෙම සේවාව ලබා ගැනීමේ පහසුව යන කරුණු සලකා බැලිය යුතු වුවද, කළමනාකරණ මණ්ඩලය විසින් විවිධ අවස්ථාවල රක්ෂණ ක්‍රම අනුමත කර තිබුණු අතර රජය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට අනුගත නොවී විනිවිදභාවයකින් තොරව හා රක්ෂණ මූලධර්ම වලට අනුකූල නොවන ලෙස එම රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කර වන්දි ගෙවීම්ද සිදුකර තිබුණි. ඒ සඳහා අරමුදල් ගිණුම් ද පවත්වාගෙන ගොස් තිබුණ ද එම ගිණුම් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. රක්ෂණ අරමුදලින් රු. මිලියන 548.6 ක් වූ ස්ථාවර තැන්පත් දෙපාර්තමේන්තුවේ බැංකු මූල්‍ය අංශය විසින් රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පත් ලෙස ආයෝජනය කර තිබුණි.

V. ප්‍රජාමූල බැංකුවකින් රු. 40,000 ක් හා ප්‍රජාමූල බැංකු සමිතියකින් රු.25,000 බැගින් රැස්කොට කොවිඩ් රෝගයෙන් මියගිය එක් නිලධාරියෙකු වෙනුවෙන් මිලියන 01 ක වන්දියක් ලබාදීමට 2021 ජූනි 01 දිනැති අංක 21/88/03 දරන කළමනාකරණ මණ්ඩල තීරණය මඟින් ශාරීරික අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමයක් සඳහා අනුමතිය ලබාදී තිබුණි. ඒ අනුව 2022 වර්ෂය තුල මියගිය නිලධාරීන් වෙනුවෙන් රු මිලියන 21.79 ක වන්දි මුදලක් මෙම අරමුදලින් අවිධිමත් ලෙස ගෙවා තිබුණි.

VI. බැංකු මූල්‍ය අංශයේ 2023 වර්ෂයේ වියදම් ඇස්තමේන්තුව රු. මි. 2496 ක් වූ අතර සම්ප්‍රේ වියදම් රු මි.3443 ක් වී තිබුණි. බැංකු මූල්‍ය අංශය විසින් වාර්ෂිකව වෙනම වියදම් ඇස්තමේන්තුවක් සකස් කර තිබුණු අතර වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශනද සකස් කරනු ලබයි. මෙසේ දෙපාර්තමේන්තු වැය විෂයයෙන් වැටුප් ලබන නිලධාරීන් අනුයුක්තව සිටින දෙපාර්තමේන්තුවේම එක් අංශයක් විසින් නීතාානුකූල නොවන ලෙස වෙනම අයවැය ලේඛනයක්, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා වියදම් දැරීම සිදු කර තිබුණි.

VII. 2023 දෙසැම්බර් 31 දිනට සමෘද්ධිලාභීන්ගේ සහනාධාර මුදලින් අනිවාර්ය ඉතුරුම් ලෙස රඳවාගෙන බැංකු මූල්‍ය අංශය සතුව රු.33,335,147,589 ක් වූ අනිවාර්ය ඉතුරුම් මුදල් පවතින අතර මෙම වටිනාකමින් රු.29,511,452 ක් හඳුනා නොගත් අනිවාර්ය ඉතුරුම් මුදලක් විය. මෙම සියළු මුදල් ආයෝජන වශයෙන් තැන්පත් කර තිබුණු අතර එම ප්‍රමාණය රු.43,472,014,278 ක් වේ. 2023 දෙසැම්බර් 31 දිනට ආයෝජන පොළිය රු.2,819,900,095 ක් වේ. බැංකු මූල්‍ය අංශය විසින් 2023 වර්ෂය තුලදී සියයට 11 සිට සියයට 26 දක්වා පොලී අනුපාත යටතේ අනිවාර්ය ඉතුරුම් මුදල් ආයෝජන කර ඇතත් බැංකු වෙත ලබා දී ඇත්තේ සියයට 5 ක් වැනි අඩු පොලී අනුපාතයකි. නමුත් බැංකු විසින් අනිවාර්ය ඉතුරුම් සඳහා සමෘද්ධිලාභීන් වෙත ගෙවිය යුතු පොලිය 2022/108/01 දරන කළමනාකරණ තීරණය ප්‍රකාරව සියයට 4 කි. ඒ අනුව බැංකු වෙත හිමිවන ලාභ කොටස සියයට 1 පමණ වේ. අනිවාර්ය ඉතිරිකිරීම් මුදල් සම්පූර්ණ බැංකුව වෙත ප්‍රේෂණය නොකර බැංකු මූල්‍ය අංශය තුළ රඳවාගෙන ආයෝජනය කිරීම තුළින් ප්‍රජාමූල බැංකුව විසින්ම ආයෝජනය කර ලබාගත හැකි පොලී ආදායමට වඩා අඩු පොලියක් හිමිවීම හා එම මුදල් ජනතාවගේ ජීවනෝපාය සංවර්ධන කටයුතු වෙනුවෙන් ණයට දීමේ හැකියාව අවම වීම වැනි අවාසි සහගත තත්වයක් ද උදා වී තිබුණි.

VIII. මීට අමතරව දෙපාර්තමේන්තුව යටතේ පවතින මහා සංගමය ට වෙන්වූ අරමුදලක් පවත්වා තිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට ඒම අරමුදල සතු ආයෝජනය රු මිලියන 8 කි.

(ආ) බැංකු මූල්‍ය අංශය සතු අරමුදල් වලින් සේවකයින් සඳහා ණය ලබාදීම පහත පරිදි සිදුකර තිබුණි.

I. දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රජාමූල බැංකු, දිස්ත්‍රික් කාර්යාල හා බැංකු මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයට පටහැනිව සේවක පරිභෝගික ණය, සේවක නිවාස ණය, විශේෂ සේවක ණය හා විශේෂ ආපදා ආදි වශයෙන් සේවක ණය යෝජනා ක්‍රම මඟින් ණය ලබා දී 2023 දෙසැම්බර් 31 දිනට රු බිලියන 14.2 ක මුදලක් (පිටඉිටි ශේෂය) අයවීමට තිබුණි. මෙම සේවක ණය වලින් රු මිලියන 290. 6 ක මුදලක් ගෙවීම් පැහැරහැරීම් හේතුවෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු නොකර බොල්ණය ලෙස වෙන් කිරීම් කර තිබුණි.

II. ණය යෝජනා ක්‍රම යටතේ නිවාස ණය ලබාගත් නිලධාරීන්ගෙන් ණය ලිපිගොනු පරීක්ෂාවේදී දේපළ ණය වෙනුවෙන් උකස් වශයෙන් තබාගන්නා ලද උකස්කරය ඇතුළු සියළුම නීතානුකූල ලේඛන සහ වෙනත් ලියවිලි ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 11.14 ඡේදය ප්‍රකාරව මාණ්ඩලික නිලධාරියෙකු භාරයේ ඡේප්පුවක තැබිය යුතු වුවද එම ලියවිලි අදාළ නිලධාරියාගේ ණය ලිපිගොනුව තුළ තබා තිබුණු අතර එම ණය ලිපිගොනු ඉබි යතුරු රඳින අනාරක්ෂිත කබඩවල තබා තිබුණි. විගණනය විසින් පරීක්ෂාවට ලක්කළ ලිපිගොනු 59 කින් ලිපිගොනු 31 ක් අස්ථානගතව තිබුණි.

III. දෙපාර්තමේන්තුවේ මුදල් අංශය යටතේ පවතින සේවක ණය වක්‍රීය අරමුදලේ 2023 ජුනි 30 දිනට අයවිය යුතු ණය ශේෂ රු.30,449,227 ක් වන අතර 2020 වර්ෂයේ සිට මෙම වක්‍රීය ණය යෝජනා ක්‍රමය අත්හිටුවා තිබුණි. සේවකයින්ගෙන් රැස්කර ගන්නා මුදලින් රු. මිලියන 186 ක මුදලක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. සමෘද්ධි අධිකාරිය පැවති කාලයේ සිය පැවත එන මෙම අරමුදලේ 2014 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශ සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

IV. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු සේවකයන්ගේ හදිසි මූල්‍ය අවශ්‍යතා සඳහා උපරිම රු. 100,000 ට යටත්ව පාරිභෝගික ණය ක්‍රමය හදුන්වාදී තිබුණි. 2019 ඔක්තෝබර් 15 දිනැති 2019/3 වක්‍රලේඛයේ 3.7 ඡේදය ප්‍රකාරව ණය ඉල්ලුම් කරන බැංකුවේ කළමනාකරුගේ දැනුම්දීම් අනුව ණය මුදලට අදාල පොලිය හා වාර්ෂික වැටුප් පිළියෙල කරන ස්ථානය මඟින් ණය දෙනු ලබන බැංකු වෙත මාසිකව එව්මට කටයුතු කළ යුතු වුවත් මහතුවර දිස්ත්‍රික්කයේ බැංකු 3 ක නිලධාරීන් 14 දෙනෙකුගේ ණය වාරික අමාණ්ඩව අය නොවන අතර ඉහත වක්‍රලේඛයේ 2(අ) 3.3 ඡේදය ප්‍රකාරව ණය ආපසු ගෙවීමේ උපරිම කාල සීමාව මාස 36 ක් වුවත් ප්‍රජාමූල බැංකු 4 ක නිලධාරීන් 14 දෙනෙකුගෙන් ණය පියවිය යුතු උපරිම සීමාව ඉක්මවා තිබුණද තවදුරටත් අයවිය යුතු රු. 465,353 ක මුදලක් විය.

(ඇ) නිරවුල් නොකළ ශේෂ

I. සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතුරුම් ගිණුම්වල පවතින මුදල් හා විවිධ අරමුණු සඳහා පිහිටුවා ඇති දෙපාර්තමේන්තුවේ පවතින අරමුදල් ගිණුම්වලින් රු.බිලියන 53.6 ක් රජයේ විවිධ අවශ්‍යතා සඳහා ලබා දී තිබුණි 2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයෙන් තවදුරටත් අයවිය යුතු මුදල රු. බිලියන 35.5 කි.

II. ඉහත වටිනාකම් තුල 2020 වර්ෂයේදී ජීවන තත්ත්වය යථා පරිදි පවත්වාගෙන යාමේ අරමුණින් අඩු ආදායම් ලාභී පවුල් වෙත රු. 5,000 ක දීමනාවක් ලබාදීම සඳහා බැංකු පද්ධතිය තුලින් රු. මිලියන 32,418 ක මුදලක් ලබාගෙන 2023 දෙසැම්බර් 31 දින වන විට වසර 03 කට වැඩි කාලයක් ගත් වී තිබූ නමුත් සමෘද්ධි ප්‍රජාමූල බැංකු වෙත එම මුදල් ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) අරමුදල් වලින් පුද්ගලික සමාගමක කොටස් මිලදී ගැනීම

මහ සංගම අරමුදල් අධ්‍යක්ෂ ජෙනරාල්වරයා අනුමත බැංකුවක තැන්පත් කළහැකි වුවත් ඊට පවතිනිව බැංකු මූල්‍ය අංශය විසින් 2003 වර්ෂයේදී පෞද්ගලික බැංකුවක රු. 10 බී කොටස් 555,788 ක් රු. 14.50 බැගින් මිලදී ගැනීමට රු. 80,579,226 ක් වැය කර තිබුණි. මෙම කොටස් සඳහා රු. 55,571,188 ක ප්‍රසාද කොටස් ද හිමිවී තිබුණි.

2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

(අ) 2023 ඔක්තෝබර් 23 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2023/02 හි 5 ඡේදයෙහි (iii) කරුණ පරිදි තක්කාර්ය අතුරු අග්‍රිම නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා නිසි ඇස්මේන්තුවකින් තොරව නිකුත් කිරීම හේතුවෙන් අදාළ මුදල් වලින් සැලකිය යුතු ප්‍රමාණයක් උපයෝජනය නොකල අවස්ථා 16 කදී ලබා දී තිබූ මුදල රු. 770,630 ක් වූ අතර අත්තිකාරම් මුදල් වලින් රු. 517,319 ක් ආපසු පියවා නොතිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 5 ඡේදයෙහි (iv) පරිදි හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2022 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මු.රෙ. 371 (5) ප්‍රකාරව තක්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්ය නිම වී දින 10 ක් ඇතුළත පියවීම සිදු කළ යුතු වුවත් අවස්ථා 5 කදී ලබාගත් අතුරු අග්‍රිම පියවීම් සඳහා දින 25 සිට මාස 5 ක් දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.

2.6 තැන්පතු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පොදු තැන්පත් ගිණුම් කාල විශ්ලේෂණ වාර්තා අනුව 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාල වල නිරවුල් නොකොට ඉදිරියට ගෙන එමින් පැවති තැන්පතු අවුරුදු 2 ට වැඩි නිරවුල් නොකළ ශේෂය රු. 2,378, 777,131 කි. ඉන් අවුරුදු 2-5 අතර ශේෂය රු. 3,079,925 ක් ද අවුරුදු 5 ට වැඩි ශේෂය රු. 2,375,697,206 ක් ද විය.

(ආ) 2019 වර්ෂයේ සිට විවිධ සැපයුම් හා සේවා සඳහා ප්‍රසම්පාදන සඳහා ඇප තබන ලද ආපසු ගෙවිය යුතු තැන්පතු රු. 804,722 ක් නිරවුල් නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

දෙපාර්තමේන්තු ගණකාධිකාරිවරයාගේ අධීක්ෂණය නොමැතිව බැංකු මූල්‍ය අංශය යටතේ ජංගම ගිණුම් 11 ක් හා මහා සංගමය නමින් ජංගම ගිණුම් 2 ක් හා ඉතිරි කිරීමේ ගිණුමක් පවත්වාගෙන ගොස් තිබුණි. මෙම ගිණුම් වල 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු මිලියන 42 කි. මුදල් රෙගුලාසි 381 ප්‍රකාරව මෙම කිසිදු ජංගම ගිණුමක් සම්බන්ධයෙන් භාණ්ඩාගර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

මාතලේ දිස්ත්‍රික්කය තුළ 2021 වර්ෂයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 11 ක් ජීවනෝපාය විශේෂ ව්‍යාපෘති සඳහා රු. 3,708,710 ක් වැයකර තිබුණි. මේ සමඟ සිදුකළ භෞතික පරීක්ෂාවේදී රු. 2,094,825 ක් ලබාදුන් උපකරණ නිෂ්කාර්යව පැවතුණ අතර රු. 275,662 ක උපකරණ කැඩී තිබුණි. රු. 184,350 ක උපකරණ විකුණා හා උකස් කර තිබුණු අතර රු. 134,273 ක උපකරණ විගණන අවස්ථාවල භෞතිකව නිරීක්ෂණය නොවිය. සත්ව පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. 866, 485 ක් වැයකර ලබාදුන් කුකුල් පැටවුන් 786 න් 661 ක් ද එළුවන් 10 න් 6 ක් හා එලදෙනුන් 4 න් 3 න් දෙනෙකු ද මිය ගොස් තිබුණි.

3.1.2 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දේශීය ආහාර සුරක්ෂිතව ඉහත නැංවීම සහ වසවිසෙන් තොර දේශීය ආහාර නිෂ්පාදනයේ නියැලෙන සුළු පරිමාණ ව්‍යවසායකයින් මෙන්ම අනෙකුත් විවිධ නිෂ්පාදනයන් කරන සමෘද්ධි හා අඩු ආදායම්ලාභීන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමට ස්ථිරසාර වෙළඳපලක් නිර්මාණය කර දීම හා ඒ තුළින් අපේක්ෂිත ආදායම් වර්ධනය හා ජීවන තත්ත්වය ඉහල නංවාලීම අරමුණු කොටගෙන දිවයින පුරා සුවඹොජුන්හල් 31 ක් ආරම්භ කිරීම සඳහා රු.171,370,352 ක් 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වැය කර තිබුණි. මේ අතරින් 2021 වර්ෂයේදී රු.8,969,457 ක් වැය කොට ඉදිකරන ලද අක්මීමන හා හබරාදුව සුවඹෝජුන්හල් දෙකක ව්‍යාපාර කටයුතු 2023 දෙසැම්බර් 31 දක්වා ආරම්භ කර නොතිබුණි.

(ආ) සුවඹොජුන්හල් හා සම්බන්ධ වෙළඳ මධ්‍යස්ථානය සම්බන්ධ කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී

i. කුරුවිට කාෂේන්ගම සම්බන්ධ වෙළඳ මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා රු 3,930,000 ක් වැය කර තිබුණි. කඩකාමර ඉදිකිරීම් කවදුරටත් සංවර්ධනය කලහැකි වන පරිදි ස්ලැබ් එකක් යොදා පහත මහලේ කාමර 9 ක් සකස් කර තිබුණ අතර නිම කර නොමැති කාමර 2 සුද්ගලයින් දෙදෙනෙකුට ලබාදී තිබුණි. මෙම කඩකාමර අවිධිමත් ආකාරයට ඉදිකිරීම හේතුවෙන් කඩඉම්යන්ට අපද්‍රව්‍ය බැහැර කිරීම, ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිවීම, වැනි ගැටළු වලට මුහුණපෑමට සිදු වී තිබුණි.

ii. පුත්තලම- කරුවලගස්වැව සුව බොජුන් හල සඳහා රු. 1,065,600 ක් 2018 වර්ෂයේදී වැය කර ඉදිකර තිබූ අතර සුද්ගලයින් 5 දෙනෙකු විසින් වෙළඳ කටයුතු කරගෙන ගියද වර්තමානය වන විට මධ්‍යස්ථානය ජල විදුලි සබඳතා බිඳ වැටී වල් බිහිවී තිබුණි.

iii. ආරච්චිකට්ටුව ප්‍රාදේශිය ලේකම් පිහිටි මානවෙරිය දිස්ත්‍රික් අලෙවි මධ්‍යස්ථානය රු. 12,193,773 ක් වියදම් කර ඉදිකර තිබුණු අතර 2019 ජූනි 10 දින ආරම්භ කර තිබුණි. 2019 සිට වරින් වර ව්‍යවසායකයන් 15 කට ආසන්න ප්‍රමාණයක් වෙළඳ කටයුතු සිදුකල ද වර්තමානය වන විට දෙදෙනෙකු පමණක් අලෙවි කටයුතු වල නිරත වී තිබුණි. 2019 වර්ෂයේ ආරම්භයේ සිට කිසිදු කුලී මුදලක් ඔවුන්ගෙන් අයකරගෙන නොතිබුණි. මෙම මධ්‍යස්ථානය වඟුරුබිමක් ගොඩ කර ඉදිකිරීම නිසා බැම් පුපුරා ගොස් තිබුණු අතර ගිලා බැසීමට ලක්ව තිබුණු බව 2024 ජනවාරි 12 සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මෙම මධ්‍යස්ථානය සඳහා ආරම්භයේ සිටම ජල පහසුකම් ද ලබාදී නොතිබුණි.

3.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව හා 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළයුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 14 ඇමුණුම 1 හි සඳහන් පරිදි පරිච්ඡේදයන් අන්තර්ගත කර පිළියෙල කර නොතිබුණි.

3.2 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගණුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2019 වර්ෂයේ සිට 2023 මාර්තු 31 දක්වා කාල පරිච්ඡේදයට අදාලව දෙපාර්තමේන්තු විමර්ශන අංශයට මූල්‍ය වරදාකම රු. 234,961,395 ක් වූ මූල්‍ය වංචා 165 ක් වාර්තා වී තිබුණ අතර ඉන් වංචා 67 කට අදාලව නිලධාරීන් 79 කගේ චිනය ක්‍රියා මාර්ග අවසන් කර අදාල මුදල් වංචා තුළින් නැවත අයකරගත් ප්‍රමාණය රු. 16,478,448 ක් පමණක් විය. තවදුරටත් රු. 218,482,947 ක් වූ මූල්‍ය වංචා 98 ක චිනය කටයුතු සිදුකරමින් පවතින අතර 2014 ජනවාරි 03 දින සිට 2018 අගෝස්තු 31 දක්වා බැංකු හා බැංකු සමිතිවල සිදු වූ මූල්‍ය අක්‍රමිකතා වලින් රු. 263,817,207 ක අක්‍රමිකතා 15 ක කටයුතු අවසන් කර නොතිබුණි. නිලධාරීන් විසින් දිගින් දිගටම මෙසේ මූල්‍ය වංචා සිදු කිරීමට බැංකු පද්ධතිය තුල පවතින අඩුපාඩු සකස් කිරීම හා චිනය නියෝගය තුළින් දඩුවම් ලිහිල් වීමද වංචා වැඩිවීමට හේතුවී තිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII වැනි පරිච්ඡේදයේ 13.2 ඡේදයට අදාලව 2019 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2019 තුළින් මූලික විමර්ශනය මාස 2 ක් ඇතුළත අවසන් කළ යුතු වුවද වංචා, දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධතාවයෙන් මූලික විමර්ශන සිදුකර චිනය නියෝග ලබාදීම ප්‍රමාදවීම වසර 2 සිට වසර 10 දක්වා කාල පරාසයක පැවතුණි.

(ඇ) බැංකු පද්ධතිය තුල සිදු වූ මූල්‍ය වංචා සම්බන්ධයෙන් විමර්ශන කටයුතු චිනය පරීක්ෂණ කටයුතු සඳහා වාර්ෂිකව මුදල් වියදම් කිරීම දෙපාර්තමේන්තුවෙන් වැය විෂයන්ගෙන් 2023 වර්ෂයට අදාලව විමර්ශන කටයුතු සඳහා හා ගමන් වියදම් සඳහා රු. 4,733,099 ක මුදලක් හා වෙනත් වියදම් වැය විෂයෙන් රු. 1,980,421 ක මුදලක් ගෙවා තිබුණි. නමුත් මෙම වංචා කරන ලද මුදල් ආපසු බැංකු පද්ධතියට බැරකර තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේ වංචා හා වැරදි 209 කින් රු. 35,715,777 ක මුදලක් බැංකු පද්ධතියට අයකිරීම ලෙස ලබාගෙන තිබුණි. බැංකු පද්ධතිය පරිපාලනය මෙහෙයවීම මූල්‍ය කටයුතු ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් මඟින් පාලනය වන බැවින් නිලධාරීන් වෙත ගෙවනු ලබන උක්ත දීමනා බැංකු අරමුදල් වලින් නොදරා දෙපාර්තමේන්තු වැය විෂයන්ගෙන් ගෙවා තිබුණි.

3.3 පාඩු හා හානි

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ඇමුණුම (i) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති සොරකුරු හා දෙපාර්තමේන්තු හානි හා පාඩු පිළිබඳ ලේඛනයේ සොරකුරු සමඟ පරීක්ෂාවෙදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂය තුළ අලාභ අයකරගැනීම යටතේ රු. 25,000 ට වැඩි සිද්ධි 2 ක එකතුව රු. 78,646 ක් ලෙස දක්වා තිබුණද හානි හා පාඩු ලේඛනය අනුව රු. 25,000 ට වඩා අඩු සිද්ධි එකක වටිනාකම් රු. 60,450 ක් දක්වා තිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශන ඇමුණුම් (i) වැඩසටහන 02 යටතේ අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය යටතේ වාහන අනතුරු සිද්ධි 3 ක වටිනාකම රු. 7,273,765 ක් දක්වා තිබුණු අතර හානි හා පාඩු ලේඛනය අනුව කැබි රථයක් 2022 දෙසැම්බර් 31 දින අනතුරට පත්වීමෙන් සිදු වූ අලාභය 2023 මැයි 19 දින රු. 640,446 ක් ද 2023 ජූනි 02 දින රු. 12,650 ක් ද හා 2023 සැප්තැම්බර් 06 දින රු. 74,280 ක් ද වශයෙන් කිරණය කර තිබුණු අතර එම මූළු වටිනාකම් රු. 727,376 ක් විය. ඒ අනුව හානි හා පාඩු පිළිබඳ ප්‍රකාශයෙහි වාහන අනතුරු අලාභය රු. 6,546,388 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(iii) 2023 වර්ෂයේ දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශ වල ඇමුණුම් 1 හි සඳහන් හානි හා පාඩු පිළිබඳ ප්‍රකාශයේ ප්‍රජාමූල බැංකු පද්ධතියේ රු. 188,284,225 ක් වූ මූල්‍ය වංචා 166 ක් පිළිබඳ දක්වා තිබුණි. දිවිඟැබුම පනතේ 25(3) වගන්තිය ප්‍රකාරව ප්‍රජාමූල බැංකු පද්ධතිය ස්වාධීන සංස්ථාපිත මණ්ඩලයක් වන බැවින් හා වංචා කරන ලද මුදල් ආපසු බැංකු පද්ධතියටම බැරකිරීමක් සිදුවන බැවින් මෙම මූල්‍ය වංචා පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම සාධාරණ වේ.

3.4 කලමනාකරණ දුර්වලතා
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2013 අංක 1 දරන දිවිනැඟුම් ආඥාපනතේ 36 වගන්තිය යටතේ දිවිනැඟුම් සංවර්ධන අරමුදල පිහිටුවනු ලැබිය යුතු වන අතර දෙපාර්තමේන්තුවට ලැබෙන සියළු ප්‍රදාන, තෑගි පනත යටතේ පිහිටුවන ලද බැංකු හා බැංකු සමිති විසින් තෑගි වෙනත් දායක මුදල්, බැංකු වල ලාභයෙන් අමාත්‍යවරයා නිශ්චය කරනු ලබන මුදල් ප්‍රතිශතයක් වශයෙන් සියළු ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැරකර ඉන් පසුව පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව දිවිනැඟුම සංවර්ධන අරමුදලට බැරකළ යුතු වුවත් අරමුදල මේ දක්වා පිහිටුවා නොතිබුණි. දිවිනැඟුම් සංවර්ධන අරමුදල පිහිටුවීමට භාණ්ඩාගාරයේ විරෝධතාවයක් නොමැති බව 2021 මැයි 03 දන්වා තිබුණි.

(ආ) I. සමෘද්ධි ප්‍රජා මූල බැංකු ගණුදෙනු කාර්යක්ෂමව කිරීම සඳහා Soft Watch හා SLTS වශයෙන් මෘදුකාංග දෙකක් හඳුන්වා දී තිබුණි. soft watch මෘදුකාංගය බැංකු 326 ක්, බැංකු සමිති 104 ක් සඳහා ලබාදී තිබූ අතර SLTS මෘදුකාංගය බැංකු 756 ක් හා බැංකු සමිති 229 ක් සඳහා ලබාදී තිබුණි. පද්ධතිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් සිදුකල නියැදි පරීක්ෂාවේදී අන්තර්ජාල සබඳතා නිතර බිඳ වැටීම, ණය පාස් පොත් පරිගණක පද්ධතිය මඟින් යාවත්කාලීන නොවීම,දිනකට සීමිත මුදල් ගෙවීම ප්‍රමාණයක් පමණක් ක්‍රියාත්මක කළ හැකි වීම කුළින් පද්ධතිය මන්දගාමී වීම, ණය අයවීමේදී ක්‍රමවත් බවක් නොවීම, ගිණුම් ශේෂ නිවැරදි නොවීම, පෙර ගනුදෙනු පරීක්ෂා කළ නොහැකි වීම, පරිගණක පද්ධතිය විටෙන් විට බිඳ වැටීම, බැංකුවේ සජීවී දත්තවලට ඇතුල් වීමේ හැකියාව මෘදුකාංග ආයතනයට තිබීම හේතුවෙන් දත්ත වෙනස්කල අවස්ථා පැවතීම නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ප්‍රජාමූල බැංකු පරිගණක පද්ධතිය කාර්යක්ෂමව කිරීම සඳහා 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබූ නමුත් එහි සඳහන් දෝෂ 6 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ කර නොතිබුණි.

II දෙපාර්තමේන්තු බැංකු මූල්‍ය අංශයේ තොරතුරු තාක්ෂණ අංශය විසින් බැංකු පරිගණක පද්ධතිය පිළිබඳ දෛනිකව අධීක්ෂණය කළ යුතු වුවත් දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල හරහා ඊ- මේල් මඟින් ලබාදෙන තොරතුරු මඟින් පමණක් අධීක්ෂණ කටයුතු සිදුකරනු ලබයි. ඒ අනුව බැංකු පරිගණක පද්ධතියේ පවතින අඩුපාඩු, දිස්ත්‍රික් වාර්තා සමඟ නොගැලපෙන අවස්ථා ආදිය පරීක්ෂාවට ලක්වීමක් සිදුකරනු නොලබයි. බැංකු විසින් මාසික සේවා ගාස්තු ගෙවීමකින් එම සේවා ලබාගෙන මෘදුකාංග

සම්පූර්ණ කල බැංකුවකින් ඒ සඳහා මසකට රු. 7000 බැගින් බැංකු 1092 කින් අදාල ආයතන වෙත ගෙවීමකර තිබූ නමුත් එහි සාර්ථකත්වය පරීක්ෂාකිරීම සිදු වී නොතිබුණි.

(ඇ) මානව සම්පත් කළමනාකරණ මොඩියුලය

I. මානව සම්පත් කළමනාකරණ මොඩියුලය තුලින් දෙපාර්තමේන්තු සේවකයන් සඳහා රාජකාරි හැදුනුම්පත් නිකුත් කිරීමට අවශ්‍ය තොරතුරු රැස් කිරීම සිදුකර තිබුණේ 24,083 ක් වූ මුළු සේවක සංඛ්‍යාවෙන් 9174 ක් සඳහා පමණි. ප්‍රධාන කාර්යාලයේ හා පුහුණු මධ්‍යස්ථානවල සහ තවත් දිස්ත්‍රික්ක 3 ක ඉහත කාර්ය සඳහා තොරතුරු රැස්කිරීම අවම මට්ටමක පැවතුණි.

II. දෙපාර්තමේන්තුගත නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනුවේ ලේඛන ස්කෑන් කර පද්ධතියට උඩුගත (upload) කිරීම සිදු කර තිබුණේ මුළු ලිපිගොනු සංඛ්‍යාව වූ 24,083 න් 3155 ක් පමණි. දිස්ත්‍රික්ක 3 ක හිසිදු ලිපිගොනුවක් උඩුගත (upload) කර නොතිබුණි.

III. උඩුගත (upload) කරන ලේඛන තුළින් දෙපාර්තමේන්තුගත නිලධාරීන් සඳහා විශ්‍රාම ලිපිගොනුවක් පද්ධතිය තුළින් සකස්කිරීම සහ ඒ ඒ වර්ෂයේ අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම යන නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් වාර්තාවක් මුල්පිටුවට ඇතුළත් කිරීම හා එය ප්‍රධාන කාර්යාලයේ සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අංශවලින් හා මූලස්ථාන කාර්යල වලින් ක්‍රියාත්මක කරනු ලබන බව දක්වා තිබුණද ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව විශ්‍රාම ලිපිගොනු කිසිවක් සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය තුළින් සමෘද්ධිලාභීන්ට ණය ලබාදීම

I. සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය තුළින් ණය වර්ග 34 ක් යටතේ ප්‍රතිලාභීන් 12,309,875 ක් සඳහා ණය ලබා දීම සිදුකර තිබුණ අතර සමෘද්ධි බැංකු ආරම්භයේ සිට 2023 වර්ෂය දක්වා ලබාදී තිබූ සමස්ථ ණය ප්‍රමාණය රු. බිලියන 463 ක් වී තිබුණි. 2023 වර්ෂය තුළ ප්‍රතිලාභීන් 350,604 කට ලබාදී තිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට පිටකිට් ණය ශේෂය රු. බිලියන 73.8 කි. 2023 දෙසැම්බර් 31 දිනට පිටකිට් ණය ශේෂයෙන් 8% ක් බොල්ණය ලෙස වෙන්කර තිබුණි.එය 2022 වර්ෂයට සාපේක්ෂව 1 % කින් වර්ධනය වීමකි. සමස්ථ බැංකු පද්ධතිය සතු මූළු ආයෝජනය රු. බිලියන 242 ක් වූවත් ප්‍රතිලාභීන් සඳහා ලබාදී තිබූ ණය ප්‍රමාණය රු. බිලියන 73.8 ක් වේ. එය සමස්ථ ආයෝජනයෙන් සියයට 30 ක් පමණි.

II. ණය අයකරගැනීමේ වගකීම පැවරී ඇති වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් එම කාර්ය නිසිපරිදි ඉටුකර නොමැති අතර ණය අයකර ගැනීම විධිමත් කර ගැනීම හා වංචා අක්‍රමිකතා අවම කරගැනීම සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා මොබයිල් ඇප් භාදුන්වා දී තිබුණ ද වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ගෙන් 5927 ක් පමණක් එම මොබයිල් ඇප් භාවිතා කර තිබුණි.

III. රටවිරුවන් සඳහා නිවාස ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර ණය ආපසු නොගෙවීම නිසා හෝ වෙනත් ක්‍රියාකාරකමක් නිසා සමෘද්ධි අධිකාරියට සිදුවන පාඩුවක් හෝ වියදමක් වෙතොත් එය බෙදී යන ආකාරයෙන් ක්‍රියා කිරීමට එකඟව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් 2013 වර්ෂයේදී රු. මිලියන 100 ක මුදලක් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය වෙත ලබාදී තිබුණි. ඒ අනුව සමෘද්ධි බැංකු විසින් රටවිරුවන් 11,929 ක් සඳහා රු. 3,547,133,064 ක මුදලක් ණය වශයෙන් නිකුත් කර තිබුණි. රට විරුවෝ නිවාස ණය ව්‍යාපෘතිය සඳහා සමෘද්ධි අධිකාරිය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර 2012 මාර්තු 07 දින වසර 5 ක කාලයක් සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබූ අතර එය 2018 මාර්තු 06 දිනෙන් අවසන් වී තිබුණි. නව අවබෝධතා ගිවිසුම ඉක්මනින් අත්සන් කර ණය ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දී තිබූ නමුත් 2023 ඔක්තෝබර් 30 වන විටත් දෙපාර්ශවය විසින් නව අවබෝධතා ගිවිසුමකට එළඹී නොතිබුණි. ඒ අනුව සවිදුරටත් අයවිය යුතු ණය ශේෂය රු. 193,078,303 ක් වී තිබුණි.

(ඉ) ප්‍රජාබල බැංකු හා බැංකු සමිති මූල්‍ය ප්‍රකාශන විගණනය

I. 2020/13 හා 2020 සැප්තැම්බර් 27 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛය මඟින් දෙපාර්මේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින්ම බාහිර විගණකයකු ලෙස කටයුතු කිරීමට අවස්ථාව ලබා දී තිබුණි. ඒ අනුව 2016, 2017, 2018 හා 2019 වර්ෂවලට අදාළව බාහිර විගණනය සිදු කිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තු අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරීන්ට එක් විගණන වාර්තාවක් සඳහා රු. 3,000 ක් බැගින් බැංකු හා බැංකු සමිති 1007 කට අදාළව වාර්තා විගණනය සඳහා රු. 12,885,672 ක් බැංකු මූල්‍ය අංශය විසින් ගෙවා තිබුණි. මේ සඳහා 2020 ඔක්තෝබර් 15 දිනැති අංක 2020/75/05 දරන කළමනාකරණ මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී තිබුණ ද එය විගණන මූලික මූලධර්ම වලට අනුකූල නොවන බව නිරීක්ෂණය විය.

II. දිස්ත්‍රික්ක 12 කට අයත් 2020 හා 2021 වර්ෂවලට අදාලව ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති 197 ක මූල්‍ය ප්‍රකාශන විගණනය කර විගණන මතයක් 2024 මාර්තු 28 දින වන විටත් නිකුත් කිරීම සිදුකර නොතිබුණ අතර,2022 වර්ෂයේ ප්‍රජා මූල බැංකු 1074 කින් 33 ක් හා බැංකුසමිති 331 න් එක් සමිතියක්ද විශයෙන් ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති 1455 ක මූල්‍ය ප්‍රකාශන අතරින් විගණනය සිදු කර මත නිකුත් කර තිබුනේ මූල්‍ය ප්‍රකාශන 34 ක පමණි.

III. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 700 අනුව මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයන් ප්‍රකාශ කිරීමට නොහැකිවන ලෙස විෂය පථය සීමා කර ඇති විට හෝ මූල්‍ය දත්තවල නිවැරදිතාව පිළිබඳ දැඩි අවිනිශ්චිතතාවයක් ඇති අවස්ථාවක මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය ව්‍යාවනය කිරීමට සිදු වේ. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමිතිවල අවසන් ගිණුම් සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති විගණන මත පිළිබඳ ප්‍රගති වාර්තාව අනුව 2015 සිට 2019 දක්වා වසර 5 ක මූල්‍ය ප්‍රකාශන 6710 කින් 2492 ක මතය ව්‍යාවනය කර ඇති අතර සත්‍ය හා සාධාරණ තත්වයන් පිළිඹිබු කර ඇත්තේ මූල්‍ය ප්‍රකාශන 782 ක පමණි. දිස්ත්‍රික්ක 21 කට අදාල බැංකු 297 ක 2019, 2020 හා 2021 යන වර්ෂ තුනටම අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කළ විගණන මතය ව්‍යාවනය කර තිබුණි. ඒ අනුව සමෘද්ධි බැංකු කළමනාකරුවන් විසින් එම බැංකු මනා අධික්ෂණය කිරීමද, විමර්ශන නිලධාරීන් විසින් නිවැරදිව විමර්ශනය කිරීමද, විගණන නිලධාරීන් විසින් සමෘද්ධි බැංකුවල අභ්‍යන්තර පාලනයේ දුර්වලතා හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමද, මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියල කිරීමට හා බැංකු පද්ධතියේ කාර්යක්ෂමතාවය, ඵලදායිත්වය ඉහල නැංවීමට උපරිම දායකත්වයක් දක්වා නොතිබුණි.

IV. 2015 සිට 2019 දක්වා වර්ෂවල ප්‍රජාමූල බැංකු මූල්‍ය ප්‍රකාශන විගණනය කර සත්‍ය හා සාධාරණ මත නිකුත් කර ඇති මූල්‍ය ප්‍රකාශන 782 ක් අතරින් මූල්‍ය ප්‍රකාශන 49 ක බොල්ණය අනුපාත ඉහල යාම හේතුවෙන් ලාභ විසර්ජනය සඳහා අවසර ලබාදී නොතිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත ලැබී තිබුණු විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 6710 කින් ලාභ විසර්ජනය සඳහා අවසර ලබා දී තිබුණේ මූල්‍ය ප්‍රකාශන 1735 ක් සඳහා පමණි. මේ හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට කොටස්කරුවන්ට ගෙවිය යුතු රු. 6,344,018,725 ක ලාභාංශ ගෙවීමට නොහැකි වී තිබුණි.

4. යහ පාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2023 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය විසින් ඉදිරිපත් කරන ප්‍රධාන කාර්යාලයට අදාළ සංශෝධිත විගණන සැලැස්ම අනුව අවදානම ඇගයීම මත හඳුනා ගන්නා ලද විගණන ක්ෂේත්‍ර 130 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කර තිබූ විගණන වාර්තා ගණන 187 ක් විය. එසේ වුවද අභ්‍යන්තර විගණන අංශයෙන් ඉදිරිපත් කරන ලද කොරතුරු හා විගණන විමසුම් ලේඛනය අනුව ප්‍රධාන කාර්යාලයේ අංශ 4 ක ක්ෂේත්‍ර 07 ක් විගණනයට භාජනය කොට වාර්තා 7 ක් පමණක් නිකුත් කර තිබුණි. ඒ අනුව මූදල් රෙගුලාසි 133 අනුව අභ්‍යන්තර විගණනයෙන් බලාපොරොත්තු වන දෙපාර්තමේන්තුවේ මූදල් කටයුතු පිළිබඳ පවතින අභ්‍යන්තර පාලනයන්, වැරදි හා වංචා වැලැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසි වල විධිමත්බව හා ප්‍රමාණවත් බව පිළිබඳ ප්‍රමාණාත්මක ස්වාධීන ඇගයීමක් හා අබණ්ඩ සමීක්ෂණයක් සිදුවී නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2023 දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය තුළ ජ්‍යෙෂ්ඨ, තාක්ෂණික හා ද්විතීයික අංශ වල 1771 ක පුරප්පාඩු පැවති අතර ප්‍රාථමික අංශයේ කාර්ය මණ්ඩලය තුළ 9 ක අතිරික්තයක් විය.

(ආ) රාජ්‍ය සේවා කෙමිෂන් සභාවේ කාර්ය පටිපාටි රීති සංග්‍රහයේ අනුව 97 වන වගන්තිය ප්‍රකාරව, පත්වීමට අදාළ සහතික වල නිර්වාහක භාවය පත්වීම බලධාරියා විසින් වසරක් ඇතුළත සනාථ කරගත යුතු අතර, 59 වන වගන්තිය අනුව රාජ්‍ය සේවයේ කිසියම් තනතුරකට යම් කැනැත්තෙකු විසින් පත්කිරීම බලධරයා වෙත සාවද්‍ය තොරතුරු හෝ ව්‍යාජ (කූට) ලේඛන ඉදිරිපත් කර ඇති බව අනාවරණය වූ විටෙක එම පත්වීම වහාම අවලංගු කර එය ශූන්‍ය හා බලරහිත කර, ඒ වන විටත් වැටුප් හා දීමනා වශයෙන් රජය විසින් ගෙවා ඇති සියළු මූදල් එම නිලධාරීන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාකල යුතුවේ. නමුත් නිළධාරීන් 363 දෙනෙකු විසින් සිය පත්වීම් ලබා ගැනීමට පෞද්ගලික ලිපිගොනුවට ඉදිරිපත් කර තිබුණු අධ්‍යාපන සහතික ව්‍යාජ සහතික බවට සනාථ වී තිබුණි. ඉන් 77 දෙනෙකු සේවයෙන් පහකර තිබුණු අතර 20 දෙනෙකු පහත ප්‍රකාරව වන්දි ලබාගැනීමේ එකඟතාවයෙන් සේවයෙන් ඉවත් වී තිබුණි. නියැදි විගණනයට භාජනය වූ සම්බන්ධතාට දිස්ත්‍රික්කයේ සේවය කර විශ්‍රාම වැටුප් රහිතව සේවය අවසන් කර තිබුණු නිලධාරීන් හා දැනට සේවයේ යෙදී සිටින නිලධාරීන් 30 දෙනෙකු විසින් පත්වීම් දින සිට රු. 195,215,660 ක් ද, මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක නිළධාරීන් 4 දෙනෙකු වෙතුවෙන් 1999 වර්ෂයේ සිට රු. 40,383,176 ක්ද, කොළඹ හා මාතර දිස්ත්‍රික්ක වල නිළධාරීන් 17 දෙනෙකු සඳහා 2023 වර්ෂයට අදාලව පමණක් රු. 8,732,204 ක් ද වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණ ද වගකිව යුතු නිලධාරීන් විසින් මේ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2019 ජූලි 05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය අනුව 2013 අංක 1 දරන දිවිනැගුම් පනතේ 25 (3) වගන්තිය අනුව ප්‍රජාශ්‍රිත බැංකු කාර්යමණ්ඩලය සඳහා විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවකයින් ස්ථිර පදනම්න් පත්කිරීම නීතියට පටහැනි බව ඔරු නීතිපති තුමා විසින් දැනුම් දී ඇති බවත්, ප්‍රජා මූල බැංකු සම්බිවල දැනටමත් සේවයේ යෙදී සිටින දිවි නැගුම් පනතේ 44 (ඉ) හා ii යටතේ දෙපාර්තමේන්තුවේ සේවයට එක් වූ නිලධාරීන් තාවකාලික පදනම්න් එම ආයතනවලට මූදා "හැර ඇති බවට සැලකිය යුතු වන අතර, ඉදිරියේදී බැංකු කාර්ය මණ්ඩලය සඳහා වෙනම තනතුරු අනුමත කරවා ගැනීමටත් ඉන් අනතුරුව පුරප්පාඩු වන තනතුරු සඳහා ඒ අනුව බඳවා ගැනීම් කිරීමට කටයුතු කළ යුතු

බව දක්වා තිබුණි. ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ DMS/1284/VOI vii හා 2023.11.01 දිනැති ලිපියේ 6. 1 ඡේදය ප්‍රකාරව බැංකු පද්ධතිය සඳහා වැටුප් කේත 11 ක් යටතේ නකතුරු 4 ක් සඳහා නිලධාරීන් 6535 ක් අනුමත කර තිබුණි. එම ලිපියෙන් බැංකු සංස්ථාපිත මණ්ඩලයක් ලෙස ක්‍රියාත්මක වීමේදී විධිමත් පරිදි කාර්ය මණ්ඩල වැටුප් අනුමත කර ගැනීම සඳහා බැංකු අධීක්ෂණය, විගණනය හා අනෙකුත් තොසික හා පරිපාලනමය කරුණු ඇතුළත් යෝජනාවක් කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණද මෙම වාර්තාවේ දින වන විටත් එම තොරතුරු ෆාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) බැංකු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 9894 ක් සඳහා දෙපාර්තමේන්තු වැය විෂයයෙන් වැටුප් ගෙවීම් සිදු කරමින් පවතින අතර 2023 වර්ෂය සඳහා ගෙවා තිබූ මුදල රු. මිලියන 853 ක් විය. ප්‍රජාමුල බැංකු හා සමිති විසින් මෙම වැටුප් වියදම් සඳහා වාර්ෂිකව ලාභයෙන් වෙන්කිරීමක් කර තිබුණි. ඒ අනුව බැංකු ආරම්භයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා රු. බිලියන 43.4 ක මුදලක් රජයට ගෙවිය යුතු වැටුප් වශයෙන් වෙන් කිරීම් කර ඇතත් මේ දක්වා එම මුදල් ආපසු රජයට ගෙවීම් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මීට අමතරව සමෘද්ධි දෙපාර්තමේන්තු සතු ඉඩම් හා ගොඩනැගිලි ප්‍රජාමුල බැංකු හා බැංකු සමිති ස්ථාපනය කිරීම සඳහා යොදවාගෙන තිබුණි.

එච්. එම්. ද සොයිසා

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත්: 1. අධ්‍යක්ෂ ජනාරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

2. ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

පරිච්ඡේදය – 04 - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

අ. අ	වැඩසටහන	විශේෂිත දර්ශක		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ව නිමැවුම		
				100% -90%	75% -89%	50% -74%
01	සමාජ සුබසාධන වැඩසටහන	1	නිත්‍ය සමෘද්ධිලාභී පවුල් 1,637,672 ක් සඳහා සමෘද්ධි සහනාධාර ලබා දීම.		85%	
		2	පොරොත්තු ලේඛනගත සමෘද්ධි පවුල් 693,564 ක් සඳහා මූල්‍යාධාර ලබා දීම .		75%	
		3	"අස්වැසුම " නොලබන සමෘද්ධිලාභී පවුල් 363,241 ක් සඳහා මූල්‍යාධාර ලබා දීම.			50%
02	සමාජ ආරක්ෂණ වැඩසටහන	1	සමෘද්ධි සහනාධාරලාභී පවුල් 156,772 දෙනෙකුට සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීම.			65%
		2	උසස් පෙළ හදාරන සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල දරුවන් 90,000 කට සිප්දොර ශිෂ්‍යත්ව ලබා දීම.	90%		
03	ජීවනෝපාය සංවර්ධන වැඩසටහන	1	අතිරේක බෝග වගා වැඩසටහන යටතේ අක්කර 755 ක , ප්‍රතිලාභීන් 1,488 ක් සඳහා මුං ඇට, රට කජු, කුරක්කන්,උඳු, කවුපි හා මිරිස් වගාවන් සඳහා ආධාර කිරීම.			45%
04	ව්‍යවසාය සංවර්ධන වැඩසටහන	1	සමෘද්ධි සුව බොජුන් හල් 21 ක් වැඩි දියුණු කිරීම තුලින් සමෘද්ධි ව්‍යවසායකයින් පවුල් 420 ගේ ජීවන මට්ටම ඉහල නැංවීමට			60%
		2	අලෙවි පොලවල් 606 ක් පැවැත්වීම		80%	
		3	සමෘද්ධි ව්‍යවසායකයින් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 275 ක් පැවැත්වීම.		85%	
		4	සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් 8,000 ක් සඳහා තෘතීක අධ්‍යාපනය යටතේ වෘත්තීය මාර්ගෝපදේශ පුහුණුව ලබා දීම.		80%	

අ. අ	වැඩසටහන	විශේෂිත දර්ශක		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ව නිමැවුම		
				100% -90%	75% -89%	50% -74%
		5	තරුණ , කරුණියන් 474 ක් සඳහා ජපන් භාෂා පුහුණුව ලබා දීම.		80%	
05	නිවාස සංවර්ධන වැඩසටහන	1	නිවාස සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභී පවුල්වල නිවාස ඒකක 4,145 ක් සංවර්ධනය සඳහා මූල්‍යාධාර ලබාදීම.			68%
08	තොරතුරු තාක්ෂණ වැඩසටහන	1	සමෘද්ධි කාර්යාල 335 ක ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම			60%
		2	සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,093 ක් හා ප්‍රජාමූල බැංකු සමිති 335ක් පරිගණකගත කිරීම.		75%	
		3	නිලධාරීන් 16,502 ක් සඳහා තොරතුරු තාක්ෂණ පුහුණුව ලබා දීම.			60%
09	මානව සම්පත් සංවර්ධන වැඩසටහන	1	දෙපාර්තමේන්තු සේවකයින් 1,350 ක් සඳහා ධාරිතා සංවර්ධනය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම			55%
10	ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන	1	සමෘද්ධි ප්‍රතිලාභීන් 256,929 ට ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම.			55%
11	මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන	1	“සමෘද්ධි උදානය” රූපවාහිනි වැඩසටහන් 20 ක් ප්‍රචාරය කිරීම			67%
12	සැලසුම් හා මෙහෙයුම් වැඩසටහන	1	දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් 210 ක් පැවැත්වීම			70%
		2	දෙපාර්තමේන්තුවේ 2022 කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.	100%		

පරිච්ඡේදය – 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ		ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය (%)		
				0% - 49%	50% - 74%	75% - 100%
01	දුගීබව අවසන් කිරීම	2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන සියලුම පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම.	සමෘද්ධි ප්‍රතිලාභී 1,637,672 කගේ පරිභෝජන අවශ්‍යතා සපුරාලීම සඳහා මාසිකව සහනාධාර මුදල් ලබා දීම.		60%	
			සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් උත්පාදන මාර්ග වැඩි දියුණු කර ගැනීම සඳහා පවුල් 256,929 කට ක්ෂුද්‍රමූල්‍ය ණය පහසුකම් ලබා දීම.		55%	
		පහළ ආදායම් මට්ටමේ අයද ඇතුලත්ව සියලුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම.	සමෘද්ධි සහනාධාරලාභී පවුල් 156,772 කගේ සමාජ ආරක්ෂණය ඉහල නැංවීම සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීම.		52%	
			සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සහනාධාරලාභී පවුල්වල උසස් පෙළ හදාරන ළමුන් 90,000 ක් සඳහා මාසිකව ශිෂ්‍යත්ව මුදලක් ලබා දීම තුලින් එම ළමුන්ගේ අධ්‍යාපන මට්ටම ඉහල නැංවීම.			80%
08	ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය	කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරිගැන්වීම’	සමෘද්ධි සුව බොජුන්හල් 21ක් සංවර්ධනය කර සමෘද්ධි ව්‍යවසායකයින්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම.	45%		
			සමෘද්ධි ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 275 ක් ක්‍රියාත්මක කිරීම.	40%		
			සමෘද්ධි හා අඩු ආදායම්ලාභී නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන අළෙවි අවස්ථා ඇති කිරීම සඳහා සමෘද්ධි අළෙවි පොළවල් 606 ක් පැවැත්වීම.		*70%*	
09	නගර හා ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම.	සියලුම දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිළට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩි දියුණු කිරීම.	සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල නිවාස 4,145 ක් වැඩි දියුණු කර එම පවුල්වල ජීවන මට්ටම ඉහළ නැංවීම.	45%		

5.2. කිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

i. දිළිඳු පවුල් 2,694,450 ක් සඳහා සමෘද්ධි සහනාධාර ලබා දී ඔවුන්ගේ පරිභෝජන අවශ්‍යතා සපුරා ලීම. එහිදී සමෘද්ධි නිත්‍ය දිමනාව ලබන පවුල් 1,637,672 ක් සමෘද්ධි පොරොත්තු ලේඛනගත පවුල් 693,564 ක් සහ අස්වැසුම නොලබල සමෘද්ධිලාභී පවුල් 363,214 ක් සඳහා මාසික මුල්‍යාධාරී ලබාදෙන ලද අතර, ලබාදුන් මුළු සහනාධාරයන්හී වටිනාකම රු.මි. 90,092,060 ක් වේ.

ii. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල උසස් පෙළ හදාරන දරු දැරියන්ගේ අධ්‍යාපන මට්ටම ඉහල නැංවීම අරමුණු කරගෙන ක්‍රියාත්මක කරනු ලබන සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ, මසකට රු.1,500/= බැගින් මාස 24 ක කාලයක් සඳහා රු.36,000/= මූල්‍ය ආධාරයක් ලබා දෙන ලද අතර, ඒ අනුව 2022 වර්ෂය තුල සමෘද්ධි සිසු දරු දැරියන් 90,000 ක් සඳහා සිප්දොර ශිෂ්‍යත්ව ලබා දී ඇති අතර, ප්‍රධානය කළ මුළු ශිෂ්‍යත්ව වටිනාකම රු.මි.968.29 ක් වේ.

iii. සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල සමාජ ආරක්ෂණය ඉහළ නැංවීම සඳහා, එම පවුල්වල දරු උපත් 8099ක් (නිවුන් දරු උපත් ඇතුළුව) සඳහාත්, විවාහ 21,523 ක් සඳහාත්, ලෙඩ රෝග වැළඳුනු ප්‍රතිලාභීන් 94,994 ක් සඳහාත්, මරණ 32,156 ක් සඳහාත්, වශයෙන් මුළු පවුල් 156,502 ක් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීම. මේ යටතේ, ලබා දී ඇති සමාජ ආරක්ෂණ ප්‍රතිලාභයන්හි මූල්‍ය වටිනාකම රු.මි. 1,127.66 ක් වේ.

iv. අතිරේක බෝග වගා වැඩසටහන යටතේ, පවුල් 1488 සඳහා මුං ඇට, රට කජු , බඩ ඉරිගු, උඳු හා මිරිස් වගාවන් සඳහා ආධාර කිරීම. වැය කරන ලද මුදල රු.මි.19.70 ක් වේ.

v. නිවාස ලොතරැයි වැඩසටහන යටතේ, නිවාස ලොතරැයි දිනුම් ඇදීම මඟින් රු.200,000/- නිවාස ආධාර ප්‍රතිලාභීන් 3,810 දෙනෙකු සඳහා ද රු.750,000/-නිවාස ආධාර, ප්‍රතිලාභීන් 1005කු දෙනෙකු සඳහා ද, රු.250,000/- නිවාස ආධාර ප්‍රතිලාභීන් 1,005 කු සඳහා ද, ප්‍රධානය කරන ලද මූල්‍ය ආධාරයන්හි මුළු වටිනාකම රු.මි. 1,766 ක් වේ.

vi. අලෙවි පහසුකම් වැඩි දියුණු කිරීම් යටතේ සමෘද්ධි සුව බොජුන් හල් 21 ක් වැඩි දියුණු කිරීම තුලින් සමෘද්ධි ව්‍යවසායක පවුල් 150 ගේ ජීවන මට්ටම ඉහල නැංවීමට හැකිවීම. වැයකරන ලද මුදල රු.මි. 0.5ක් වේ.

vii. දිවයින පුරා පිහිටි සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,093 ක් මඟින් සහන පොළී ප්‍රතිශතයන් යටතේ,සමෘද්ධි හා අඩු ආදායම්ලාභීන්ගේ ව්‍යවසාය සංවර්ධනය, ජීවනෝපාය සංවර්ධනය, ස්වයං රැකියා හා පාරිභෝගික අවශ්‍යතා වෙනුවෙන්, ප්‍රතිලාභීන් 336,781 දෙනෙකු සඳහා රු.මි. 37,358.19 ක් වටිනා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම. ප්‍රජාමූල සංවිධාන හරහා ක්‍රියාත්මක කල අරුණලු ණය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 200,253කු සඳහා රු.මි. 2,541 ක ණය ලබා දී ඇත.

viii. අලෙවි පොළවල් පැවැත්වීම තුලින් සමෘද්ධි ප්‍රතිලාභීන් ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි පහසුකම් සැපයීම අරමුණු කර ගනිමින් දිස්ත්‍රික් 25 තුල අලෙවි පොළවල් 606 ක් පැවැත්වීම.

ix. සමෘද්ධි ව්‍යවසායකයින් දිරි ගැන්වීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 275 ක් පවත්වා ව්‍යවසායකයින් 11,155 කට ව්‍යවසායකත්ව පුහුණුව ලබා දීම.

x. සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ භාෂා කුසලතාවය වර්ධනය කිරීමේ වැඩසටහන යටතේ දරුවන් 131 දෙනෙකු ජපන් භාෂා පුහුණුව සාර්ථකව අවසන් කර ඇත.

xi. ප්‍රතිලාභී ගනුදෙනු කාර්යක්ෂම කිරීම සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,093 ක් සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 335 ක් පරිගණකගත කිරීමට කටයුතු කිරීම.

xii. සමාජ සංවර්ධනය යටතේ ලෝක දිළිඳුකම පිටුදැකීමේ දින සැමරුම් හා ලෝක ළමා දින සැමරුම් වැඩසටහන් 335 ක් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම.

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සංඛ්‍යා සටහන - (XXII)

අනුමත සේවක සංඛ්‍යාව (2023.11.01 අනුමත කාර්ය මණ්ඩලය අනුව)		පවතින සේවක සංඛ්‍යාව 2023.12.31 දිනට	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	131	66	65
තෘතීයික	2,369	1,541	828
ද්විතීයික	22,800	21,915	885
ප්‍රාථමික	431	442	-11
එකතුව	**25,731**	**23,964**	**1,767**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

මෙම දෙපාර්තමේන්තුවේ සමෘද්ධි බැංකු පද්ධතිය හා වෙනත් අරමුදල් මෙහෙයවීම සඳහා අවශ්‍ය ප්‍රශස්ථ කාර්යමණ්ඩල සංයුතිය සකස් කර 2021 ඔක්තෝබර් මාසයේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඒ සඳහා අනුමැතිය ලැබී ඇත්තේ 2023 .11.01 දින වේ. ඒ අනුව පුරප්පාඩු තනතුරු සඳහා විධිමත් බඳවා ගැනීම් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. කාර්ය මණ්ඩලය පුරප්පාඩු වීම මත අභියෝග රැසකට මුහුණදීමට සිදුව ඇත.

6.3 මානව සමපත් සංවර්ධනය

6.3.1. හැඳින්වීම.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව දිළිඳුකම පිටුදැකීමේ මූලික අරමුණ පදනම් කරගෙන දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් සඳහා සජීවිව දායක වී එම වැඩසටහන් කාර්යක්ෂමව සහ නිවැරදිව ක්‍රියාත්මක කිරීමට උරදෙන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට ඒ සඳහා දැනුම සහ පුහුණුව අවශ්‍යවේ. ඒ අනුව ජනතා සේවයට වඩාත් සමීප වෙමින් එම සංවර්ධන වැඩසටහන් සාර්ථක කරගැනීම සඳහා නිලධාරීන්ගේ දැනුම සහ ආකල්ප වර්ධනය කර විෂයානුබද්ධ පුහුණුව ලබාදීම පෙරදැරිකරගෙන දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලය නියෝජනය වන පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මානව සම්පත් සංවර්ධන අංශය කාර්ය භාරය වේ.

අරමුණු :

- දෙපාර්තමේන්තුව තුළ පරිපූර්ණ සම්පත්දායක පිරිසක් බිහිකිරීම හා සියලුම කාර්යය මණ්ඩලය සුවිශේෂී දක්ෂතා ඇති මානව සම්පතක් බවට පත් කිරීම.
- දෙපාර්තමේන්තුවේ මෙහෙවර ලභාකර ගත හැකි වන පරිදි දක්ෂතා සහිත කාර්යය මණ්ඩලයක් බිහි කිරීම.
- නිවැරදි කළමනාකරණය තුළින් ධනාත්මක ආකල්පවලින් පරිපූර්ණ මානව සම්පතක් බිහි කිරීම.
- සමෘද්ධි ව්‍යාපාරයට සෘජුවම සම්බන්ධ ප්‍රතිලාභී ප්‍රජාව සමග මැදිහත්කරුවන් ලෙස කටයුතු කරන නිලධාරීන් ඵලදායී හා කාර්යක්ෂම ගති ලක්ෂණවලින් යුත් කාර්යය මණ්ඩලයක් බවට පත් කිරීම.
- 2023 වර්ෂයේ සමස්ත දෙපාර්තමේන්තුවේ ඉලක්ක සපුරාලීමට සහයවීම.

2023 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

01. විෂයානුබද්ධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

i. ලිපි ගොනු සකස් කිරීම සහ කාර්යාල කළමණාකරන ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
ii. ගිණුම් ක්‍රම සහ පරිගණක සාක්ෂරතාව පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
iii. ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ පුහුණුව.
iv. ගිණුම් සහ වැටුප් විෂයන්ට අදාල පුහුණුව .
v. බහු කාර්ය සංවර්ධන කාර්ය සහායකයින් සඳහා ආයතනික කටයුතු සහ තම තනතුරට අදාල රාජකාරිය පිළිබඳ පුහුණුව ලබා දීම.
vi. රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ නේවාසික පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.
vii. සංවර්ධන නිලධාරීන් (විගණන) සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

02.උසස් අධ්‍යාපන සහ වෘත්තීය පාඨමාලා හැදෑරීම සඳහා නිලධාරීන් යොමු කිරීම

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ වෘත්තීය කුසලතා වර්ධනය කිරීම සඳහා උසස් අධ්‍යාපන පාඨමාලා සහ වෘත්තීය පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා උනන්දු කරවීමේ අරමුණින් නිලධාරීන් පෞද්ගලිකව තෝරාගෙන හදාරනු ලබන පාඨමාලා සඳහා පාඨමාලා ගාස්තු අදාල ආයතන වෙත ගෙවන ලදී.

03.උසස් අධ්‍යාපන / වෘත්තීය අධ්‍යාපන කටයුතු සඳහා නිලධාරීන් විදේශ අධ්‍යාපන පුහුණු වැඩසටහනවලට යොමු කිරීම

කලාපීය රටවල දැණුම සහ අත්දැකීම් ලබාගැනීම සඳහා නිලධාරීන් විදේශ අධ්‍යයන පුහුණු වැඩසටහන් වලට යොමු කරන ලදී.

04.සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

ජාතික සමාජ සංවර්ධන ආයතනය මඟින් පවත්වන සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා පාඨමාලා ගාස්තුවෙන් 50% ක් ගෙවා නිලධාරීන් පුහුණුවට යොමු කර ඇත.

05. සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව.

සමාජ වැඩ පිළිබඳ කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ ii සහ iii ශ්‍රේණි වල සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව ජාතික සමාජ සංවර්ධන ආයතනය(NISD) හා ඒකාබද්ධව පවත්වනු ලැබේ. ඒ අනුව දිස්ත්‍රික් 25 සේවය කරන නිළධාරීන්ට ZOOM තාක්ෂණය ඔස්සේ පවත්වා අමතර දැනුම ලබා දෙන ලදී.

06. සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම.

සමෘද්ධි දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩල පුහුණුව සඳහා යොදාගනු ලබන මාතර, සමනළ වැව නිල්ලඹ පිහිටි පුහුණු මධ්‍යස්ථානවල අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදුකරන ලදි. තව ද මධ්‍යස්ථානයේ කටයුතු කරගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගන්නා ලදි.

07. සමෘද්ධි කළමණාකරුවන් ප්‍රජා සංවර්ධනය හා සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීම සඳහා යොමු කිරීම.

පේරාදෙණිය විශ්ව විද්‍යාලය මඟින් පවත්වනු ලබන ඉහත සඳහන් පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා අප දෙපාර්තමේන්තුවේ නිළධාරීන් යොමු කර ඇත. මෙහි අන්තර්ගතයේ සඳහන් කරුණු දිළිඳුකම පිටු දැකීම සඳහා ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් සහ ක්‍රමෝපායන්ට අදාලව සකස් කර ඇත. එම දැනුම දිළිඳුකම පිටු දැකීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසහටහන් වඩාත් නිවැරදිව කිරීමේදී උපකාරී වේ.

08. ක්ෂුද්‍ර මූල්‍ය බැංකු කාර්ය මණ්ඩලය පුහුණු වැඩසටහන්

i. සමෘද්ධි දෙපාර්තමේන්තුවේ රාජකාරී සඳහා හඳුන්වා දී ඇති මදුකාංග පද්ධති පිළිබඳව සමෘද්ධි බැංකු සහ සමෘද්ධි බැංකු සමිති කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම

ii. සේවා කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා සමෘද්ධි බැංකු සහ සමිතිවල නිලධාරීන් කොළඹ විශ්ව විද්‍යාලයට යොමු කරන ලදී.

iii. සේවා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා සමෘද්ධි බැංකු සහ සමිතිවල නිලධාරීන් කොළඹ විශ්ව විද්‍යාලයට යොමු කරන ලදී.

iv. ගිණුම්කරණය සහ ව්‍යාපාර අධ්‍යනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

ශ්‍රී ලංකා වරලත් ගිණුම්කරණ හා ව්‍යාපාර අධ්‍යනය ආයතනය හා ඒකාබද්ධව සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය බැංකු හා බැංකු සමිති වල සේවය කරන සමෘද්ධි කළමණාකරුවන් හා සංවර්ධන නිළධාරීන් සඳහා ඉහත පුහුණු වැඩසටහන පවත්වනු ලබයි. රාජ්‍ය හා පෞද්ගලික බැංකුවල අනුගමනය කරනු ලබන කළමනාකරණය, ගිණුම්කරණය, බැංකු කරණය ඇතුළු අනෙකුත් සම්මත ගිණුම් ක්‍රම පිළිබඳ දැනුම සහ පුහුණුව ලබා දී එතුළින් අපගේ බැංකු පද්ධතිය වඩාත් කාර්යක්ෂම හා සඵලදායී තත්ත්වයට පත් කිරීමේ අරමුණින් දේශීය හා ජාත්‍යන්තරව පිළිගත් විෂය නිර්දේශයන් යටතේ ඉහත පුහුණු වැඩසටහන දින 06 ක් පුරා නේවාසිකව පවත්වා අවශ්‍ය දැනුම ලබා දීමට කටයුතු කරන ලදී.

2023- ක්‍රියාත්මක ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

සංඛ්‍යා සටහන - (XXIII)

අ. අ.	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	සමස්ත ආයෝජනය (Rs.000)			වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			වැඩසටහනේ කාල සීමාව	දේශීය	විදේශීය		
	දිස්ත්‍රික් කාර්යාල විසින් සංවිධානය කළ නිලධාරී පුහුණු වැඩසටහන්						
1	ලිපි ගොනු සකස් කිරීම සහ කාර්යාල කළමණාකරන ක්‍රමවේදය පිළිබඳ පුහුණුව-රත්නපුර දිස්ත්‍රික්කය	50	දින 01	3,000.00		දේශීය	නිලධාරි රැකියා කටයුතු වඩාත් ගුණාත්මක සහ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම.
2	ගිණුම් ක්‍රම සහ පරිගණක සාක්ෂරතාව-රත්නපුර දිස්ත්‍රික්කය	48	දින 01	5,000.00		දේශීය	
3	ඉඩම් අත්පත් කර ගැනීමේ පුහුණුව-රත්නපුර දිස්ත්‍රික්කය	88	දින 01	8,800.00		දේශීය	නිලධාරි රැකියා කටයුතු වඩාත් ගුණාත්මක සහ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම.
4	ගිණුම් සහ වැටුප් විෂයන්ට අදාල පුහුණුව-හම්බන්තොට දිස්ත්‍රික්කය	15	දින 01	24,450.00		දේශීය	
	ප්‍රධාන කාර්යාලය සංවිධානය කළ නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන්						
5	කාර්යක්ෂමතා කඩයිම් විභාග පැවැත්වීම			1,857,517.94		දේශීය	සේවක අභිප්‍රේරණය උදෙසා ධාරිතා සංවර්ධන වැඩසටහන් සහ කාර්යකෂමතා විභාග පවත්වා ප්‍රතිඵල ලබා දීම.

අ. අ.	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	සමස්ත ආයෝජනය (Rs.000)			වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			වැඩසටහනේ කාල සීමාව	දේශීය	විදේශීය		
6	බහු කාර්ය සංවර්ධන කාර්ය සහායකයින් සඳහා ආයතනික කටයුතු සහ තම තනතුරට අදාල රාජකාරිය පිළිබඳ පුහුණුව ලබා දීම.			253,580.00		දේශීය	රාජකාරි වපසරිය සම්බන්ධයෙන් දැනගත යුතු අත්‍යවශ්‍ය කරුණු පිළිබඳ දැනුවත් කරන ලදී.
7	රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිලිබඳ නේවාසික පුහුණු වැඩමුලුවක් පැවැත්වීම			226,640.00		දේශීය	නිලධාරින්ගේ රැකියා කටයුතු වඩාත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම.
8	සංවර්ධන නිලධාරින් (විගණන) සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	212		1,761,882.00		දේශීය	රාජකාරි වපසරිය සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය කරුණු පිළිබඳ දැනුවත් කරන ලදී.
9	උසස් අධ්‍යාපන සහ වෘත්තීය පාඨමාලා හැදෑරීම සඳහා නිලධාරීන් යොමු කිරීම	17	වසර 1	1,093,975.00		දේශීය	නිලධාරීන් 17 දෙනෙකු සඳහා පාඨමාලා ගාස්තු ගෙවන ලදි. දෙපාර්තමේන්තු කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය අමතර දැනුම ලබාදීම .
10.	පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ප්‍රජා සංවර්ධන) හැදෑරීම සඳහා සමෘද්ධි කළමණාකරුවන් යොමුකිරීම.	31	මාස 12			දේශීය	දිළිඳුකම පිටුදැකීමේ නව උපාය මාර්ග සම්බන්ධයෙන් කළමනාකරුවන් 31 සඳහා දැනුම ලබා දීම . මෙමඟින් රාජකාරි කටයුතු සඳහා අමතර දැනුම ලබා ගැනීමට හැකියාව ලැබේ.

අ. අ.	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	සමස්ත ආයෝජනය (Rs.000)			වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			වැඩසටහනේ කාල සීමාව	දේශීය	විදේශීය		
11 12.	ස.සං.නි.සඳහා NISD ආයතනය මඟින් පවත්වනු ලබන සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව හැදෑරීමට 50% පාඨමාලා ගාස්තු ගෙවීම. 330,000.00	22	මාස 06			දේශීය	සංඝද්ධි සංවර්ධන නිලධාරින්ගේ රැකියා කටයුතු වඩාත් ශක්තිමත්ව කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම.
13	ස.සං.නි.සඳහා NISD ආයතනය මඟින් පවත්වනු ලබන සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා ගාස්තු ගෙවීම. -1,187,500	700	මාස 06				පාර්ලිමේන්තු කටයුතු කරගෙන යාම සඳහා නිලධාරින්ට අවශ්‍ය ය අමතර දැනුම ලබාදීම සිදුවිය.
14	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් මෙහෙයවනු ලබන විදේශ පුහුණු අවස්ථා සඳහා සුදුසු නිලධාරීන් යොමුකිරීම.	5				විදේශීය	කලාපීය රටවල දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන්වල අත්දැකීම් හුවමාරුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් තුල ක්‍රියාත්මක කිරීම.
	සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන නඩත්තු කිරීම සහ මිලදී ගැනීම්						
15	i.සමනළවැව පුහුණු මධ්‍යස්ථානය *වැසිකිලි පද්ධති අලුත්වැඩියා කිරීම			157,159.90			ගුණාත්මක සේවාවක් ලබා දීම තුළින් සේවක/ නිලධාරී අභිප්‍රේරණය
16	ii.නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානය *උපකරණ මිලදී ගැනීම.			72,790.00			

අ. අ.	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	සමස්ත ආයෝජනය (Rs.000)			වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			වැඩසටහනේ කාල සීමාව	දේශීය	විදේශීය		
17	iii.මාතර පුහුණු මධ්‍යස්ථානය *විදුලි පද්ධතිය අලුත්වැඩියා කිරීම			814,500.00			
	*විදුලි සෝපානයේ සේවා ගාස්තු ගෙවීම			109,928.20			
	ක්ෂුද්‍ර මූල්‍ය බැංකු ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කල වැඩසටහන්.						
18	CMA ආයතනය මඟින් බැංකු කාර්යමණ්ඩලය සඳහා පැවැත් වූ ගිණුම්කරණ සහ ව්‍යාපාර අධ්‍යනය පිළිබඳ පුහුණු පාඨමාලාව	620	දින 06x12	16,002,200		දේශීය	සම්මත ක්‍රමවේද අනුව සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය බැංකු පද්ධතියේ බැංකු කටයුතු සිදු කිරීම සඳහා දැණුම ලබා දීම.
19	සමෘද්ධි දෙපාර්තමේන්තුවේ රාජකාරි සඳහා හඳුන්වා දී ඇති මෘදුකාංග පද්ධති පිළිබඳව සමෘද්ධි බැංකු සහ සමෘද්ධි බැංකු සමිති කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම	16502		24,255,652.04			සේවක කුසලතා සහ කාර්යක්ෂමතාව ඉහලයාම.
20	සමෘද්ධි බැංකු සහ සමිති නිලධාරීන් සේවා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලයට යොමු කිරීම .පාඨමාලා ගාස්තුව 50%-බැගින් නිලධාරියා සහ අදාල බැංකුව දරා ඇත. (19x90,000x50)	19					උගත් බුද්ධිමත් කුසලතාවයෙන් යුතු කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් බිහිවීම.

අ. අ.	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	සමස්ත ආයෝජනය (Rs.000)			වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			වැඩසටහනේ කාල සීමාව	දේශීය	විදේශීය		
21	සමෘද්ධි බැංකු සහ සමිති නිලධාරීන් සේවා කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා නිලධාරීන් කොළඹ විශ්ව විද්‍යාලයට යොමු කිරීම 50% බැගින් නිලධාරියා සහ අදාල බැංකුව දරා ඇත. (18x125,000x50 %)	18					
මුළු එකතුව				46,647,075.10			

පරිච්ඡේදය -07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ.	වාණිජ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ.	ගබඩා අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ.	විශේෂ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
1.6	වෙනත්	අදාල නොවේ.	වෙනත් අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම. (මු.රේ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට , සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ.	නිකුත් කරනු ලබන විමසුම් සඳහා පිළිතුරු ලැබිය යුතුය.	දිස්ත්‍රික් විගණන ඒකක හරහා පිළිතුරු ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිලිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රේ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 ට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල් බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ.		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එලඹීම	අනුකූල වේ		
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	ආයතන ඒකාබද්ධ කිරීමේදී මතුවූ තත්ව හේතුවෙන් ගැටළු මතුවන තව දුරටත් නිරවුල් කළ යුතු ණය ශේෂ පවතී.	ණය ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය විධි විධාන සලසා ඇත.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.2	මු.රේ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රේ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අදාල නොවේ.	වෙන් කල ආදායම් ශීර්ෂයක් නොමැත	
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ.	වෙන් කල ආදායම් ශීර්ෂයක් නොමැත	
15.3	මු.රේ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ.	වෙන් කල ආදායම් ශීර්ෂයක් නොමැත	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය තුළ තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කොට තිබීම.	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කර තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		

09. සංවර්ධන වැඩසටහන්වලට අදාල ඡායාරූප
Photographs related to Development Programs
அபிவிருத்தி நிகழ்ச்சித் திட்டம் தொடர்பான புகைப்படங்கள்

සමාජ සංවර්ධන අංශය - සමෘද්ධි ලොතරැයි නිවාස / සමෘද්ධි විශේෂ නිවාස වැඩසටහන
Social Development Division – Samurdhi Special Housing Programme
சமூக அபிவிருத்திப் பிரிவு – சமுர்த்தி வீட்டுச் சீட்டிழுப்பு / சமுர்த்தி விஸேட வேலைத்திட்டம்









මාධ්‍ය අංශය
Media Division
ஊடகப் பிரிவு





ජීවනෝපාය අංශය
Livelihood Division
வாழ்வாதாரப் பிரிவு








ජාත්‍යන්තර දින වැඩසටහන්
International Day Programmes
சர்வதேச தின வேலைத்திட்டங்கள்








සතුටු පවුල් වැඩසටහන
Sathutu Pawul Programme
மகிழ்ச்சியான குடும்பம் வேலைத்திட்டம்




සැලසුම් හා මෙහෙයුම් අංශය Planning & Monitoring Division
திட்டமிடல் மற்றும் செயற்பாட்டு பிரிவு



ප්‍රජාමූල අංශය
Community Base Organization
சமுதாய அடிப்படை அமைப்பு









මානව සම්පත් සංවර්ධන අංශයේ වැඩසටහන්
Programs of Human Resource Development Division
மனிதவள அபிவிருத்திப் பிரிவின் வேலைத்திட்டங்கள்

I